234 වන කාණ්ඩය - 8 වන කලාපය (II කොටස)
தொகுதி 234 - இல. 8 (பகுதி II)
**Volume 234 - No. 8 (Part II)**

**2015** අප්‍රේල් 28වන අඟහරුවාදා
2015 ஏப்பிரல் 28, செவ்வாய்க்கிழமை
**Tuesday, 28th April, 2015**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත:**
තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

---

# பிரதான உள்ளடக்கம்

**அரசியலமைப்புக்கான பத்தொன்பதாம் திருத்தச் சட்டமூலம் :**
திருத்தப்பட்டவாறு, மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

---

# PRINCIPAL CONTENTS

NINETEENTH AMENDMENT TO THE CONSTITUTION BILL:
Read the Third time and passed as amended

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2015 අප්‍රේල් 28වන අඟහරුවාදා*
*2015 ஏப்பிரல் 28, செவ்வாய்க்கிழமை*
*Tuesday, 28th April, 2015*

*[2015 අප්‍රේල් 28 වන අඟහරුවාදා නිල වාර්තාවේ 1 වන කොටසේ 886 වන තීරුවේ සිට ඉතිරි වැඩකටයුතු]*

*[2015 ஏப்பிரல் 28, செவ்வாய்க்கிழமை அதிகார அறிக்கை பகுதி I இன் 886 ஆம் பத்தியிலிருந்து நிகழ்ச்சித்தொடர்]*

*[Continuation of Proceedings from Col. 886 of* OFFCIAL REPORT *(Part I) for Tuesday, 28th April,2015*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[*MR. SPEAKER *in the Chair.]*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, ස්ථාවර නියෝග අනුව මා රීති ප්‍රශ්නය මතු කරන්න කැමැතියි. කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරන සංශෝධනවල පිටපත් සෑම ගරු මන්ත්‍රීවරයකුටම ලබා දිය යුතුයි. අඩුම වශයෙන් එය මන්ත්‍රීවරයාට කියවිය හැකි භාෂාවෙන් -මව් භාෂාවෙන්- ලබා දිය යුතුයි. එසේ ලබා දී නොමැති නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, කාරක සභා අවස්ථාවට ලබා දිය යුතු ලියකියවිලි පළමු කොට ලබා දීමට අදාළ බලධාරින්ට උපදෙස් ලබා දෙන ලෙස.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒවා අපි කලින් ලබා දීලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ. ලබා දී නැති නිසයි ඉල්ලන්නේ. ලබා දීලා නැහැ. You should give us all the amendments. You have not given all the amendments. Do not say, "Yes" and create an unnecessary situation. First, check whether you have given us all the amendments. You have not distributed the amendments in all three languages. At least, give it to us in two languages.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ආණ්ඩුවෙන් දීපු සියලු සංශෝධන ගරු මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති බව තමයි දැනුම් දෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, ලබා දීලා නැහැ. [බාධා කිරීම්] අසත්‍ය කියන්න ලැහැස්ති වෙන්න එපා.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු සභාපතිතුමනි, අපට ලැබිලා නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්. ලැබිලා නැති නිසයි කියන්නේ. අපත් වගකීමෙන් මේ කියන්නේ. ලබා දීලා තිබෙනවා කිව්වාට ලැබිලා නැත්නම් මොනවා කරන්නද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු සභාපතිතුමනි, සියලු සංශෝධන දීලා තිබෙනවා. නමුත් - [බාධා කිරීම්] මේ වාගේ වැදගත් අවස්ථාවක- [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මේ ගැන සොයා බලන්න ඕනෑ. කරුණාකර නිශ්ශබ්ද වන්න. [බාධා කිරීම්] මේවා ලබා දී තිබෙන්නේ ඊයේ උදයේ. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු සභාපතිතුමනි, අපි දවස් ගණනක් තිස්සේ මොනවාද සාකච්ඡා කෙරුවේ? මේ වාගේ සිල්ලර - [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, අපට ලබා දීලා තිබෙන කාරක සභා අවස්ථාවේ සංශෝධන පැරණි ඒවා. ඒවා සියයට අනූවක් හරි. ඊට පස්සේ වෙනස් වුණු ඒවා තිබෙනවා. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
නිශ්ශබ්ද වෙලා අහ ගෙන ඉන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඊයේ සහ අද දහවල් වෙනස් වුණු ඒවාත් තිබෙනවා. ඒවා තවම ලබා දීලා නැහැ. ඉතින් අප කොහොමද කියන්නේ ලැබුණා කියලා. මේක තමයි සත්‍යය. අප මේක කඩාකප්පල් කරන්න නොවෙයි, කියන්නේ. මේ ගරු සභාවේ වැඩ කටයුතු විනාඩි කිහිපයකට හෝ නවත්වා මේවා ලබා දෙන්න. ඔබතුමන්ලාට bulldoze කරන්න ඕනෑ නම්, bulldoze කරන්න ලැස්ති වෙනවා නම් අපත් ලැස්තියි ඒකට මුහුණ දෙන්න. Do not try to bulldoze. These are Constitutional Amendments. This is not just a Bill. [බාධා කිරීම්] ගරු සභාපතිතුමනි, කලබල කරන්නේ මෙතුමායි. මෙතුමා දන්නේ නැහැ, මෙතැන වැඩ කරන හැටි. ඒකයි මේ ප්‍රශ්නය. [බාධා කිරීම්] ඔව්, දන්න නිසා තමයි- [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ඔබතුමා කියන්නේ සවස් වරුවේ ඉදිරිපත් කරපු සංශෝධන ගැන ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

යම් යම් සංශෝධන කළා නම් අපට ඒවා ලබා දෙන්න ඕනෑ. අපට ඒවා ලැබිලා නැහැ. ඒවා භාෂා තුනෙන් ඉදිරිපත් කර නැහැ. මේ ගරු සභාවේ වැඩ කටයුතු විනාඩි 15කට, 20කට නවත්වා අපට ඒවා ලබා දෙන්න. කාරක සභාවේ සංශෝධන ඉදිරිපත් කරන අතරතුර මේ ගරු සභාවේ කටයුතු නවත්වන්න බැහැ නේ. ඒක නේ මේ කියන්නේ. මෙතුමන්ලා මෙලෝ දෙයක් බලන්නේ නැහැ. නිකම් බොරුවට අපට කෑ ගහනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

හොඳයි. අපි තමුන්නාන්සේලාගේ විරෝධතාවන් සලකා බලා සභානායකතුමාගේත් සියලු දෙනාගේත් එකඟතාව ඇතිව කාරක සභාවේ කටයුතු විනාඩි 15කට අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 7.46ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி. ப. 7.46 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 7.46 p.m. and then resumed.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

මන්ත්‍රීතුමන්ලා කරුණාකර අසුන් ගන්න.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

Sir, there is no Tamil translation of the Amendments.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Hon. Member, it will take some time. But, I will give you the English translation.

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Prabha Ganesan)

Sir, I also do not have the Tamil translation.

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

We are now translating it into all three languages. Please bear with us. But, I am sure that the three Hon. Members who asked for the Tamil translation are also quite capable of reading those in English. - [*Interruption.*] Hon. Prabha Ganesan, we will send you the English translation. - [*Interruption.*] Hon. Member, you came on the UNP vote. Shut up and sit down! - [*Interruption.*] What is your right?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

මේ, අවසාන මොහොතේදී ඉදිරිපත් වී තිබෙන සංශෝධන සහ එකඟතාවන් අනුව ඇති වී තිබෙන සංශෝධනයන්. එම නිසා කෙටි වේලාවකින් මේවායේ ඉංග්‍රීසි පරිවර්තන ඔබතුමන්ලා තුන් හතර දෙනා වෙත ලබා දීමට කටයුතු කරන්නම්. හොඳයි, අපි එතෙක් මේ වැඩ කටයුත්තට යොමු වෙමු. පළමුවැනි වගන්තිය සඳහා වන සංශෝධනය ඉදිරිපත් කරන්න, ගරු ඇමතිතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු සභාපතිතුමනි, රජය වෙනුවෙන් ගරු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මැතිතුමා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, පළමුවැනි වගන්තියේ 5වන පේළියේ සිට 10වන පේළිය -[බාධා කිරීමක්]

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Prabha Ganesan)

Sir, I rise to a point of Order.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Hon. Prabha Ganesan., what is your point of Order?

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Prabha Ganesan)

ගරු සභාපතිතුමා, මේ කිසිම දෙයක් මට තේරෙන්නේ නැතිව අපි කොහොමද මේ කටයුත්ත දැන් කරන්නේ? [බාධා කිරීම්] සිංහල කතා කරනවා. [බාධා කිරීම්]Tamil copy එකක් නැතිව මම කොහොමද මේ ගැන දැන ගන්නේ? [බාධා කිරීම්] මට මේකේ copy එකක් ඕනෑ.[බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳටම තේරෙන බව පේනවා. එම නිසා සිංහල සහ ඉංග්‍රීසි දෙකම-

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු සභාපතිතුමනි, මෙතුමා ඔක්කෝම දන්නවා. එතුමා අයිති එක්සත් ජාතික පක්ෂය තීරණය කරලා තිබෙනවා මේ භාෂා දෙකෙන් අපි වැඩ කටයුතු කරමු කියලා.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Yes, Hon. Yogarajan.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Sir, I request the Hon. Prabha Ganesan to wear his headphone so that he can hear it in Tamil.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳයි, දැන් පළමුවැනි වගන්තියේ සංශෝධන ඉදිරිපත් කරන්න, ගරු ඇමතිතුමා.

## 1 වන වගන්තිය. - (ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනයන්.)
### வாசகம் 1.- (சுருக்கப் பெயரும் நடைமுறைக்கு வரும் தேதியும்)
CLAUSE 1.- *(Short title and date of operation)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"1වන පිටුවේ, (1)-5 වන පේළියේ සිට 10 වන පේළිය දක්වා (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'(2) මේ පනතේ 3, 4, 5, 6, 7, 9 (46 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව හැර), 15,17,18,19,21 සහ 35 වන වගන්තිවල විධිවිධාන 2015 අප්‍රියෙල් මස 30 වන දින බලාත්මක විය යුතු අතර අනෙකුත් වගන්තිවල විධිවිධාන මේ පනත ක්‍රියාත්මක වන දින දී බලාත්මක විය යුත්තේය.' ";

(2) - "15 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:
'(4) 31,32,33 සහ 34 වන වගන්තිවල විධිවිධාන මේ පනත ආරම්භ වීමේ දිනයට ඉක්බිතිවම පවත්වනු ලබන මහ මැතිවරණයෙන් පසු පාර්ලිමේන්තුව රැස් වන ප්‍රථම දිනයේ දී බලාත්මක භාවයට පත් විය යුත්තේ ය. ' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
ගරු සභාපතිතුමනි, ඊයේ අපි එකඟ වුණා පළමුවන සංශෝධනයට ඇතුළත් 17වන වගන්තිය දෙවන සංශෝධනයට දමන්න. ඒකට අපි හැමෝම එකඟ වුණා. මම හිතන්නේ ඒක කියන්න අමතක වෙලා ඇති. That is, the provisions of Clauses 17, 31 and 32 must come under the second Amendment that you proposed. That was agreed upon.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
හරි, ඒක හරි. ඒකට එකඟයි, ගරු මන්ත්‍රීතුමනි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
එම සංශෝධනයට යටත්ව කාරක සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු වාසුදේව නානායක්කාර මහතා, සංශෝධන ඉදිරිපත් කරනවාද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සංශෝධන ඉදිරිපත් කරනවා. Sir, I move,

"In page 1, leave out all words in lines 5 to 9".

Sir, I propose this as there is no reason for two dates to be given to two different sets of Articles in the Amendment to come into force.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා, ඒක පිළිගන්නවාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක පිළිගන්නේ නැහැ, ගරු සභාපතිතුමනි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳයි. සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු රාජීව විජේසිංහ මහතා.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

ගරු සභාපතිතුමනි, ඉස්සෙල්ලා එක පිළිගත්ත නිසා මම මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ නැහැ. ඒත් මේ සංශෝධන වැදගත් නම් ඡන්ද විමසීමක් තිබිය යුතුයි කියා මා යෝජනා කරනවා. මගේ සංශෝධනය නම් ඉදිරිපත් කරන්නේ නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මේ ඔක්කෝටම ඉස්සෙල්ලා හිතේ තිබෙන පූර්ව නිගමන අයින් කර ගන්න. මේවා හරස් කරන්න කථා කරනවා නොවෙයි, මේවා අපේ ඇත්ත අදහස්. මේවා අපි කථා කරලා, බේරා ගෙන, ඡන්දය දීලා කලබල නැතිව යමු. අගමැතිතුමා කලබල වෙනවා. ඒකයි මම කලින්ම පූර්විකාව කිව්වේ. මම මේක කිව්වේ මෙන්න මේ නිසායි. අපේ මේ සංශෝධනවලින් එක කොටසක් අප්‍රේල් 30 වැනි දා ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නවා. අනික් කොටස ලබන ඡන්දයෙන් පසුව ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නවා. මම දන්නවා, ප්‍රායෝගිකව එක කොටසක් ලබන ඡන්දයෙන් පසුව තමයි ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙන්නේ කියා. එහෙම නම් ඔක්කොම ලබන ඡන්දයෙන් පසුව ක්‍රියාත්මක කරන්න දමන්න බැරිද කියන එකයි මම අහන්නේ. බැරි නම් බැහැ කියන්න. ඒක වෙනම දෙයක්. ඒක තමයි මගේ යෝජනාව. ඔක්කොම ලබන ඡන්දයෙන් පසුව -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ඇමතිතුමා ඒකට එකඟ වෙන්නේ නැහැ කියන එකයි කිව්වේ. [බාධා කිරීමක්] ප්‍රතික්ෂේප කරනවා.

***1වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1, as amended, ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 14අ අලුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.)
### வாசகம் 2.- (இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின் அரசியலமைப்பில் 14அ என்னும் புதிய உறுப்புரையை உட்புகுத்துதல்)
CLAUSE 2.- *(Insertion of new Article $14_A$ in the Constitution of the Democratic Socialist Republic of Sri Lanka)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 21 වන පේළියේ සිට 25 වන පේළිය දක්වා වූ සියලු වචන (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතුය."

(2) "2 වන පිටුවේ, (1) 1 වන පේළියේ සිට 10 වන පේළිය දක්වා වූ සියලු පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිවාසිකම 14අ. (1) සෑම පුරවැසියකුටම-

(අ) රජය, අමාත්‍යාංශයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ යම් නීතියක් මගින් හෝ යටතේ පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිතමණ්ඩලයක් සතුව පවත්නා වූ;

(ආ) යම් පළාත් අමාත්‍ය මණ්ඩලයක අමාත්‍යවරයකුගේ යම් අමාත්‍යාංශයක් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් මගින් පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් දෙපාර්තමේන්තුවක් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සතුව පවත්නා වූ;

(ඇ) යම් පළාත් පාලන ආයතනයක් සතුව පවත්නා වූ; සහ

(ඈ) මේ අනු ව්‍යවස්ථාවේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ආයතනවලට අදාළව අවශ්‍ය විය හැකි, වෙනත් යම් තැනැත්තකු සතුව පවත්නා වූ,

සහ පුරවැසියකුගේ අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් සලසා ඇති පරිදි ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේ ය.' "

(2) "16 සහ 17 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම පිණිස ද, අධිකරණයට අපහාස කිරීම සහ පාර්ලිමේන්තු වරප්‍රසාද සම්බන්ධයෙන් ද විශ්වාසය මත දැනුම් දෙන ලද තොරතුරු හෙළිදරව් කිරීම' ";

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

සංශෝධිත පරිදි කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

එකඟයි.

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා සංශෝධන ඉදිරිපත් කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, 2වන පිටුවේ කොටසක් ඉවත් කර තිබෙනවා. මා පැහැදිලිව සංශෝධනය ඉදිරිපත් කරනවා. ගරු ඇමතිතුමා "any other person" කියන කොටස ඇතුල් කර තිබෙනවා. ගරු අමාත්‍යතුමාට පැහැදිලි කරන්න පුළුවන් නම් හොඳයි. එය නීතිය ඉදිරියේ ඉතාම අපැහැදිලියි. ඒ නිසායි මා එය ඉවත් කරන්නටය කියායි ඉදිරිපත් කළේ.

ඊළඟට, පනත් කෙටුම්පතේ 2. වගන්තියට ඇතුළත් කරන 14අ.(3) අනු ව්‍යවස්ථාව මෙසේයි:

I quote:

"In this Article, "citizen" includes a body whether incorporated or unincorporated, if not less than three-fourths of the members of such body are citizens."

ගරු ඇමතිතුමනි, මේ අනුව්‍යවස්ථා දෙක ගැන ඔබතුමා පැහැදිලි කරනවා නම් හොඳයි. මොකද, ජනමාධ්‍ය අයිතිවාසිකමක් ගැනයි මේ කියන්නේ. පෞද්ගලික තොරතුරු ලබා ගැනීම සඳහා අලුත් සංශෝධන තමයි ඔබතුමා ඉදිරිපත් කරන්නේ. මේවා ශ්‍රේෂ්ඨාධිකරණයට නොගිය සංශෝධන වගයක්. ඒ නිසා අඩු වශයෙන් ඔබතුමා මේ පිළිබඳව පැහැදිලි කරනවා නම් හොඳයි. එතකොට මගේ සංශෝධනය ඉල්ලා අස් කර ගන්නවා. නමුත් -

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒක පැහැදිලි කරන්නම්.

මෙම පනත් කෙටුම්පතේ -මූලික සංශෝධනයේ- 2. වගන්තියට ඇතුළත් කරන 14අ. අලුත් ව්‍යවස්ථාවේ (ඇ) යටතේ තිබෙන්නේ, "වෙනත් යම් තැනැත්තකු," කියන හැඳින්වීම විතරයි. මෙය ශ්‍රේෂ්ඨාධිකරණයේදී සාකච්ඡාවට භාජන වුණා. ශ්‍රේෂ්ඨාධිකරණයේ අදහස් සැලකිල්ලට භාජන කළාට පස්සේ, අපි දැන් (ඇ) අනුව්‍යවස්ථාව සකස් කරලා තිබෙන්නේ, "මේ අනුව්‍යවස්ථාවේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ආයතනවලට අදාළව අවශ්‍ය විය හැකි, ...." කියන කොටස ඇතුළු කරලා, ඊළඟට තමයි, "වෙනත් යම් තැනැත්තකු සතුව පවත්නා වූ,.." කියන හැඳින්වීම එන්නේ. ඒක සීමා කරලා තිබෙනවා ඉහතින් සඳහන් අනුව්‍යවස්ථා තුනට. මම හිතන්නේ ඒ අනුව ඔබතුමා අදහස් කරන දේ දැන් මෙහි ඇතුළු වෙලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මෙම පනත් කෙටුම්පතේ(ඇ) අනුව්‍යවස්ථාවේ, "වෙනත් යම් තැනැත්තකු" කියලා ඇතුළත් කිරීමෙන් විශාල පරාසයකට විවෘත වනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔබතුමා සංශෝධනය ඉදිරිපත් කළ විධියට අපි කොන්දේසි සහිතව සීමා කරලා තිබෙනවා වර්තමානයේ (ඇ) අනුව්‍යවස්ථාව. කරුණාකර බලන්න. එහි මෙසේ සඳහන් වනවා:

"මේ අනුව්‍යවස්ථාවේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ආයතනවලට අදාළව අවශ්‍ය විය හැකි, වෙනත් යම් තැනැත්තකු සතුව පවත්නා වූ, ...."

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉහත වගන්තිය අනුව.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔව්, එහෙමයි. දැන් ඒක සීමා කරලායි තිබෙන්නේ. That has been qualified.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු සභාපතිතුමනි, ගරු අධිකරණ ඇමතිතුමා සඳහන් කරන පරිදි ඒ ක්ෂේත්‍රය සීමා වෙලා තිබෙනවා. ඒක හරි. හැබැයි, මේකෙන් ඕනෑම පුද්ගලයකුගේ - “a private person” - ඒ කියන්නේ, රජයට සම්බන්ධ නැති -ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක් එහෙම නොවෙයි- "ඕනෑම පුද්ගලයකුගේ" ඒ කියන්නේ, සාමාන්‍ය පුරවැසියකුගේ අධිග්‍රහණයේ තිබෙන තොරතුරකට ප්‍රවේශය ලබා ගන්න පුළුවන්. That is access to information in the possession of a private person. Your restriction is with regard to the nature of the material. That is correct, but this still gives the right of access to material in the possession of a private citizen.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Member, this has been restricted. Unless he comes within the ambit of (a), (b) or (c) of Clause 2 of the Bill -

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
Hon. Chairman, the question is, even if it comes within the ambit of those three areas, which the Hon. Minister of Justice rightly pointed out, even in that situation, is it the policy of Parliament to allow information in the hands of a private person to be divulged? That is a policy issue.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Chairman, this was argued in the Supreme Court. The Supreme Court has expressed its opinion that if it is put in this form, then it is constitutional. That is why we have made this amendment.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ශ්‍රේෂ්ඨාධිකරණය කියන්නේ, මේ සඳහා ජනමත විචාරණයක් අවශ්‍යද, නැද්ද කියන එක. ප්‍රතිපත්තිය හොඳද, නැද්ද කියන එක තීරණය කිරීම මේ පාර්ලිමේන්තුවට අයිති දෙයක්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක තමයි මේක.-

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මේක ලොකු ප්‍රශ්නයක් නොවෙයි. නමුත්, අපි කරන්නේ මොකක්ද කියලා දැන ගන්න ඕනෑ. අපි ලොකු වෙනසක් කරනවා, අපේ නීතියේ. පුද්ගල අයිතිවාසිකම් සම්බන්ධයෙන් ලොකු වෙනසක් වනවා. ඒ ගැන අපි දැනුවත්ව, මනා අවබෝධයකින් යුක්තව ඒ පියවර ගන්න ඕනෑ. ඒ පිළිබඳ වගකීම ශ්‍රේෂ්ඨාධිකරණයට පවරන්න බැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් පිළිබඳව තීරණයකට එන්නේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය කියන්නේ, "මේක කරන්න අවශ්‍ය නම් ජනමත විචාරණයකට යන්න" කියලා. එච්චරයි. මේ සංශෝධනය හොඳ ද, නරක ද, කළ යුතු ද, නැද්ද කියන එක තීරණය කිරීම මේ පාර්ලිමේන්තුවට අයත් කර්තව්‍යයක්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ අපි තමයි ප්‍රතිපත්ති පිළිබඳ එකඟතාවකට එන්න ඕනෑ. ඒ අනුව පක්ෂ නායකවරුන් සමඟ කළ සාකච්ඡාවල දී අපි එකඟ නොවුණු කරුණු කීපයක් තිබුණා. දැන් මේක සියලු දෙනා එකඟ වුණු කාරණයක්. මේකට කවුරුවත්ම විරුද්ධ වුණේ නැහැ. අනෙක් එක දැන් ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව තර්ක කරන්න අයිතියක් නැහැ. පනත් කෙටුම්පත දෙවන වර කියෙව්වාට පස්සේ, ප්‍රතිපත්ති මත තීරණය මේ පාර්ලිමේන්තුව දීලා ඉවරයි. ඒ නිසා දීපු තීන්දුවේ ප්‍රතිපත්තිය ගැන තර්ක කරන්න දැන් අවස්ථාව නොවෙයි.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Sir, if one goes through subparagraphs (a), (b) and (c) of Clause 2, it is not the information relating to "any other person"; not his private information, it is only in situations where "any other person" is in possession of information that is required from the State, a Ministry or a Government Department, a body established by law, a Ministry of a Province or a Department or statutory body or any local authority. This is only to make sure that those bodies do not say, "We do not have that information, so-and-so has that information. It is only for that reason. This was gone into in full and that is why a particular formulation was agreed in the Supreme Court which is incorporated in the Determination.

The whole desirability of bringing a private person into this was discussed. I do concede that there are concerns. But, as the Hon. Minister of Justice said, the whole thing was discussed and it was found that this information is restricted to an information that is in the possession of a Board or a Government Department or a local authority, not some of his private information. So, that is why the Court has permitted that and also, this is not one of those matters that anybody had any disagreements over. Even yesterday, some Members were appointed to look into objections that anybody had. So, we went into it in detail and this was agreed to.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම, ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව, මහජන ආරක්ෂාව තහවුරු කිරීම යනාදී කරුණු සම්බන්ධව තිබෙන රැකවරණය මේ සංශෝධනවල ඊළඟ වගන්තියට ඇතුළත් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඊට අමතරව ශ්‍රේෂ්ඨාධිකරණය මේ පිළිබඳව විශේෂ සටහනක් කරලා තිබෙනවා. මම ඒක කියවන්නම්, ගරු සභාපතිතුමනි.

Page 13 of the Supreme Court Determination states, I quote:

> "It was the submission of the Counsel that the sub-paragraph 14A (1) (d) violates the rights of the people. However, the Hon. Attorney General has agreed to delete the above 14A (1) (d), and to replace it with the following provision:-
>
> 14A (1) (d) Any other person, being information that is required for the exercise or protection of the citizen's right of access to information in relation to a person or an institution referred to in sub -paragraph (a), (b) or (c) of this paragraph."

ඒ ශ්‍රේෂ්ඨාධිකරණ නිර්දේශයට අකුරටම අනුකූලව තමයි මේ සංශෝධන සකස් කරලා තිබෙන්නේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු රාජීව විජේසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ සංශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

ගරු සභාපතිතුමනි, මම කියන්නේ මෙයයි. සංශෝධන ගෙනෙන්න පුළුවන් ඕනෑම වගන්තියකට. As long as it is relevant to the Bill, you can propose amendments. So, I hope that the Government will not try to shut out amendments on the ground that they have not been discussed before. I should add that on this particular Clause, I do not see anything wrong with it. But, I think the right to discuss should be allowed.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාගේ සංශෝධනවලට යටත්ව දෙවෙනි වගන්තිය සම්මත වෙනවා.

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*3 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3 ordered to stand part of the Bill.*

## 4 වන වගන්තිය. - (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)

### வாசகம் 4.- (அரசியலமைப்பின் 31ஆம் உறுப்புரையைத் திருத்துதல்)

CLAUSE 4. - (*Amendment of Article 31 of the Constitution*)

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

" '4 වන පිටුවේ, (1) - 2 වන පේළියේ සිට 15 වන පේළිය දක්වා වූ (එකී පේළි දෙක ද ඇතුළුව) සියලු වචන ඉවත් කළ යුතු ය.'"

" '4 වන පිටුවේ, (2) - 20 වන පේළියේ සිට 32 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතු ය.' "

" '5 වන පිටුවේ, 1 වන පේළියේ සිට 27 වන පේළිය දක්වා වූ සියලු පේළි ඉවත් කළ යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු රාජීව විජේසිංහ මන්ත්‍රීතුමා සංශෝධන ඉදිරිපත් කරනවාද?

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
ඔව්. 31. (3) ඒ වගන්තියට සංශෝධනයක්ද?

මට ඉස්සෙල්ලා වගන්තියට සංශෝධනයක් ඉදිරිපත් කිරීමට තිබුණා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මේ, කලින් වගන්තියට අදාළව නොවෙයි.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
Sir, it was agreed at the Party Leaders' Meeting in March that amongst the powers of the President that should be reduced, is the right to have an early election. Executive Presidents elected do not normally have the right to have an early election and to give this right to have an election any time you like after four years, seems wrong to me. So, I move:

"Leave out all words in Article 31(3a)."

This was a measure introduced by the late Hon. J.R. Jayewardene - if you remember - to allow an early election. It was a pernicious measure. It leads to an anomaly that when you have two people contesting, when one is elected, he takes office on the next day and when the other is elected, he takes office a year later. This is a position that is in no other Constitution in the world. We agreed on the 15th March that this should be removed. I am very sorry to say that this was not done. So, I would like to move this Amendment to get rid of Article 31(3a) completely.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා, මේ සංශෝධනයට එකඟ වෙනවාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මේ සංශෝධන තුළ එහෙම ප්‍රශ්නයක් මතු වුණේ නැහැ, ගරු සභාපතිතුමනි. එහෙම කාරණයක් මතු වුණේ නැහැ, මෙහිදී.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
මේ කාරණය අපි සාකච්ඡා කළා, මාර්තු 15 වෙනි දා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
සාකච්ඡා කරන්න ඇති. නමුත් කොයි වෙලාවකදීවත් ඔය කියන කරුණ සංශෝධනවලට ඇතුළත් වුණේ නැහැ.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
නැහැ, නැහැ. අපි යෝජනා කළා, ඇතුළත් කරන්න. ගැසට් කරන විට ජයම්පති වික්‍රමරත්න මේ කරුණ තියා ගත්තා. මම යෝජනා කරනවා, මේ කොටස අයින් කරන්නට කියලා. ඔබතුමා මේ සංශෝධනය පිළිගන්නේ නැත්නම් මට කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් ඔබතුමාත් පිළිගන්නට ඕනෑ, 1982 දී ජේ.ආර්. ජයවර්ධන මේ කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන විටම ඒක විනාශයක් බව; ඒක සම්පූර්ණයෙන් වැරදි වැඩක් බව. ජනාධිපති ක්‍රමය පවතින අනෙක් කිසිම රටක මේ වාගේ කාරණයක් ව්‍යවස්ථාවට ඇතුළත්ව නැහැ. අපේ යුතුකම, යහ පාලනය නිසා මේ සංශෝධනය ඇතුළු කිරීමයි. ඔබතුමන්ලා කැමැති නැත්නම් මට ප්‍රශ්නයක් නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු රාජීව විජේසිංහ මන්ත්‍රීතුමාගේ සංශෝධනයට ගරු ඇමතිතුමා එකඟ වෙන්නේ නැහැ. එම නිසා ගරු අධිකරණ ඇමතිතුමාගේ සංශෝධනයට යටත්ව 4වන වගන්තිය සම්මත වෙනවා.

***4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4, as amended, ordered to stand part of the Bill.*

## 5 වන වගන්තිය. - (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.)
### வாசகம் 5.- (அரசியலமைப்பின் 33ஆம் உறுப்புரையை மாற்றீடு செய்தல்)
*CLAUSE 5.- (Replacement of Article 33 of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 31 සහ 32 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'33.(1) ජනාධිපතිවරයා ගේ කාර්යය විය යුත්තේ:-' "

"6 වන පිටුවේ, (1) - 1 වන පේළියේ සිට 5 වන පේළිය දක්වා වූ සියලු පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:

'(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම; '

(2) - 14 වන සහ 15 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :

'වාතාවරණ නිර්මාණය කිරීම, තහවුරු කිරීම, වන්නේ ය.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මා ඉදිරිපත් කරනවා. ගරු ඇමතිතුමා ඒ සංශෝධනය පිළිගෙන තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අතිරේකව. අනෙක් වගන්ති වෙනස් කර තිබෙනවා. මොකද, මේ ප්‍රශ්නය මතු වුණේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාව මඟින් බුද්ධ ශාසනයට දී තිබෙන ආරක්ෂාවට හානිකර වගන්තියක් අතිරේක වගන්තියක් හැටියට ඉදිරිපත් කිරීම පිළිබඳවයි. ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් යොමු කර තිබුණා. ඒ පෙත්සමට අතිරේකව - ඒ වගන්ති ඉවත් කිරීම ඔබතුමා ඉටු කර තිබෙනවා. මගේ සංශෝධනය තිබුණේ අනෙක් වගන්ති ඉවත් කිරීම සඳහායි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ වගන්තිත් ඉවත් කර තිබෙනවා. ඒ නිසා සංශෝධනය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු රාජීව විජේසිංහ මහතා.

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
ගරු සභාපතිතුමනි, මා සංශෝධනය ඉදිරිපත් කරන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අධිකරණ ඇමතිතුමාගේ සංශෝධනයට යටත්ව 5 වන වගන්තිය සම්මතයි.

***5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5, as amended, ordered to stand part of the Bill.*

***6 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*6ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 6 ordered to stand part of the Bill.*

## 7 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම)
### வாசகம் 7.- (அரசியலமைப்பின் 35ஆம் உறுப்புரையை மாற்றீடு செய்தல்)
CLAUSE 7. - *(Replacement of Article 35 of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"8 වන පිටුවේ, 26 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'එසේ ම තවදුරටත් ජනාධිපතිවරයා විසින් 33(3) (ඇ)' "

"9වන පිටුවේ, 6 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'විධිවිධානවලින් පැවරී ඇති මුක්තිය, 129 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ හෝ ජනාධිපතිවරයා' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
But, Mr. Chairman, in the English version, in line 29 of Page 7, it says, “where” -

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
We will correct it in the English version.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
It should be “while” in place of “where”.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එකඟයි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අධිකරණ ඇමතිතුමාගේ සංශෝධනයට යටත්ව 7 වන වගන්තිය සම්මතයි.

***7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 7, as amended, ordered to stand part of the Bill.*

## 8 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 37 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.)
### வாசகம் 8.- (அரசியலமைப்பின் 37ஆம் உறுப்புரையை மாற்றீடு செய்தல்)
CLAUSE 8.- *(Replacement of Article 37 of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"9 වන පිටුවේ, 12 වන පේළියේ සිට 29 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතු ය."

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අධිකරණ ඇමතිතුමාගේ සංශෝධනයට යටත්ව 8 වන වගන්තිය සම්මතයි.

***8 වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.***

*8ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்படவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 8, ordered to be left out of the Bill.*

## 9 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 39 වන සහ 40 වන ව්‍යවස්ථා ප්‍රතියෝජනය කිරීම.)

### வாசகம் 9.- (அரசியலமைப்பின் 39ஆம், 40ஆம் உறுப்புரைகளை மாற்றீடு செய்தல்)

CLAUSE 9.- *(Replacement of Articles 39 and 40 of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

" 9 වන පිටුවේ, 30 සිට 32 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතු ය."

"10 වන පිටුවේ, 1 වන පේළියේ සිට 34 දක්වා වූ සියලු පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතු ය."

"11 වන පිටුවේ, 1 වන පේළියේ සිට 34 වන පේළිය දක්වා වූ (ඒ පේළි දෙක ද ඇතුළුව) සියලු පේළි ඉවත් කළ යුතු ය."

"12 වන පිටුවේ, 1 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතු ය."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***9 වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.***

*9ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்படவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 9, ordered to be left out of the Bill.*

## 10 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම.)

### வாசகம் 10.- (அரசியலமைப்பின் VII அ என்னும் அத்தியாயத்தினை மாற்றீடு செய்தல்)

CLAUSE 10.- *(Replacement of Chapter VIIA of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"13 වන පිටුවේ, (1) - 14 වන පේළිය සහ 15 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'(ඈ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;' "

(2) - "19 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

'පත් කරනු ලැබිය යුතු වුව ද, දෙදෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විය යුතු වූ ද, තැනැත්තන් පස් දෙනෙක්.' ";

(3) - "29 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

'පත් කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්.' "

"14 වන පිටුවේ, (1) - 11වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ව ලක්ෂණය' ";

(2) - "17 සහ 18 වන පේළි ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

'(ඉ) ඡේදය යටතේ පත් කරනු ලබන්නා වූ ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නොවන්නා වූ ද තැනැත්තන්' "

(3) - "22 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:

'යුතු අතර ඔවුන්ගේ නම් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුතු ය.' "

"16 වන පිටුවේ, 4 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

'අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය' "

"17 වන පිටුවේ, (1) - 25 වන පේළියේ වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:-

'(අ) කොමිෂන් සභාවක සාමාජිකයන් ලෙස පත්කරනු ලැබිය යුතු බවට (3) වන අනුව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු'"

(2) - "29 පේළියේ සිට 32 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:-

'(ආ) කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු බවට (3) වන අනුව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ නම් සඳහන් ලැයිස්තුවේ පළමුව නම දැක්වෙන තැනැත්තා අදාළ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය.' "

"18 වන පිටුවේ, 25 සහ 26 වන පේළි ඉවත් කළ යුතු ය:-"

"19 වන පිටුවේ, (1) - 1 වන පේළිය ඉවත් කළ යුතු ය.

(2) - "31 වන පේළියේ සිට ඇති පසු විධාන ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

'අග්‍ර විනිශ්චයකාරවරයාගේ අදහස් ලබා ගත යුතු ය.' "

"20 වන පිටුවේ, (1) - 16 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

' 41 ඈ. (1) සභාවට මහ ලේකම්වරයකු සිටිය' "

(2) - "19 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

'මහ ලේකම්වරයා ඔහුගේ ධුර කාලය' "

"21 වන පිටුවේ, 15 පේළියේ සිට 20 වන පේළිය දක්වා වූ සියලු වචන ඉවත් කළ යුතු ය."

"22 වන පිටුවේ, `1 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:-

'(5) සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට මුල් ඡන්දයක් නොමැති නමුත්' "

"23 වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

'කරනු ලැබිය යුතු අතර එහි පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා. එතුමා සංශෝධන ඉදිරිපත් කරන්නේ නැතුවා වාගේයි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු සභාපතිතුමනි, මම සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඊළඟ සංශෝධනය. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මා සංශෝධන ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වුණේ- කාරණය අද පස් වරු භාගය දක්වා විසඳුණේ නැහැ. මා අධිකරණ ඇමතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමාටත් ස්තුතිවන්ත වනවා. විරුද්ධ පක්ෂය කියා සිටියේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මන්ත්‍රීවරුන්ගෙන් සමන්විය විය යුතුයි කියලායි. පාර්ලිමේන්තු බලය පිළිබඳවයි අපි කරුණු ඉදිරිපත් කළේ. පාර්ලිමේන්තුවේ නොවන අය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කිරීම ගැන අපි ප්‍රසන්නභාවයක්, එකඟතාවක් දැක්වූයේ නැහැ. එම නිසායි, අපි මේ සංශෝධනය ඉදිරිපත් කළේ. අද සවස් භාගය වන විට රජය මේ බල තුලනය වේගයෙන් වෙනස් කොට තිබෙනවා; මන්ත්‍රීවරුන්ගේ බල තුලනය වැඩි කර ගෙන තිබෙනවා. එය පාර්ලිමේන්තුවේ ජයග්‍රහණයක් හැටියට මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමා.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Hon. Chairman, Clause 10, Chapter VIIA, Article 41A (1)(e) under the heading "The Constitutional Council" states, I quote:

"(e) five persons appointed by the President, on the nomination of both the Prime Minister and the Leader of the Opposition; and”

I move,

"In page 12, at end of line 21 insert:

'and out of the five persons appointed at least one person shall be a Tamil and another person a Muslim.'"

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Member, that does not arise because it is already mentioned that the pluralistic nature of the country will be taken into consideration when these appointments are made.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Pluralistic nature does not mean the ethnic composition.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
No. This has been extensively discussed with all the parties. Finally, it was agreed to put the correct legal term, and that is for us to consider the pluralistic nature of the Sri Lankan society. That will be addressed. That meaning is embedded in these provisions.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Hon. Minister, can we include the word “ethnic composition” along with the words "pluralistic character"?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Chairman, that meaning is embedded in this Article; we all are concerned about it. That will not be an issue. Hon. Member, we are giving you that assurance.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Is it by words? We have heard in the past - [*Interruption.*]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
That is by words as well as by the provisions in this Article. When it says “pluralistic”, the whole meaning is embedded. It is a decent legal term being used within the legal framework.

ගරු සභාපතිතුමනි, ලෝකය පිළිගත් නීති කෙටුම්පත් කිරීමේ සම්ප්‍රදායට අනුකූලවයි අපි මේ සංශෝධන කර තිබෙන්නේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඒ යෝජනාව සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා ඔබතුමාට පොරොන්දුවක් වෙලා තිබෙනවා.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ 10වන වගන්තිය සඳහා වූ සංශෝධනය සම්බන්ධයෙන් නීතිපතිතුමා උපදෙස් දීලා තිබෙනවා, ඒ සඳහා ජනමත විචාරණයක් අවශ්‍යයි කියා. එම නිසා එම යෝජනාව ඉදිරිපත් නොකළ යුතුයි.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
මා යෝජනා කරනවා, අලුත් කොමිසමක් එකතු කරන්නය කියලා - Commission for Communal Harmony and National

Integration. කොමිෂන් සහා ලැයිස්තුවට, ඒ Schedule එකට Commission for Communal Harmony and National Integration කියා අලුත් කොමිසමක් එකතු කරන්නය කියා මා යෝජනා කරනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමාගේ එම යෝජනාව අපි හුඟක් අගය කරනවා. මේ වන කොට ජනාධිපතිතුමා විසින් වෙනම විශේෂ කාර්ය සාධක බලකායක් පත් කරලා එහි වැඩ කටයුතු කෙරී ගෙන යනවා. අපි ඊළඟට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන කොට ඔබතුමාගේ යෝජනාව සැලකිල්ලට ගෙන එයට ක්‍රමවේදයක් ඉදිරිපත් කරමුයි කියා ඉතාම ගෞරවයෙන් යෝජනා කරනවා.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
පසු ගිය ආණ්ඩුව කාලයේ වුණත් වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඇමතිවරයකු හැටියට මේ කටයුත්ත භාරව සිටියාට නොයෙකුත් ප්‍රශ්න මතු වුණා. මා හිතන හැටියට කොමිසමක් හැටියට අංග සම්පූර්ණව මේ ප්‍රශ්න ගැන proactive විධියට ක්‍රියා කිරීම අවශ්‍යයි. ඒක දිගටම පවත්වා ගෙන යන එකක් හැටියට තිබෙන එක වඩා හොඳයි. ඒකයි මා මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මන්ත්‍රීතුමාගේ අදහස අපි අගය කරනවා. ඒ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරන්න බලාපොරොත්තු වනවා. නමුත් මේ ව්‍යවස්ථා සංශෝධනයට දැන් මේ කරුණු ඇතුළත් කරන්න ගියොත් නීතිමය ගැටලු මතු වනවා. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරලා, ශ්‍රේෂ්ඨාධිකරණයේදී සලකා බැලීමෙන් අනතුරුවයි මේ සංශෝධනය පාර්ලිමේන්තුවට ආවේ. මූලික හරයාත්මක කරුණු මේ සංශෝධනයට ඇතුළත් කරන්න ගියොත් එතැනදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් සිද්ධ වනවා. එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. Hon. Member, we appreciate that. We will -

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
Then, can I get on to the next point? තව කරුණක් තිබෙනවා, ඉදිරිපත් කරන්න.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒ වගන්තියටමද? වෙනත් වගන්තියකටද? කරුණාකර වගන්තිය කියන්න.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
කොමිෂන් සභා සම්බන්ධ වගන්තියට අලුත් වගන්තියක් එකතු කරන්නය කියනවා. To introduce a new Article to make the Commissions answerable to the people and Parliament as follows:

> "Each Commission shall be responsible and answerable to Parliament through a suitable Standing Committee mechanism"

මා ඉතා ඕනෑකමින් ඔබතුමාට මෙම යෝජනාව ඉදිරිපත් කරනවා. කරුණාකර එම කොටස ඇතුළත් කරන්න කියන්නේ මේ නිසායි. ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීම ගැන අපි සම්පූර්ණයෙන්ම එකඟයි. නමුත් ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත්, කැබිනට් මණ්ඩලයේත් වග කීමක් පාර්ලිමේන්තුවට තිබෙන කොට මේ කොමිෂන් සභාවලත් යම් වග කීමක් පාර්ලිමේන්තුවට තිබිය යුතුයි. එම නිසා මේ සංශෝධනය ඇතුළත් කිරීම අත්‍යවශ්‍යයි කියලා මම හිතනවා. නැත්නම් තමන්ට ඕනෑ විධියට කටයුතු කරන්න ඒ ආයතනවලට සම්පූර්ණ නිදහසක් ලැබෙනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, අපට එතැන ප්‍රායෝගික ප්‍රශ්නයක් තිබෙනවා. මේ කොමිෂන් සභා ඇති කිරීමේ අරමුණ ඒ ආයතන ස්වාධීන ආයතන විධියට පවත්වා ගෙන යෑමයි. විශේෂයෙන්ම උදාහරණයක් විධියට අධිකරණ සේවා කොමිෂන් සභාව ගත්තොත්, එහි අග විනිසුරුතුමා සහ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරතුමන්ලා දෙදෙනෙක් සාමාජිකයන් විධියට ඉන්නවා. "අධිකරණ සේවා කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වග කිව යුතුයි" කියලා අපි මෙහි සංශෝධනයක් ඇතුළත් කළොත්, එතකොට මුළු අධිකරණ පද්ධතියේම ස්වාධීනත්වය පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ නිසායි ඒ වාගේ කාරණයක් මෙම පනත් කෙටුම්පතට ඇතුළත් කිරීමේ අපහසුතාවක් තිබෙන්නේ. The Supreme Court might say that a referendum is needed for that kind of serious amendment.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
මේ ලැයිස්තුවේ - Schedule එකේ- තිබෙන ඒවා ගැනයි මම මේ කථා කරන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මේ වාගේ බරපතළ කාරණයක් ඉදිරිපත් කරන්න දැන් ප්‍රමාද වැඩියි. මේ පිළිබඳව නීතිපතිතුමාගේ උපදෙස් අරගෙන කටයුතු කළ යුතුයි.

**ගරු (මහාචාර්ය) රජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
මීට පැයකට පමණ කලින් නීතිපතිතුමා එක්ක අපි මේ ගැන කථා කළා. මේ සංශෝධනය ඇතුළත් කරන්න පුළුවන්ය කියලා නීතිපතිතුමා එකඟ වුණා. හැබැයි Judicial Service Commission එක සම්බන්ධයෙන් නොවෙයි. අනෙක් සංශෝධනය ඇතුළත් කරන්න පුළුවන් කියලා කිව්වා. එතුමා අපට කිව්වේ ඇත්තටම මේ Commissionsවලින් කිහිපයක් දැනටත් පාර්ලිමේන්තුවට වාර්තා කරනවාය කියලායි. අපි කිව්වා හැම එකක්ම answerable විය යුතුය කියලා මේකට omnibus clause එකක් දමන්න කියලා. නීතිපතිතුමා කිව්වා, ඒකට ප්‍රශ්නයක් නැහැ කියලා. මම හිතන හැටියට මේ සංශෝධනය පිළිගන්න පුළුවන්.

මම තව දෙයක් කියන්න කැමැතියි. Of the amendments read out just now by the Minister of Justice, half of them were given to the Chief Opposition Whip, but the other half of the text we have not seen. So, I would like to urge that that text also be given.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

That has been given.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

No, the Chief Opposition Whip did not have the second half of the text. ගරු ඇමතිතුමා දැන් කිව්ව දේවල්වලට මගේ විරුද්ධත්වයක් නැහැ. ඒ text එක ඉංග්‍රීසියෙන් සහ සිංහලෙන් ලබා දුන්නොත් හොඳයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

දැන් මතු වෙලා තිබෙන කාරණය ගැනයි මම කථා කරන්නේ. Audit Service Commission එක නියම කරලා තිබෙනවා, රාජ්‍ය ගිණුම් කාරක සභාව ඉදිරියට පැමිණිය යුතුයි කියලා. අර කිව්වා වාගේ omnibus clause එකක් දැම්මා නම්, mechanisms පසුව හදන්න පුළුවන්. දැනට අපට රජයේ ගිණුම් කාරක සභාවේ mechanism එක තිබෙනවා. ඒක තිබෙන නිසා තමයි Audit Service Commission එක පාර්ලිමේන්තුවේ කටයුතුවලට අවනත විය යුතුයි කියලා නියම කරලා තිබෙන්නේ. Omnibus clause එකක් මේ Schedule එකේ තිබෙන Commissions ඔක්කෝටම දැම්මා නම්, අපට මේ ප්‍රශ්නය නැවත නැවතත් ගන්න ඕනෑ නැහැ. එතකොට mechanisms හදන්නයි තිබෙන්නේ. ඒක ස්ථාවර නියෝගවලින් කරන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මීට පැය එකහමාරකට පමණ කලින් ඔබතුමාගේ නිල කාමරයේ දී මේ පිළිබඳව සාකච්ඡා කරද්දී ගරු නීතිපතිතුමා සඳහන් කළේ ඒ වාගේ කාරණා පිළිබඳව සාකච්ඡා පවත්වා ප්‍රතිපත්තිමය තීන්දු ගත්තොත් ඒ පිළිබඳව සලකා බලන්න පුළුවන්ය කියන කාරණයයි. නමුත්, මේ සංශෝධන ගැන කථා කරද්දී කාගෙන්වත් එහෙම යෝජනාවක් ඉදිරිපත් වුණේ නැහැ.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

ප්‍රශ්නයක් තිබුණේ Election Commission එක ගැනයි. Election Commission එක සම්බන්ධයෙන් වූ සංශෝධනය මම කලින් දමා තිබුණු ආකාරයට ටිකක් තද වැඩිව තිබුණු නිසා තමයි නැවත ලිහිල් කළේ. කලින් දමා තිබුණා, "Subject to the supervision of Parliament" කියලා. එතකොට එතුමා කිව්වා, Election Commission එක සම්බන්ධව ඒක තද වැඩියි කියලා. ඒක නිසායි මම ඒක වෙනස් කරලා, "Each Commission shall be responsible and answerable to Parliament through a suitable Standing Committee mechanism"කියන මේ formulation එක දැම්මේ.

එතකොට නීතිපතිතුමා කිව්වා, එහෙම නම් ප්‍රශ්නයක් නැහැ කියලා. Elections Commissionerත් පාර්ලිමේන්තුවට වග කිව යුතුයි කියන එක ප්‍රශ්නයක් නැහැ කියලා කිව්වා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, This is a substantial amendment; this is not a technical amendment. This goes to the very root of the concept of Independent Commissions. This will be a drastic decision that we are going to take at the Committee Stage.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

ගරු සභාපතිතුමනි,-

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමාගේ අදහස කුමක් ද කියලා බලමු.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

ගරු සභාපතිතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය එවා තිබෙන Determination එක කරුණාකර කියවන්න. පළමුවන වතාවට ශ්‍රේෂ්ඨාධිකරණය විශේෂයෙන් මතු කර තිබෙනවා, ජනාධිපතිවරයාගේ වගකීමත්, කැබිනට් මණ්ඩලයේ වගකීමත්. එහි ජනාධිපතිතුමා ගැන මෙසේ සඳහන් වෙනවා:

> "The President shall be responsible to Parliament, and the President as a member of the Cabinet, should be both responsible and answerable to Parliament".

ශ්‍රේෂ්ඨාධිකරණය එසේ කියා තිබෙනවා. නමුත් Independent Commissions ගැන ලංකාවේ කිසිම responsibility එකක් නැහැ. ඡන්දයෙන් තෝරා පත් කරගත් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට answerable, responsible කියලා තිබෙනවා නම්, කැබිනට් එකට responsible කියලා තිබෙනවා නම්, Independent Commissions කියන්නේ කොහේ යන එකක් ද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු සභාපතිතුමනි, මෙතැන එක කාරණයක් තිබෙනවා. මේ ස්වාධීන Commissions ගැන විවිධ මත තිබුණා. ස්වාධීන Commissionsවල සිටින අයගෙන් තුන් දෙනෙක් හැර අනෙක් අය මන්ත්‍රීවරුන් නොවන අය විය යුතුයි කියලා මතයක් තිබුණා. තව මතයක් තිබුණා, සියලු දෙනාම මන්ත්‍රීවරුන් විය යුතුයි කියලා. අනෙක් කාරණය, මේ ස්වාධීන Commissions ගැන පරීක්ෂා කරන්නට තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියලා කිව්වා. ඒක කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නම් ඒ අනුව කටයුතු කරනවා. අපි දැන් එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. ආපසු මේ ගැන කථා කරන්නට ගියොත්- [බාධා කිරීමක්] මා කියන දෙය අහන්න. ඔබතුමා කියන දෙය මම ඇහුවා නේ. අපට පුළුවන් මේක ස්ථාවර නියෝගයකින් කරන්න.

When you say a "Standing Committee", no Standing Committee is defined in the Constitution. We do not talk about any Parliamentary Committees in the Constitution. Then, you say, "for Parliament". මොකක්ද නීතිපති කිව්වේ කියලා මම දන්නේ නැහැ. මම එතැන සිටියේ නැහැ. එහෙත් කිසි දවසක අපි පාර්ලිමේන්තුවේ Standing Committee එකකට, "ස්ථාවර" කියන්නේ නැහැ. පාර්ලිමේන්තුවට නම් පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුව තීරණය කරනවා, කොමිටියකට යනවාද නැද්ද කියන එක. මම මේ කියන්නේ නීතිපති කිව්වාය කියන එක ගැනයි. නීතිපති කියන්නේ මොකක් ගැනද කියලා මම දන්නේ නැහැ. එහෙත් අප කිසි දවසක draft කරන කොට එහෙම ඇතුළත් කරන්නෙත් නැහැ.

මෙහිදී අපි යම් කිසි එකඟත්වයකට ඇවිත් තිබෙන නිසා, තව පැය ගණනක් මේ සඳහා ගත කරන්නේ නැතිව අපි ඉස්සෙල්ලාම මෙය ක්‍රියාත්මක කරලා බලමු. මන්ත්‍රීවරුන් මේකට පත් කරන්නේ කොහොමද කියලා බලමු. මේකට පාලනයක් වුවමනා නිසා තමයි මන්ත්‍රීවරුන් පත් කරන්න අපි එකඟ වුණේ. ඒගොල්ලන්ව පත් කරනවා නම් මොනවාට ද ආයෙත් පාර්ලිමේන්තුවට එන්නේ? එහෙම නම් අපි මේක වෙනස් කරන්නට ඕනෑ. දෙවිධියකින් කණ්ඩායම් දෙකක් තීරණය කරන්න බැහැ.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

ගරු සභාපතිතුමනි, මේ කොමිෂන් සභාවලින් කරන්නේ මොකක්ද කියලා පාර්ලිමේන්තුව දැන ගැනීම; ජනතාව දැන ගැනීමයි අපට වුවමනා කරන්නේ. අවුරුදු තුනකට ඒ ගොල්ලන්ට සම්පූර්ණ නිදහස දෙන්නට බැහැ. එය ක්‍රියාත්මක කිරීම සඳහා ඕනෑ නම් මේ "Standing Committee" කියන එක ඉවත් කරලා "suitable mechanism"' කියලා අපි කියමු, පාර්ලිමේන්තුවට ඕනෑ විධියට සුදුසු පියවර ගන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

අපි ඒ ගොල්ලන්ව මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ප්‍රශ්න කළාම, එතකොට ස්වාධීනත්වයක් නැහැ නේ. විටින් විට වාර්තා ඉදිරිපත් කරන්න තිබෙනවා නම් ඒක ප්‍රශ්නයක් නැහැ - submit reports from time to time. ඒක තමයි අනෙක් සංස්ථා ඔක්කොම කරන්නේ. You can submit the reports. Mechanism ඒවා මේවා ගෙනාවේ කවුද කියලා මා දන්නේ නැහැ. [බාධා කිරීම්] You submit the reports to Parliament; මාස හයකට සැරයක් වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. ප්‍රශ්නය ඉවරයි නේ. ඒක ඇති. තව මොනවාද ඕනෑ වන්නේ? "Mechanism" කියන්නේ - [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු ඇමතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා කියපු කරුණ amendment එකක් හැටියට ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, එම වගන්තියේ අවසානයට, "එම කොමිෂන් සභා මාස හයකට වතාවක් පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කළ යුතුය" යනුවෙන් සංශෝධනයට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුව කියලා කියන්නේ පක්ෂග්‍රාහීත්වයක් නැති ආයතනයක්. ආණ්ඩු පක්ෂය කිව්වොත් එක පක්ෂයක්. විපක්ෂය කිව්වොත් තව පක්ෂයක්. පාර්ලිමේන්තුව කියලා කියන්නේ මොකක්ද? මේ ඉන්න සමස්තය; මහජනයාගේ අදහස්වල සමස්තය. අපි කියන්නේ, ඒ මහජනයාගේ අදහස්වල සමස්තය තිබෙන තැනට වග කියන්න කියලා. ජනාධිපතිට වග කියනවාය කියලා කිව්වාම ඔන්න කියන්න පුළුවන් ඒක පක්ෂග්‍රාහී කියලා. එහෙම නැත්නම් අගමැතිට හෝ කැබිනට් මණ්ඩලයට වග කියනවා කියලා කිව්වොත් ඒත් එහෙම කිව හැකියි. පාර්ලිමේන්තුව කියන්නේ ආණ්ඩු පක්ෂය, විපක්ෂය අපි ඔක්කෝම ඉන්න තැන. මෙතැනට වග කියනවාය කියලා කියන එකෙන් ස්වාධීනත්වයට අබමල් රේණුවකවත් හානියක් වෙන්නේ නැහැ. අනෙක, එහෙමවත් වග කියන්නේ නැති අයගේ ස්වාධීනත්වය තිබෙන්නේ කොහේද? අහසෙද? කොහේද ඒ ස්වාධීනත්වය තිබෙන්නේ? මේ පාර්ලිමේන්තුව හැල්ලු කරන්න එපා. මෙතැනට වග කීම, කෙනෙකුගේ ස්වාධීනත්වය අහිමි වීමක් නොවෙයි. එහෙම නම්, විගණකාධිපතිතුමා මෙතැනට වග කියන්නේ? එතුමා ස්වාධීන නැද්ද? මේ "වග කිව යුතුයි" කියන කාරණය ඉතා වැදගත්. කරුණාකරලා අපි ඉල්ලා සිටිනවා ඒක අනිවාර්යයෙන් ඉටු කරන්න කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒක අනිවාර්යයෙන්ම අවශ්‍යයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු සභාපතිතුමනි, අපි අද හැන්දෑ වරුවේ ජනාධිපතිතුමා හම්බ වුණු වෙලාවේ අපි දෙගොල්ල අතර එක ප්‍රශ්නයයි තිබුණේ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න කෝ. [බාධා කිරීම්] අපි ජනාධිපතිතුමා හම්බ වුණා. ඔබතුමන්ලා ගියාට පස්සේ අපි ජනාධිපතිතුමා හම්බ වුණා. ජනාධිපතිතුමා කිව්වේ එකම ප්‍රශ්නයයි තිබෙන්නේ කියලා. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට මන්ත්‍රීවරුන් ඇතුළත් කිරීමේ ප්‍රශ්නය. ඒක අපි කළා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

මේකට එකඟ වෙලා තිබුණේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු ඇමතිතුමා, යෝජනාව පිළිගන්නවාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, ඊයේ සහ අද දිනයේ සාකච්ඡාවට භාජනය වුණු ප්‍රථම වැදගත්ම කාරණය තමයි, එතුමන්ලා නඟපු මේ පාර්ලිමේන්තු බලය මන්ත්‍රීවරුන් නොවන උදවිය බහුතරයකට දීම තුළ පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍ය බලයට හානියක් වෙනවාය කියන එක. විශේෂයෙන්ම විපක්ෂ නායකතුමාත්, අතිගරු ජනාධිපතිතුමාත් අපිත් කරපු සාකච්ඡාවේදී විපක්ෂ නායකතුමාගේ යෝජනාවලට එකඟතාව දක්වලා ඒ දහ දෙනාගේ සභාවේ හත් දෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සංයුතිය හැදෙන විධියට අපි එකඟතාවකට ආවා. [බාධා කිරීම්] ඒ ඇරෙන්න කොමිෂන්වල ස්වාධීනතාවක් ගැන වගන්ති ඇතුළත් කරන්න අපට කිසිම අවස්ථාවක කරුණු ඉදිරිපත් කළේ නැහැ. ඊයේ සාකච්ඡාවේදීත් නැහැ; අද සාකච්ඡාවේදීත් නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

දැන් මේ කථා කරන්නේ වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගේ සංශෝධනය ගැන නේ. ඒක පිළිගන්නවාද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු සභාපතිතුමනි, තිස්ස විතාරණ මන්ත්‍රීතුමාගේ සංශෝධනයට මාගේ සංශෝධනයත් සම්බන්ධයි. මගේ

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

සංශෝධනයේත් Clause 10 යටතේ 41Gවලට එකතු කරන්න කියලා තිබෙන්නේ ඔය කථාවමයි. ඒ නිසා මම ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමාගේ සංශෝධනයත් එක්ක මගේ සංශෝධනය එකතු කරමින් මගේ සංශෝධනය වෙනම ඉදිරිපත් කිරීමෙන් වැළකෙනවා. තිස්ස විතාරණ මන්ත්‍රීතුමාගේ සංශෝධනය සම්බන්ධයෙන් මම බෙදීමක් ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
දැන් ඒ සංශෝධනය ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමා හරියට ඉදිරිපත් කරන්න.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
"Each Commission shall be responsible and answerable to Parliament through a suitable mechanism" එච්චරයි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඇමතිතුමා සංශෝධනය පිළිගන්නවාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මහාචාර්ය තිස්ස විතාරණ මන්ත්‍රීතුමා, නැවත වතාවක් ඒ සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
"Mechanism" කියන වචනය අවශ්‍ය නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
තිස්ස විතාරණ මන්ත්‍රීතුමා සංශෝධනය ඉදිරිපත් කරනවා. එතුමාට ඒක පැහැදිලිව ඉදිරිපත් කරන්න තමුන්නාන්සේලා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
"Each Commission shall be responsible and answerable to Parliament" එච්චරයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අපි එකඟයි. අපි එම සංශෝධනය පිළිගන්නම්.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා සංශෝධනය පිළිගන්නවා.

ඊළඟට, ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මෙතුමන්ලා ගෙනෙන සාධාරණ හැම එකක්ම පිළිගත්තා. අසාධාරණ ඒවාට විතරයි එකඟ වෙන්නේ නැත්තේ. ඔබතුමන්ලාට අවුරුදු 18කදී කරන්න බැරි වුණු දේවල් අපි සති දෙකකින් කළා නේ.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I wish to know from the Hon. (Prof.) Tissa Vitarana, whether you are including the Judicial Commission also in it.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
No.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
But, the way you read it out - [*Interruption.*]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒක පැහැදිලියි. ගරු රාජීව විජේසිංහ මහතා. - [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Sumanthiran, it is not in the Schedule. - [*Interruption.*] We will exclude the Election Commission. -[*Interruption.*]

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
ගරු සභාපතිතුමනි, - [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
We have to exclude it. - [*Interruption.*] We have to protect the electoral system. If the "Elections Commissioner" is not included now, why are we including the "Election Commission"? -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Exactly.- [*Interruption.*]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
You do not know what you are drafting. - [*Interruption.*]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
The "Election Commission" should be excluded for them to hold free elections. - [*Interruption.*]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Exclude the "Election Commission". With that amendment, we will accept it.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

Attorney-General කිව්වා, මම කලින් ලියලා තිබුණු ආකාරයට Election Commission එක ඇතුළත් කරන්න එපාය කියලා. ඊට පස්සේ මම ඒක ලිහිල් කළා. එතකොට එතුමා කිව්වා, ඒක - [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Election Commission එක ඇතුළත් කරන්න එපා. ඒක කරන්න එපා. මම දන්නේ නැහැ, නීතිපතිතුමා මොකක්ද කිව්වේ කියලා. Election Commission එක ඇතුළත් කරන්න එපා. [බාධා කිරීම්] අප කියන්නේ ඒක ඇතුළත් කරන්න එපාය කියලායි. මම නීතිපතිතුමාගෙන් අහනවා එතුමා මොකක්ද කිව්වේ කියලා. [බාධා කිරීම්] Election Commission එක දාන්න එපා. එච්චරයි අප කියන්නේ. රාජ්‍ය සේවා කොමිසම දමන්න. Exclude the Election Commission. - [*Interruption*.]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

It is not like other Commissions. - [*Interruption*.] ගරු විපක්ෂ නායකතුමා, අප එකඟතාවකට එමු.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමාගේ යෝජනාව තමයි දැන් සාකච්ඡා කරන්නේ. [බාධා කිරීම්] හා, හොඳයි.

ඊළඟට ගරු රාජීව විජේසිංහ මහතා.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

ගරු සභාපතිතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ඔබතුමාගේ සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

Because of the amendment that was moved now, I will withdraw my amendment. But, I want to make two quick points. The reasons why we are in this mess –

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Points නම් පසුව ඉදිරිපත් කරන්න පුළුවන්. දැන් ඔබතුමාගේ සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

I am talking about my amendment to Chapter VIII; it is very clear that we discussed this yesterday. It was agreed that the Commissions should be either under the Council or Parliament. That has been forgotten and I would like to point out that contrary to what the Hon. Prime Minister said, already some of the independent Commissions are responsible and answerable to Parliament. So, I do not see what the fuss is about. I take the point, that you remove the Judicial Service Commission - [*Interruption*.]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මේක කථා කරලා අවසන් වුණු ප්‍රශ්නයක්.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ඒ ගැන කථා කරලා අවසානයි. ඒ සංශෝධනය කරලා තිබෙනවා. ගරු සජිත් ද වාස් ගුණවර්ධන මන්ත්‍රීතුමා සංශෝධනය ඉදිරිපත් කරනවාද, නැද්ද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, 10වැනි වගන්තියේ අවසානයට, "මැතිවරණ කොමිසම හැර අනිකුත් කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වග කිව යුතුය" යනුවෙන් ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ඒ සංශෝධනය පිළිගන්නවාද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ඊළඟට, ගරු ඩග්ලස් දේවානන්ද මහතා.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

I move,

"In page 17, line 10, at end add:

'(l) The Commission for Ethnic and Religious Harmony.' "

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

No, we cannot include anything. We cannot include any substantial amendment to this at the Committee Stage, Sir.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒ සංශෝධනය පිළිගන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒක අප ඊළඟ එකේදී බලමු. ගරු සභාපතිතුමනි, ඒවා පිළිබඳව පසුව සාකච්ඡා කරමු. මොකද ඒවා substantial.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු සභාපතිතුමනි, මගේ සංශෝධනය මම ඉදිරිපත් කරනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මොකක්ද, ඒ?

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
I move,

> "In page 13, leave out the words, 'In the event of the President failing to make the necessary appointments within such period of fourteen days, the persons nominated shall be deemed to have been appointed as members of the Council, ...' and insert:
>
> 'In the event the President failing to make the necessary appointments within such period of 30 days, the President shall inform his views to the Constitutional Council for review of their decision and the Council shall consider such views of the President and make recommendations to the President within 14 days of receipt of such observations of the President. The President shall within 14 days of receipt of such decision by the Council inform to the Council the final decision of the President for final consideration and implementation by the Council.' "

Hon. Minister, the reason why I am specifying this point and requesting this amendment to be included is this. If I may quote the Clause 10 41A. (6) in this Bill, it states, I quote:

> " (6) The President shall within fourteen days of the receipt of a written communication specifying the nominations made under sub-paragraph ..." ,

It means that the Council basically is sending the nominations. Generally, when someone nominates, there should be an approving authority and in the same Clause you say that if the President is silent on the matter for a period of fourteen days, the Council has the right to proceed with the decision that has been taken. So, why then in the first place, would you have to submit the nominations to the President and then if the President is quiet for fourteen days, that you decide to proceed with the appointment?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, එම යෝජනාව කිසිම නීති ප්‍රතිපත්තියකට ගැළපෙන්නේ නැති යෝජනාවක්. මීට පෙර දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දී එතුමා කියන ආකාරයට යම් කිසි ව්‍යාකූල තත්ත්වයක් තිබිලා විශාල ප්‍රශ්නයක් මතු වුණා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අසාර්ථකභාවය ගැන චෝදනා කරන්න එය එක හේතුවක් බවට පත් වුණා. ඒකේ තිබුණු දුර්වලකම් මඟ හැර ගන්න තමයි මේ ක්‍රමවේදය යටතේ ඉදිරිපත් කර තිබෙන්නේ. මේ සඳහා පක්ෂ නායකවරු සියලු දෙනාම එකඟ වෙලායි තිබෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙය තවදුරටත් වෙනස් කරන්න බැහැ. ගරු ඩිව් ගුණසේකර මැතිතුමා මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
එම යෝජනාව පිළිගන්නේ නැහැ.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමාට විනාඩියක් දෙන්නම්.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

ගරු සභාපතිතුමනි, එහෙම නම් මම propose කරනවා, "...දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ඒ අවශ්‍ය පත්කිරීම් කරනු ලැබිය යුත්තේ ය." කියන වගන්තිය ඉවත් කර දමන්න කියා. ඒක අවශ්‍ය නැහැ නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, අපි ගරු විපක්ෂ නායකතුමා සමඟ එකඟතාවකට ඇවිල්ලා බොහොම වැදගත් නීති ප්‍රතිපත්තියක් උඩ තමයි මෙම සංශෝධන සිදු කර තිබෙන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

එම පත්වීම ජනාධිපතිවරයා දිය යුතු ද එහෙම නැත්නම් වෙනත් කවුරු හරි දිය යුතු ද කියන කාරණය ගැන සාකච්ඡා කර අපි ඔක්කෝම එකඟත්වයකට ඇවිල්ලා තිබෙනවා. "ජනාධිපතිතුමා පත්වීම දෙන්න ඕනෑ. ඒක නොදෙනවා නම් විතරයි මෙය ක්‍රියාත්මක වෙන්නේ" කියා අපි එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. දැන් ඉතින් ඒක වෙනස් කරන්න හේතුවක් නැහැ.

***10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*10 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 10, as amended, ordered to stand part of the Bill.*

## 11 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වන පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම.)

வாசகம் 11.- (அரசியலமைப்பின் VIII என்னும் அத்தியாயத்தை மாற்றீடு செய்தல்.)

CLAUSE 11. - *(Replacement of Chapter VIII of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"24 වන පිටුවේ, (1) - 4 වන සහ 5 වන පේළි ඉවත්කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

'42.(1) ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙය වීම';

(2) - 10 වන සහ 11 වන පේළි ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

'(3) ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක්ද, අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානයාද වන්නේය.';

(3) 16 වන පේළියේ සිට 19 වන පේළිය දක්වා වූ සියලු පේළි ඉවත් කොට (එකී පේළි දෙක දඇතුළුව) පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

'43. (1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍යයැයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාවද අමාත්‍යාංශ සංඛ්‍යාව ද ඒ අමාත්‍යවරයන්ට පවරන විෂය සහ කාර්ය ද නිශ්චය කළ යුත්තේ ය. '

(4) - 25 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා වූ සියලු පේළි ඉවත්කොට (එකී පේළි දෙක ද ඇතුළුව) පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

'(3) ජනාධිපතිවරයා විසින් කවර අවස්ථාවකදී වුව ද අමාත්‍ය මණ්ඩලය වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම ද කරනු ලැබිය හැක්කේය. අමාත්‍ය මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ පාර්ලිමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩලය දරන වගකීමේ අඛණ්ඩ '

"25 වන පිටුවේ, (1) - 7 වන පේළියේ සිට 12 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

'(2) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යැයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින්, ඒ අමාත්‍යවරයන්ට පැවරිය යුතු විෂය සහ කාර්ය ද ඔවුන්ට යම් අමාත්‍යාංශ භාර කරන්නේ නම් ඒ අමාත්‍යාංශ ද නිශ්චය කරනු ලැබිය හැක්කේ ය.';

(2) - 13 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

'(3) ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (2)';

(3) - 26 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

"ගැසට් පත්‍රයේ";

"26 වන පිටුවේ, (1) - 14, 15 සහ 16 වන පේළි ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

'වූ බලතල කිසිවක් හෝ කාර්යයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මඟින් තම නියෝජ්‍ය අමාත්‍යවරයාට';

(2) - 28 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

"(2) අග්‍රාමාත්‍යවරයා -

(අ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මඟින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්;

හෝ

(ආ) තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවුවහොත්; හෝ

මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවත්නේ ද ඒ තාක් කල් ස්වකීය ධුරය දරන්නේ ය.";

"27 වන පිටුවේ, (1) - 25 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කළ යුතුය:

'අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් සහ';

(2) - 28 හා 29 වන පේළි ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'සති දෙකක් ඇතුළත, ඒ සඳහා පාර්ලිමේන්තුව එකඟ වන්නේ නම්, වැඩි කළ';

"29 වන පිටුවේ, (1) - 4 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'අමාත්‍යවරයන් ද අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් ද නියෝජ්‍ය';

(2) - 28 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

'අමාත්‍යවරයන් ද අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් ද නියෝජ්‍ය';

(3)- 32 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය';

(4) - 35 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස අදේශ කළ යුතු ය :-

'අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා ගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන' ";

"30 වන පිටුවේ, (1) - 8 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'ජනාධිපතිවරයාගේ විධානයන්ට යටත්ව':

(2) - 10 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින්' " ;

"31 වන පිටුවේ, (1) - 3 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'ජනාධිපතිවරයා විසින් කරනු ලැබූ විටෙක හෝ නතර' ;

(2) - 17 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'හතරවන උපලේඛනයේ සහ හත්වන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සංශෝධන ඉදිරිපත් කිරීමට ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා. ඔබතුමා සංශෝධන ඉදිරිපත් කරනවාද?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු සභාපතිතුමනි, මම සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා, සංශෝධන ඉදිරිපත් කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, Clause 11, 46 (3) of this Bill reads as follows:

"If at the conclusion of the General Election held immediately after the coming into force of this Article, the recognized political party or the independent group obtaining the highest and the recognized political party or the independent group obtaining the second highest number of seats in Parliament agrees to form a Government of national unity, then, notwithstanding the provisions of paragraph (1), the number of Ministers of the Cabinet of Ministers and the number of Ministers outside of the Cabinet of Ministers and the Deputy Ministers, may be increased up to forty-five and fifty-five, respectively, if Parliament agrees to such increase, within two weeks of the first sitting of such Parliament."

ගරු සභාපතිතුමනි, මෙම වගන්තිය ඉවත් කරන්න කියා තමයි මම යෝජනා කරන්නේ. මේ විධියට පාර්ලිමේන්තුවේ අමාත්‍යවරු වැඩි කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට වගන්තියක් අවශ්‍ය වෙන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයටයි, මේ පැත්තේ කිහිප දෙනෙකුටයි එකතු වෙලා ආණ්ඩුවක් තියාගන්න ඕනෑ නම් ඒක තියාගන්න. අමාත්‍යධුර සංඛ්‍යාව 45, 55, 65, 70, 100 වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරන්නේ නැහැ. ඕනෑම අවස්ථාවකදී වෙනත් පක්ෂයක හෝ ඕනෑම කෙනෙකු කැඳවා අමාත්‍යධුර ලබා දෙන්න ජනාධිපතිතුමාට පුළුවන්. කොහේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේද මේ විධියට සඳහන් වෙන්නේ? මට නම් තේරෙන්නේ නැහැ. මම යෝජනා කරනවා, to delete that.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
නීතිපතිතුමා උපදෙස් දීලා තිබෙනවා, ඔබතුමාගේ සංශෝධනයට ජනමත විචාරණයක් අවශ්‍යයි කියා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකක්ද? Delete කරන්න ජනමත විචාරණයක් අවශ්‍ය නැහැ. How can it be so?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
No, that is for Clause 11.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, it is on page 25 of this Bill, Clause 11, 46 (3). I have included all that in my amendment. The Hon. Minister went too fast and according to the procedure, you called me last. Therefore, I raise this now and say that this should be deleted. You do not need a referendum to delete this. First of all, this never existed in the Constitution and to remove such a clause, you do not need a referendum. This is the amendment that is being proposed.

Government එකට coalition එකක් හදන්න පුළුවන්. There is no problem in that. The Prime Minister can always form a coalition. නමුත් එහෙම ගණනක් සඳහන් කරනවාට අපි විරුද්ධයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, කලින් තිබුණු වගන්තියේ ඒක සඳහන් වෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ විධියට ඇමතිවරු ප්‍රමාණය වැඩි කරනවාටත් අපි විරුද්ධයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල සංඛ්‍යාව සඳහන් කර තිබෙනවා. දකුණු කොරියාවේ, තවත් රටවල ඒක සඳහන් කර තිබෙනවා. සමහර රටවල පාර්ලිමේන්තුවෙන් තීරණය කරන්න අවස්ථාව දීලා තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
යම් සංඛ්‍යාවක් සඳහන් කර එම ප්‍රමාණය නොඉක්මවිය යුතුයි කියා තිබෙනවා නම් ඒක හරි. "50ට වැඩිය නොවිය යුතුයි" කියා තිබෙනවා නම් ඒක හරි. නමුත් මෙතැන ක්‍රම 2ක් ගැන කියනවා. ක්‍රම 2ක් ගැන ලොකු ගණන් සඳහන් කර තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
නැහැ, මෙතැන කියන්නේ මේකයි. ජාතික ආණ්ඩුවක් ඇති කරපු අවස්ථාවකදී පාර්ලිමේන්තුව තීරණය කරනවා එම ප්‍රමාණය 30 ද, 31 ද, 35 ද කියා. එච්චරයි. පාර්ලිමේන්තුවට භාර දෙනවා ඒ වැඩකටයුත්ත කරන්න. එච්චරයි තිබෙන්නේ. සංඛ්‍යාව කුමක්ද කියා පාර්ලිමේන්තුව තමයි තීරණය කරන්නේ. මොකද, ජාතික ආණ්ඩුවක් ඇති කරන්න කියා මේ රටේ ජනතාව ඡන්දය දෙනවා නම්, ඒ අවස්ථාවේදී පාර්ලිමේන්තුවට බලය තිබෙන්න ඕනෑ කොහොමද ඒ අමාත්‍ය ධුර බෙදන්නේ කියා තීරණය කරන්න. එච්චරයි. ඊට වඩා අපි,- [බාධා කිරීමක්]

Yes, Parliament can decide that. That is all we are asking. If the party with the highest number of seats and the second highest number get together, Parliament can decide that. - [*Interruption.*] This is a special matter.

ප්‍රධාන පක්ෂ දෙක අවුරුදු දෙකක්, තුනක්, හතරක් එකට එකතු වෙලා මේ රටේ ප්‍රශ්න විසඳන්න කියා මේ රටේ ජනතාව කියනවා නම්, මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ. ජනතාව එහෙම කියන්නේ නැහැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඉස්සෙල්ලා ජනතාවගෙන් වරමක් ගන්න ඕනෑ නේ. ජනතාවට කියලා වරමක් අර ගෙනයි අප එන්නේ. ඇයි ඒක ඔය තරම් ප්‍රශ්නයක් කර ගන්නේ? [බාධා කිරීම්] ජනතාව ඇවිල්ලා ඒ ගැන කියයි. ඒක ජනතාවට භාර දෙන්න. ජනතාව ගැන මෙපමණ කථා කරලා, මේ කොමිෂන් සභා ඔක්කෝම-[බාධා කිරීම්] ජනතාව අනුමැතිය දුන්නොත් ඒ කරුණ තීරණය කරන්න මේ පාර්ලිමේන්තුවට අවස්ථාව දෙන්න. ජාතික ආණ්ඩුවක් කියන්නේ සාමාන්‍ය ආණ්ඩුවක් නොවෙයි. ප්‍රධාන පක්ෂ දෙක එකතු වෙන ආණ්ඩුවකුයි. [බාධා කිරීමක්] So, finally let Parliament decide on the number of Ministers. You cannot have 100 Ministers either. We are not saying that we should have 100 Ministers.- [*Interruption*.]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මෙම සංශෝධන කෙටුම්පතේ 46 (1) (අ) වගන්තියේ සඳහන් කර තිබෙනවා, "අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරයන් සංඛ්‍යාව තිහ නොඉක්මවිය යුතුය" කියා. ඒ, උපරිමයෙන්. සුවිශේෂී අවස්ථාවක් පැමිණි වෙලාවක යොදා ගත හැකි ක්‍රමවේදයක් විධියට තමයි මෙය ඉදිරිපත් කර තිබෙන්නේ. මෙයින් කිසිම හානියක් සිදු වන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ සංහිඳියාවට මහ පැදීමක් සිදු වනවා මිස, පාර්ලිමේන්තුවේ බලය අඩු වීමක් හෝ පාර්ලිමේන්තුවේ බෙදීමක් හෝ මෙයින් ඇති වන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ ගොල්ලෝ කියන්නේ නිකම් තියන්න කියලායි. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
නිකම් තියන්න බැහැ. නිකම් තැබුවොත් වුවමනා වුණොත් වැඩි කරන්නේ කොහොමද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
විශේෂ අවස්ථාවකදී හැර-

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ ගොල්ලෝ කියන්නේ අසීමිතව තියන්න කියා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ අවශ්‍ය ටික මෙහි තිබෙනවා. ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය කියන කාරණා ටික මෙහි තිබෙනවා. පොඩ්ඩක් කියවලා බලන්න කෝ.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
එහෙම නම් එකතු කරන්නට ඕනෑ "විශේෂ අවස්ථාවකදී හැර" - [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
වාඩි වෙන්න මන්ත්‍රීතුමිය. [බාධා කිරීම්] ඔබතුමිය කියවලා බලන්න. ඒ ඔක්කෝම ටික තිබෙනවා.[බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා, ඒ ආකාරයෙන් සංශෝධනය කරන්න. "පාර්ලිමේන්තුවට තීරණය කළ හැක" කියන -[බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
පාර්ලිමේන්තුව ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ ගණන තීරණය කරන්නේ කොහොමද? [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
පොඩ්ඩක් නිශ්ශබ්ද වෙලා හිටියොත් ඇමතිතුමාට මෙය ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඇමතිවරුන්ගේ ගණන පාර්ලිමේන්තුවට තීරණය කරන්න බැහැ නේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඇමතිතුමාට පොඩ්ඩක් බාධා කරන්නේ නැතිව ඉන්න. [බාධා කිරීම්] ගරු අගමැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Ceiling එකක් දමා තිබෙන්නේ. තනි පක්ෂයකට අමාත්‍ය ධුර තිහට වැඩි වෙන්න බැහැ. ප්‍රධාන පක්ෂ දෙක එකතු වුණොත් පාර්ලිමේන්තුවට එය තීරණය කරන්න පුළුවන්. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සභාග ආණ්ඩුවක්-[බාධා කිරීම්] තුන්වැනි පක්ෂය වෙන්න පුළුවන් නේ, TNA එක. මම ගැන කල්පනා කරන්න එපා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කළ හැකිය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Do not limit it to two parties. මම කියන්නේ මෙය අයින් කර Hon. Prime Minister කියන විධියට, let Parliament decide on the number.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා, සංශෝධිත පරිදි එය ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මට හරියට ඇහෙන්නේ නැහැ, සංශෝධනය මොකක්ද කියලා. නිශ්චිතව කියන්න, සංශෝධනය මොකක්ද කියලා. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සභාව නිශ්ශබ්ද වෙන්න. [බාධා කිරීමක්] ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු සභාපතිතුමනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න තිබෙනවා. දැන් මේ තිබෙන විධියට පිළිවෙළින් 45 සිට 55 දක්වා කිව්වාම, -[බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා ඡන්දය දුන්නේ නැහැනේ. ඡන්දය දීමෙන් වැළකී සිටියා නේ. -[බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්දව ඉන්න. -[බාධා කිරීමක්]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
දැන් ඔබතුමන්ලා මෙතෙක් වෙලා විවිධ අයට මේ සංශෝධන ඉදිරිපත් කිරීමට අමතරව කථා කරන්න අවස්ථාව දුන්නා. මට මේ එක අවස්ථාවක් ඉල්ලුවේ. ඒ නිසා කරුණාකරලා ඒ පැහැදිලි කර ගැනීම කරගන්න ඉඩ දෙන්න. මොකද, මේක මේ රටේ සම්මත වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඒ වෙනුවෙන් යම් යම් කාරණා පැහැදිලි කර ගැනීමේ අයිතිය මට තිබෙනවා. ඇයි ඔබතුමන්ලා මෙච්චර බය?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමාට ඒ අවස්ථාව තිබෙනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

දැන් පිළිවෙළින් 45 සිට 55 දක්වා කියලා කිව්වාම 100ක් නේ. අන්න ඒ ගැන කියන්න. මේ සංඛ්‍යාව 100ක් කරන්න අවසරය ලැබෙනවා කියන එකද කියන්නේ? [බාධා කිරීමක්]

ඊළඟ කාරණය මේකයි. "පාර්ලිමේන්තුව තීරණය කළ යුත්තේය" කියලා කිව්වාට පස්සේ මොකද වන්නේ? මම උදාහරණයක් කියන්නම්. පසු ගිය දවස්වල ඇති වුණේ ජාතික ආණ්ඩුවක්; එකතු වුණු ආණ්ඩුවක්. මේ සංඛ්‍යාව 150ක්ද, 200ක්ද, ඕනෑ ගණනක් කියන්න පුළුවන්.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
පාර්ලිමේන්තුව විසින් නේ, ගණන නිශ්චය කරන්නේ.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
එහෙම බැහැ. ඒ නිසා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ඒ සංඛ්‍යාව කලින් දමන්න ඕනෑ. ජනාධිපතිවරයාට දැනට ඕනෑ තරම් අමාත්‍යවරු පත් කරන්න බලයක් තිබෙනවා. [බාධා කිරීමක්] ඒක තමයි. මේ විධියට දැම්මාට පසුව පාර්ලිමේන්තුවට ඒ තීරණය දෙන්න කිව්වත්, ඒ අවස්ථාවේ තීරණය කරන්න මේ සංඛ්‍යාවේ සීමාවක් නැහැ. දැනටත් මේ 100ක් නේ තිබෙන්නේ, ජාතික ආණ්ඩුවක් හැදුවොත්. ඒ සංඛ්‍යාව නිශ්චිතව කියන්න 100ක් කියලා. සීමාවක් නැතිව දැම්මාට පසුව සම්පූර්ණයෙන් ඊටත් එහා යනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මම සංශෝධනය මේ ආකාරයට යෝජනා කරනවා, - [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභාපතිතුමනි, -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභාපතිතුමනි, ආණ්ඩුව පිහිටෙව්වාට පසුව අමාත්‍ය ධුර සංඛ්‍යාව 30කුත්, රාජ්‍ය සහ නියෝජ්‍ය අමාත්‍ය ධුර සංඛ්‍යාව 40කුත් කියලා නිශ්චිත කරලා තිබෙනවා. ඒ වාගේම ඊට පසුව විශේෂ අවස්ථාවක් කියනවා එළඹෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී -හැම දාමත් නොවෙයි- පළමුවෙනි ස්ථානයට

මන්ත්‍රී ධුර ගන්නා පක්ෂයත්, දෙවැනි තැනට මන්ත්‍රී ධුර ගන්නා පක්ෂයත් එකතු වුණොත් ඒ අමාත්‍ය ධුර සංඛ්‍යාව 45 දක්වාත්, රාජ්‍ය සහ නියෝජ්‍ය අමාත්‍ය ධුර සංඛ්‍යාව 55 දක්වාත්, එකතුව 100 දක්වාත් වැඩි කළ හැකියි කියලා. අඩුම තරමේ එම සංශෝධනයේ එකතුව 100 කියලාවත් තිබෙනවා. දැන් අප ඒ වගන්තියත් ඉවත් කරලා පාර්ලිමේන්තුවේ සම්මත කර කර ඇමති ධුර වැඩි කරන්න ගියොත් මේක කෙළවර වන්නේ නැහැ. එහෙම නම් අඩුම තරමේ ඒ සංශෝධනය එන්න ඕනෑ, "30 සහ 40 කියන සීමාවේ පැවතිය යුතුයි, අර වැනි අවස්ථාවකදී අමාත්‍ය ධුර මේ දක්වා වැඩි කළ හැකියි, එසේ කරගත හැකි වන්නෙත් පාර්ලිමේන්තුවේ අනුමැතියකින්" කියලා. එසේ නැතිව ඒ ඉම කඩන්න බැහැ. ඒ සංඛ්‍යාව 100ට එහා විවෘත කළොත් මොකද වන්නේ? අප දන්නවා පසු ගිය කාලයේ අමාත්‍ය ධුර වර්ධනය වුණු ආකාරය. මේ දෙක එකතු වුණාම කොහොම වෙයිද දන්නෙත් නැහැ. ගරු සභාපතිතුමනි, ඒ නිසා අනිවාර්යයෙන්ම ඉහළ යම් සීමාවක් දමලා තිබෙන්න ඕනෑ. ඒ සීමාව දක්වා වැඩි කර ගන්න අවශ්‍ය නම් පාර්ලිමේන්තුවේ අනුමැතියකට යටත් කරන එක තමයි හරි. ඉහළ විවෘතව තියන්න එපා කියන එක තමයි අපේ යෝජනාව.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, 27වන පිටුවේ 46 (3) වගන්තියේ 18වන පේළියේ "දෙවන" යන වචනය ඉවත් කිරීමටත්, එම පිටුවේම 25වන පේළියේ සිට 30වන පේළිය දක්වා ඉවත් කොට, -[බාධා කිරීමක්] අනුර දිසානායක ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා යෝජනා කළේ "පාර්ලිමේන්තුව විසින් තීරණය කරන" යනුවෙන්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

සාමාන්‍ය ආණ්ඩුවක් ගොඩ නැඟෙනවා නම්, සාමාන්‍ය ආණ්ඩුවකදී අමාත්‍ය ධුර සංඛ්‍යාව 30යි. නියෝජ්‍ය අමාත්‍ය ධුර සහ රාජ්‍ය අමාත්‍ය ධුර සංඛ්‍යාව 40යි. හැබැයි, ඔබතුමන්ලා විශේෂ අවස්ථාවක් දමා තිබෙනවා එළැඹෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මේ වගන්තියට සංශෝධනයක් ගෙනැල්ලා නැහැ නේද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැහැ, නැහැ. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ඒ යෝජනාවටම තමයි.

ගරු සභාපතිතුමනි, "ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුව සම්මත කරන සංඛ්‍යාවක්" කියන එකට අපි එකඟ නොවන අතර, අපේ යෝජනාව වන්නේ, "ඒ අමාත්‍ය ධුර සංඛ්‍යාව වැඩි කිරීමත් පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත්ව කළ යුතුය" කියන එකයි. ගරු ඇමතිතුමා අහපු නිසායි මේ කියන්නේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු ඇමතිතුමා, සංශෝධනය කළ ඒ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මේ 30 සීමාව තිබෙන නිසා ඔබතුමා තවදුරටත් මේ සංශෝධනයට විරුද්ධ වෙනවාද? මොකද, සාමාන්‍ය අවස්ථාවේ අමාත්‍ය ධුර 30යි කියලා තිබෙනවා. මේ කියන්නේ විශේෂ අවස්ථාවකදී විතරයි; ලබන පාර්ලිමේන්තුවට විතරක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එහෙම අවශ්‍යද? විශේෂ අවස්ථාවක් කියලා ගණනක් දමන්න ඕනෑ නැහැ නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

සුවිශේෂ අවස්ථාවකදී විතරයි ඒක තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එහෙම දමන්න අවශ්‍ය නැහැ. ගරු අගමැතිතුමා කිව්වා වාගේ පාර්ලිමේන්තුව ඒකට අවසර දෙයි. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒක interim arrangement එකක්. මෙහි අන්තර්කාලීන විධිවිධාන කොච්චර තිබෙනවාද? [බාධා කිරීම්] සුවිශේෂ අවස්ථාවකදී විතරයි නේ, ගරු මන්ත්‍රීතුමනි. මේක හොඳ අතට තිබෙන්නේ. මේක අහිතකර විධියට දමලා නැහැ. [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු සභාපතිතුමනි, ගරු අධිකරණ ඇමතිතුමා කියන කාරණයේ එක කොටසකට අපි එකඟ වෙනවා. ඕනෑම වෙලාවක හැදෙන සාමාන්‍ය ආණ්ඩුවක ඇමති මණ්ඩලය 30යි. නියෝජ්‍ය හා අනෙකුත් අමාත්‍ය ධුර 40යි. ඒක හරි. ඒ පිළිබඳ විවාදයක් නැහැ. නමුත් ඔබතුමන්ලා ඊළඟ මැතිවරණයෙන් පස්සේ ඇති වන ආණ්ඩුවක් ගැන පමණක් හිතලා ව්‍යවස්ථාවට-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ජාතික ආණ්ඩුවකදී. [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැහැ, ඔය සංශෝධනයේ කියන විධියට සර්වකාලීන ජාතික ආණ්ඩුවක් නොවෙයි. හෙට අනිද්දා පවත්වන මැතිවරණයකින් පසුව ඇති වන කෙටි කාලීන ආණ්ඩුවක් ගැන තමයි මේ සඳහන් කර තිබෙන්නේ. ඒක සුදුසු නැහැයි කියන එකයි අපි කියන්නේ. ඒකට ගණනක් දමා ගන්නවා නම් දමා ගන්න. නමුත් ඒක ගැළපෙන්නේ නැහැයි කියන එකයි අපි මේ කියන්නේ. ඒකට වෙන විකල්ප ක්‍රමයක් ගෙනෙන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

එහෙම නම් අපි මෙහෙම සංශෝධනය කරන්නම්.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

එහෙම නම්, ජාතික ආණ්ඩුවක් හදන වෙලාවකවත් වෙනත් කොයිම වෙලාවකවත් ඒ මට්ටමෙන් එහාට යන්න බැහැ. ඒ නිසා තමයි මේ දමලා තිබෙන්නේ ජාතික ආණ්ඩුවක් හැදෙන වෙලාවකට ඒ සංඛ්‍යාවෙන් එහාට යන්න පුළුවන්, නමුත් ඒකේත් සීමාවක් තිබෙනවාය කියන එක. ඒ සීමාවේ තිබෙන්නේත් කැබිනට් අමාත්‍ය ධුර 45යි, අනෙක් අමාත්‍ය ධුර 55යි. ඒක නේ, කථාව.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා කියන කථාව වලංගු නැහැ. මොකද, අපි මේ සංශෝධනයේ ඒ විධියට සංඛ්‍යාවක් දැම්මාට, ඔය කියන ජාතික ආණ්ඩුව හැදුනොත් ඒකට තුනෙන් දෙකකට වැඩියෙන් බලයක් තියෙයි. ඒ වෙලාවට හිතුනොත් මීට වඩා ඇමති ධුර වැඩි කර ගන්න ඕනෑ කියලා, සංශෝධනයක් ගෙනැල්ලා ඒක කර ගනීවි. ඒ නිසා මෙකෙන් කියැවෙන්නේ නැහැ, ජාතික ආණ්ඩුවක ඇමති ධුර සීමාව ඔය කියන ගණනින් සීමා වුණාය කියලා. ඒ වෙලාවට හිතුනොත් මේ ගණන මදියි කියලා තුනෙන් දෙකක බලයකුත් තිබෙන ජාතික ආණ්ඩුවක් නිසා ඒ වෙලාවට ඒ සංශෝධනය කර ගනියි. ඒ නිසා අපි කියන්නේ, ඊළඟ මැතිවරණයෙන් පසුව හැදෙන ජාතික ආණ්ඩුවක් ගැන පමණක් හිතලා මේ පනත් කෙටුම්පතට කෑලි එකතු කරන්න එපා කියන එකයි. අර පොදු තත්ත්වය හරි; සාමාන්‍යයෙන් හැදෙන ආණ්ඩුවක අමාත්‍ය ධුර ගණන හරි. තමුන්නාන්සේලා කෙටි කාලීන පරමාර්ථයක් වෙනුවෙන් ගණන් හදන්නේ කොහොමද? [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු සභාපතිතුමනි, මෙතෙක් කල් මැතිවරණයෙන් පළමුවැනි තැනට එන පක්ෂය ආණ්ඩුව හැටියට හිටියා. දෙවැනි තැනට එන පක්ෂය විරුද්ධ පක්ෂය හැටියට හිටියා. එහෙම තමයි ක්‍රියාත්මක වුණේ. This is a transitional period that we are going through. ඒත් අපි බලන්නේ ඊළඟ පාර්ලිමේන්තුවේදී විතරක් මේ ප්‍රධාන පක්ෂ දෙක එකතු වෙලා ජාතික ආණ්ඩුවක් හදන්නයි. හැම දාම ජාතික ආණ්ඩු හැදුවොත් ඒක ක්‍රියාත්මක කරන්න බැරි වෙනවා. මේ ප්‍රධාන පක්ෂ දෙක එකතු වෙලා වැඩ කටයුතු කරන අවස්ථාවේ රට හිතුවොත් වෙනම ක්‍රමයකට -ස්විට්සර්ලන්තයේ ක්‍රමයට නැත්නම් යුරෝපයේ ක්‍රමයට- යන්න ඕනෑ කියලා, එතකොට තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා ඒක වෙනස් කරන්න අපට පුළුවන්. දැනට කරන්න තිබෙන්නේ පළමුවැනි වතාවට ජාතික ආණ්ඩුවක් ඇති කරන්න ඉඩ තබන එකයි. එහෙම ඉඩ තිබ්බාට පස්සේ, ඒ ජාතික ආණ්ඩුවේ කාලය අවසන් වන විට, එහෙම නැත්නම් අවුරුදු දෙක තුනක් ගියාට පස්සේ, නැවතත් පරණ ක්‍රමයට යන්න පුළුවන් කියලා හිතුවොත් එතැනට යන්න පුළුවන්. අලුතෙන් අපි ඩොනමෝර් ක්‍රමයට යනවා, ස්විට්සර්ලන්ත ක්‍රමයට යනවා, එහෙම නැත්නම් උතුරු අයර්ලන්තයේ වාගේ වෙනත් ක්‍රමයකට යනවා කියලා හිතුවොත් ඒ සංශෝධන ඒ වෙලාවේම ගෙනෙන්න පුළුවන්.

දැන් මේ කරන්නේ අවුරුදු දෙක තුනක් එකට වැඩ කරන්න අවස්ථාව දෙන එක විතරයි. අවුරුදු පහක් ආණ්ඩුව ගෙන යයිද කියලාවත් දන්නේ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ඔබතුමා ඒක කර ගන්න කැමැතියි නම්, කරගන්න. ප්‍රශ්නයක් නැහැ. තාවකාලිකව හැදෙන ජාතික ආණ්ඩුවක් ගැනනේ ඔබතුමා කියන්නේ. ඒ තාවකාලිකව හැදෙන ජාතික ආණ්ඩුවේ ඇමති ධුරවල ගණන් මිණුම් මෙහි යොදන එක එච්චර ගැළපෙන්නේ නැහැ. අශෝභනයි කියලා අපි කියන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ඊළඟ ඡන්දයේදී ජනතාව මේකට අනුමැතිය දුන්නොත්, ජනතාව දන්නවා මේකයි වෙන්නේ කියලා. එහෙම එපා නම් ජනතාව අනුමැතිය දෙන්නේ නැහැ. නැත්නම් ඉතින් බලයට ඇවිල්ලා තවත් මාසයක් ගත කරන්න ඕනෑද මේවා සංශෝධනය කරන්න? බලයට ආව ගමන් වෙනත් වැඩ කටයුතු තිබෙනවා කරන්න. ඒ නිසා අපි මේ සංශෝධනය පිළිගනිමු.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු ඇමතිතුමනි, ඔබතුමා සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි මේ වෙන කොට පුන පුනා ප්‍රකාශ කරලා තිබෙනවා, ඊළඟ පාර්ලිමේන්තුව ව්‍යවස්ථාදායක සභාවක් බවට පරිවර්තනය කරලා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කරන්න කටයුතු කරනවා, ඒකට මේ රටේ වුවමනාවක් තිබෙනවා කියලා. ඉතින් ඒක අරමුණු කරගෙන තමයි මේ සංශෝධනය ඇතුළත් කරලා තිබෙන්නේ. ඉතින් මේකෙන් පාර්ලිමේන්තුවේ කාටවත් හානියක්, පරමාධිපත්‍යයට හානියක් වන්නේ නැහැ. මේකෙන් යහපතක් වෙන්නේ. අපි සියලු දෙනාම සංහිඳියාවකට ඇවිල්ලා මේ රටට අවශ්‍ය වඩාත්ම සුදුසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කර ගන්න වෙනවා. ඔබතුමන්ලා මේකට විරුද්ධ නොවී කරුණාකරලා උදව් කරන්න කියලායි අපි කියන්නේ. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, මෙය රටේ අවශ්‍යතාවක්.[බාධා කිරීම්] අපි මේ සංශෝධනය මේ ආකාරයෙන් තියා ගනිමු. අපේ චේතනාව පාරිශුද්ධයි.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු සභාපතිතුමනි, මෙම ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ මේකයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනකොට මෙහෙම විශේෂ අවස්ථාවක් ගැන හිතන්න බැහැ. දැන් මෙහිදී උපකල්පනය කරන්නේ එන මැතිවරණයට පසුව යම් කිසි අවස්ථාවක් උද්ගත වුණොත් මොනවාද කරන්නේ කියන එක. එවැනි දේවල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කරන සම්ප්‍රදායක් කොහෙත්ම නැහැ ගරු සභාපතිතුමනි. මේවා දේශපාලන තත්ත්ව. ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන රාමුවක දැමීම සම්පූර්ණයෙන්ම නුසුදුසුයි. ඒ ප්‍රයත්නය නිසා තමයි මෙම ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. This is a very inelegant provision. It is not the kind of provision that one would expect to have in a Constitution. You cannot legislate in a Constitution for political expediency.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Hon. Member, when you were the Minister of Constitutional Affairs, you brought in the Constitution in the year 2000 to abolish the Executive Presidency, but you kept it going till the end of the term. Then, that was also inelegant.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

It is a frivolous remark. We are quite accustomed to frivolous remarks by the Hon. Prime Minister.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, දැන් විරෝධතාවයක් නොමැති නිසා අපි ඊළඟ සංශෝධනයට යමු. [බාධා කිරීම්] දැන් විරෝධතාවයක් නැහැනේ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීම්] මුල් ආකාරයෙන්ම පවතියි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

හොඳයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, ඊළඟට 12වෙනි සංශෝධනය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු ඇමතිතුමනි, ඔබතුමා සංශෝධනයක් යෝජනා කළා. අපි තව සංශෝධනයක් යෝජනා කළා. ඒවායේ අවසාන තීරණය මොකක්ද කියන්න. අගමැතිතුමා කිව්වා පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්න කියලා වැඩි කරන ඇමති ධුර සංඛ්‍යාවට. එහෙනම් ඒක විවෘතව තියමු. එහෙම සංශෝධනය කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමා ඒක යෝජනා කරන්නේ අපි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එතකොට එක පක්ෂයක් එක්ක හෝ පක්ෂ දෙකක් එක්ක හෝ, බැරිනම් පක්ෂ තුනක් එක්ක හෝ එකතු වෙන්න. ඒකට ඉඩකඩ තිබෙනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමා, මෙය අන්තර්කාලීන විධිවිධානයක් නිසායි අපි කිව්වේ ඒක එහෙම තියමු කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

150ක් ඕනෑ නම් 150ක් පත් කර ගන්න. මම කියන්නේ ව්‍යවස්ථාවට සංඛ්‍යාවක් දමන්න එපා කියන එක.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට ගරු ඇමතිතුමා එකඟ වෙනවාද, නැද්ද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටින්නේ, අන්තර් කාලීන විධිවිධානයක් නිසා මේ සංශෝධනයට මේ ආකාරයට තියමු කියලායි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ව්‍යවස්ථාවට ඇතුළත් කළාම අන්තර් විධිවිධානයක් වෙන්නේ නැහැනේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඊළඟ පාර්ලිමේන්තුවේදී විතරක් කියලා සඳහන් වෙනවා, ඒකයි. ඒ "දෙවන" කියන වචනය ඉවත් කරලා අපි හදාගෙන යමු ගරු ඇමතිතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ වගන්තිය පැහැදිලිවම- [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

හොඳයි. එයට එකඟ වෙන්නේ නැති බවයි පේන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඇමතිතුමා එකඟයි. නමුත්, මෙය සකස් කර ගන්න නොහැකි තත්ත්වයක් තමයි තිබෙන්නේ. Legal Draftsman අර කාමරයේ ඉන්නවා. එතුමා ඒක ලියලා දුන්නා නම් ඉවරයි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

දැන් එකඟ වූ පරිදි එය ඉදිරිපත් කිරීමට ඇමතිතුමාට-[බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු ස්වාමීන් වහන්සේ යමක් ප්‍රකාශ කරනවා, නමුත් ඇහෙන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු අතුරලියේ රතන හිමි.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු සභාපතිතුමනි, මේ ''අන්තර්කාලීන'' වගන්තිය නැතුව, අනාගතයේ කිසියම් දවසකදී හෝ තව අවුරුදු 25කින් හෝ අවුරුදු 50කින් හෝ ජාතික ආණ්ඩුවක් හැදෙනවා නම් පමණක් මේ 'ඉලක්කමට' අපි එකඟ වෙමු කියලා මම යෝජනා කරනවා. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ඒ කථාව හරි. 'අන්තර්කාලීන'

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

කියන වගන්තිය අවශ්‍ය නැහැ. ඒ වගන්තිය ඉවත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. [බාධා කිරීම්] ඒක ප්‍රශ්නයක් නැහැ. ඒ ජාතික ආණ්ඩුවකදී විතරයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
හරි, එහෙම නම් මම මේ ආකාරයට යෝජනා කරන්නම් ගරු සභාපතිතුමනි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
දැන් ගරු මන්ත්‍රීතුමන්ලා හැමෝම නැඟිටලා නේ ඉන්නේ. ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු සභාපතිතුමනි, ගරු අධිකරණ ඇමැතිතුමාට වඩාත් පහසු වෙනවා, "ආසන්නයේම එළඹෙන පාර්ලිමේන්තු මැතිවරණයක දී, පිළිගත් දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකතුවන අවස්ථාවක දී,"- [බාධා කිරීම්] නැහැ. දෙකක් හෝ වැඩි ගණනක්.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
වැඩිම ආසන හිමි පක්ෂ දෙක කියලා කියන්න ඕනෑ. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
"එළඹෙන මැතිවරණයක දී පළමු තැන හා දෙවැනි තැන ගන්නා පක්ෂ දෙක එකතු වුණොම" කියලා අපි කියමු.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හරි, එහෙම ගනිමු. [බාධා කිරීම්] හැබැයි, ඊළඟ වතාවේ ජාතික ආණ්ඩුවක් හදන්න පක්ෂ දෙකෙනුත් බැරි වේවි. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමාට ප්‍රශ්නයක් ද? හරි නේද? ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට මොකක්ද ප්‍රකාශ කරන්න තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, පක්ෂ දෙකක් විතරක් එකතු වෙලා මේ ඇමැතිකම් ප්‍රමාණය වැඩි කරන මේ වගන්තියට අපට එහෙම එකඟ වෙන්නට බැහැ. [බාධා කිරීම්]පක්ෂ දෙක - ලොකු හෝ කුඩා - එකතු වෙලා අපි මේ තිබෙන තිහ, පනහ කරනවා; හැට කරනවා කියලා එහෙම කරන්න බැහැ. එහෙම නම් දෙන්නා හරි එකතු වෙන්නට, ඊට වඩා පුළුල් අදහසක් තිබෙන්න ඕනෑ. [බාධා කිරීම්] මේ හොර රහසේ කථා කරපු එක එළියට දමන්න එපා. හොර රහසේ කථා කරපු එකක් නේ දැන් මේ එළි කරන්න හදන්නේ. ඒකෙන් ඒ මිනිස්සුත් අමාරුවේ වැටෙනවා. මේ රහස තියාගෙන ඉන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කොයි පක්ෂ දෙකද එකතුවෙන්නේ කියලා දන්නවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, කොයි පක්ෂ දෙක එකතු වෙනවාද කියලාත් දන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පක්ෂ දෙකකට විතරක් එකතුවෙලා මේක කරන්න පුළුවන්ය කියන කාරණය අපට නම් අනුමත කරන්න බැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එය කරන්න පුළුවන් "ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවක දී" කියලා යොදමු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක ඔබතුමා කියන්න ඕනෑ. ඔබතුමා වර්ග 5 ක් ගැන -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා ඒ සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, -[බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමාට දැන් ඒ කථා කරපු විධියට සංශෝධන ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අපේ අදහස් කියන්න ඕනෑ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
අදහස් හැම තිස්සේම කියනවා නේ. එක වර ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අදහස් ඉතින් හැම තිස්සේම කියනවා නේ. දැන් මේ කාරක සභා අවස්ථාව නේ. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සංශෝධනයට ඇමතිතුමාත් එකඟ වෙන්න ඕනෑ. [බාධා කිරීම්] හරි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මම මෙසේ යෝජනා කර සිටිනවා,-[බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
දැන් මේ හැම තැනින්ම නැඟිටලා ඉන්නවා. මට පෙනෙන්නේ එක මුහුණයි. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, ගරු අධිකරණ ඇමතිතුමාගෙන් මම අහන්නේ 'ජාතික ආණ්ඩුව' කියන එක ගැන අර්ථ නිරූපණයක් තිබෙනවාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, අර්ථ නිරූපණයක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමනි, කරුණාකරලා මට ඒ අර්ථ නිරූපණය කියන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
දැන් තිබෙන ආණ්ඩුවට තමයි ජාතික ආණ්ඩුව කියලා කියන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමා, ඒ කියන්නේ ඔබතුමන්ලායි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කොටසකුයි එකතු වුණාම ඒක ජාතික ආණ්ඩුවක්ද? [බාධා කිරීම්]නැහැ. නැහැ. ජාතික ආණ්ඩුව කියන එක ගැන නිවැරදි අර්ථ නිරූපණයක් දෙන්න?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අග්‍රාමාත්‍යතුමා ජාතික ආණ්ඩුව කියන එක සම්බන්ධයෙන් පැහැදිලි කරනවා. ගරු මන්ත්‍රීතුමන්ලා ඒක අහගෙන ඉන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ජාතික ආණ්ඩුව කියන්නේ වැඩිම මන්ත්‍රී සංඛ්‍යාව තිබෙන පක්ෂයයි, දෙවනුවට වැඩි මන්ත්‍රී සංඛ්‍යාවක් ඉන්නා තිබෙන පක්ෂයයි එකතු වෙන තැන. ඒකයි දේශපාලනය. Otherwise, it is a normal conventional government -ඒක සම්ප්‍රදායික ආණ්ඩුවක්.[බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, වැඩිම ආසන සංඛ්‍යාව හිමි කර ගන්නා පක්ෂයයි, ඊළඟට වැඩිම ආසන ගන්නා පක්ෂයේ කෑල්ලකුයි එකතු වුණාම ඒකත් ජාතික ආණ්ඩුවක්ද?[බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අගමැතිතුමා කථා කරන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු සභාපතිතුමනි, -[බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්දව අහගෙන ඉන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු සභාපතිතුමනි, - [*Interruption.*] Listen to this. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළොත් මොන පක්ෂයේ කෑල්ලක්ද තිබෙන්නේ කියලා, එතකොට මම පිළිතුරු දෙන්නම්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඔබතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නොවෙයි නේ. ඔබතුමා සන්ධානයේ නගුට. දැන් කෑ ගහන්නේ මොනවාටද? [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳයි, දැන් සියලු දෙනා නිශ්ශබ්ද වන්න. ගරු අධිකරණ ඇමතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, 46වන ව්‍යවස්ථාවේ-

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ සංශෝධන පැහැදිලිව කියන්න. සියලු දෙනා නිශ්ශබ්ද වන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, 11වන වගන්තිය යටතේ මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"27වැනි පිටුවේ, 13 වන පේළියේ සිට 30 වන පේළිය දක්වා වූ සියලු පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (1) (අ) ව්‍යවස්ථාවේ කෙසේ සඳහන් වුවද, පාර්ලිමේන්තුව තුළ ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවකදී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 45ක් වශයෙන් ද, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 55ක් වශයෙන් ද විය යුත්තේ ය.' "

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සභාව එකඟද? [බාධා කිරීම්] සභාව එකඟ නැහැ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
A point of Order is being raised by the Hon. Chandrasiri Gajadeera. Yes, Hon. Member, what is your point of Order?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු සභාපතිතුමනි, 'ජාතික ආණ්ඩුවක්' යනු කවර විධියේ ආණ්ඩුවක් ද කියන අර්ථ නිරූපණයක් ලබා ගන්න නම් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න වෙවි. ඒක නිසා එයට පැහැදිලි අර්ථ නිරූපණයක් ඕනෑ. අධිකරණ ඇමතිතුමාට මේ පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන නිසායි මම මේ කියන්නේ. ඒ පිළිබඳව ව්‍යවස්ථාවේ පැහැදිලි අර්ථ නිරූපණයක් කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේකට එකඟයි නේ. ගරු සභාපතිතුමනි, සියලු දෙනාගේම අදහස් විමසන්න අවශ්‍ය නැහැ. ඒ යෝජනාව ගෙනාවේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමායි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අගමැතිතුමා, ඔබතුමා ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු සභාපතිතුමනි, "මහ මැතිවරණයකදී වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින පක්ෂයයි, දෙවනුවට වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් ලබා සිටින පක්ෂයයි එකට එකතු වී ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවේදී" කියලා කිව්වොත් හරිනේ. Let us define that.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අධිකරණ ඇමතිතුමා, හෙමිහිට පැහැදිලිව ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, එහි අතුරු විධානය විධියට මම මෙලෙස එකතු කරනවා:

"ජාතික ආණ්ඩුව යනු, මෙම පාර්ලිමේන්තුවේ වැඩිම මන්ත්‍රී ආසන සංඛ්‍යාවක් ලබා ගත් පක්ෂය සහ දෙවනුව වැඩිම මන්ත්‍රී ආසන සංඛ්‍යාවක් ලබා ගන්නා පක්ෂ දෙක එකට එකතු වී පිහිටු වනු ලබන ආණ්ඩුවක් වන්නේ ය."

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
එය ප්‍රමාණවත්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Hon. Dinesh Gunawardena, what is your point of Order?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මෙයින් කියන්නේ වැඩිම මන්ත්‍රී ආසන සංඛ්‍යාවක් ලබා ගන්නා පක්ෂය සහ දෙවනුව වැඩිම මන්ත්‍රී ආසන සංඛ්‍යාවක් ලබා ගන්නා පක්ෂය තමයි ජාතික ආණ්ඩුව කියලා. එහෙම පක්ෂ දෙකකට සීමා කරන්න එපා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු සභාපතිතුමනි, අපි මීළඟ වගන්තියට යමු.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, දැන් එම වගන්තිය අවසානයි නේ. අපි 12වැනි වගන්තියට යමු.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මේ කියන්නේ ජාතික ආණ්ඩුවක් ගැන.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, අපි කියන්නේ "ජාතික ආණ්ඩුව" කියන වචනය පාවිච්චි කරන්න, පක්ෂ දෙකක් එකතු කර සාදන ආණ්ඩුවක් කියන වචන ඉවත් කරන්න කියලායි.- [*Interruption.*] No, not the second largest. We are not interested in the second largest. How can you put it into the Constitution?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඉවරයි, දැන් ඔක්කෝම දුන්නා නේ. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, දැන් එකඟයි නේ. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාත් එකඟ වෙලා අවසානයි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳයි, ගරු ඇමතිතුමා, ඒ විධියට සංශෝධනය කරලා 11වැනි වගන්තිය ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

හරි, දැන් 12වැනි වගන්තිය ගරු සභාපතිතුමනි. 11වැනි වගන්තිය අවසානයි දැන්. 11වැනි වගන්තියට එකඟ වුණා නේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

තමුන්නාන්සේලා සියලු දෙනාම එකට කතා කරන කොට ඇමතිතුමාට පිළිතුරු දෙන්න බැහැනේ. ගරු අධිකරණ ඇමතිතුමා, හරියාකාරව පැහැදිලිව නැවතත් කියන්න, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ සංශෝධනය පිළිබඳව.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මෙතුමන්ලා අහගෙන ඉන්නේ නැහැනේ. නැවතත් කියන්න ද ගරු සභාපතිතුමනි?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු ඇමතිතුමා නවත්වන්න එපා, කියවන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒක ප්‍රශ්නයක් වෙලා තිබුණේ නැහැ, අපි ජනාධිපතිතුමාව හමු වුණා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මෙහෙමයි ඇතුළත් වන්නේ:

> "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46.(1) (අ) ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, මෙම පාර්ලිමේන්තුවේ වැඩිම මන්ත්‍රී ආසන සංඛ්‍යාව ලබා ගන්නා දේශපාලන පක්ෂය සහ දෙවනුව වැඩිම මන්ත්‍රී ආසන සංඛ්‍යාවක් ලබා ගන්නා දේශපාලන පක්ෂය ඇතුළුව ඇති කර ගන්නා වූ ආණ්ඩුවකදී කැබිනට් අමාත්‍ය ධූර සංඛ්‍යාව 45 දක්වා ද, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහ රාජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 55 දක්වා ද වැඩි කළ හැකිය."

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

"පාර්ලිමේන්තුව මඟින් තීරණය කරනු ලැබිය හැකිය." එහෙමයි එන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

හොඳයි. එහෙම නම් සංඛ්‍යාව නැතිව "පාර්ලිමේන්තුව මඟින් තීරණය කරනු ලැබිය හැකිය." යනුවෙන් ඇතුළත් වුණා නම් හරි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

හොඳයි, දැන් අවසානයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේකෙදී "ප්‍රධාන පක්ෂය තවත් පක්ෂ සමඟ ආණ්ඩුව පිහිටුවන අවස්ථාවකදී" කියලා කිව්වාම ඇති. දෙවන පක්ෂයක් අවශ්‍ය නැහැ. "පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ඇත." කියලායි සඳහන් වෙන්න ඕනෑ. Then, the Prime Minister is happy. You want to increase the number. ඒ විධියට එකඟ වෙන්න. "දෙවෙනි" කියන කෑල්ල අවශ්‍ය නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අපි ඒකට එකඟයි. "ගණන පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතුය" කියලායි ඇතුළත් වන්නේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

හොඳයි. දැන් අපි ඊළඟ එකට යමු. ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර, වාඩි වෙන්න. හැමෝම නැඟිටලා. ආණ්ඩු පක්ෂයෙන් කරුණාකර ගරු ඇමතිතුමාට පමණක් කථා කරන්න ඉඩ දුන්නොත් හොඳයි. ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මන්ත්‍රීතුමා. අනෙක් අය නිශ්ශබ්ද වෙන්න.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

ගරු සභාපතිතුමනි, මා සංශෝධනයක් ඉදිරිපත් කරනවා, Article 52(1) ගැන. ඒ- [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

තවම එතැනට ඇවිත් නැහැ. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

දැන් මේ ඉදිරිපත් කර තිබෙන්නේ 11වන වගන්තියයි. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගේ සංශෝධනය ඉදිරිපත් කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු සභාපතිතුමනි, දැන් මේ 47.(1) වගන්තියේ තිබෙන්නේ කැබිනට් අමාත්‍යවරු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුවත් මැතිවරණයක් හරහා ඊළඟ ආණ්ඩුව පත් වන තුරු තමන්ගේ නිලවල කටයුතු කිරීමේ අයිතිය ලබන්නේය කියලායි. ඒකට මා proviso එකක් එකතු කරන්න කියලා යෝජනා කර තිබෙනවා. එය මෙසේයි:

> "However such Cabinet or any member thereof shall not permit the office he/she holds to influence the result of the election by any act or omission. This shall apply to other articles mutatis mutandis where applicable."

That is about Deputy Ministers. Similarly, they shall not be allowed to use their office to influence the result of the election by any act or omission. I think that is a reasonable amendment and that is in line with your thinking.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Hon. Member, without putting all that, should you not say, "The Ministers cannot use their office for election

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

purposes in accordance with such guidelines or instructions given by the Election Commission". That is the best thing.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
That has to come at the end of Article 47(1).

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒකට එකඟයි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 47.(1) ව්‍යවස්ථාවට අනතුරුව යෙදෙන අතුරු විධානයේ මෙසේ සඳහන් විය යුතුය:

> "එසේ ධුර දැරීමේදී ඔවුන් විසින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන නිර්ණායකයන්ට අනුව මැතිවරණයට අයුතු ලෙස බලපෑමක් නොවන පරිද්දෙන් ක්‍රියා කළ යුත්තේය."

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු රාජීව විජේසිංහ මහතා.

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
ගරු සභාපතිතුමනි, මා හිතනවා මේ යෝජනාව කවුරුත් එකඟ වේවි කියලා. හැබැයි, මේක පොරොන්දුවක්. අපි මීට මාස තුනකට පෙර-

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සංශෝධනය කියවන්න.

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
හොඳයි, මා කියවන්නම්. 11.(3) සඳහා දැන් තිබෙන වගන්තිය වෙනස් කරලා -

"The President shall be the Head of the Cabinet of Ministers,…."

ලෙස ඒක දැන් තිබෙනවා.

ඊළඟට මෙසේ යෝජනා කරනවා:

I move,

"In page 22 at end of line 11, insert:

> 'and shall hold the portfolio of Defence. The Cabinet shall consist of 25 other members whose functions shall be laid down in the 9th Schedule to the Constitution.'"

මා ඒ ලියවිල්ල **table*** කරනවා. Schedule එකක් හැටියට හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

***සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணை:*
*Schedule tabled:*

1. Defence and National Integration
2. Finance
3. Foreign Affairs
4. Agriculture and Irrigation
5. Economic Development and Investment Promotion
6. Trade and Industries
7. Health
8. Human Resources (Education, Higher Education, Vocational Training)
9. Plantations
10. Energy, Petroleum and Mineral Resources
11. Housing and Construction
12. Social Services, Samurdhi, Women and Children
13. Fisheries and Livestock Development
14. Human Rights, Reconciliation and Good Governance
15. Public Order and Disaster Management
16. Transport and Highways
17. Local Government and Public Administration
18. Justice
19. Lands, Urban Development, Water Supply
20. Environment
21. Ports and Shipping
22. Labour and Foreign Employment
23. Social Amenities (Cultural Affairs, Sports, Posts)
24. Aviation and Tourism
25. Media, Telecommunications and Information Technology
26. Archaeology and National Heritage

Delete 43 (1) nd (2) and (3) and replace with 'The President shall, in consultation with the Prime Minister, appoint from among Members of Parliament Ministers to be in charge of the Ministries, and may change the composition of the Cabinet of Ministers from time to time in consultation with the Prime Minister

Delete 44

**The concept of State Ministers is unnecessary, and there should be a simple Cabinet with Deputies to match**

Delete 45 (1) and (2) and replace with 44, The President may, in consultation with the Prime Minister, appoint upto 26 Deputy Ministers to assist the Ministers in the performance of their duties.

Delete 46 and replace with only A Minister or Deputy Minister shall hole office throughout the period during which the Cabinet of Ministers functions unless he or she is removed from office under the hand of the President in consultation with the Prime Minister or ceases to be a Member of Parliamen

In 47, 48 and 49 replace 'on the advice of the Prime Minister' with 'in consultation with the Prime Minsiter', and delete references to 'other Minister(s) appointed under Article 44)'

In 52 add at the end 'with the concurrence of the Public Service Commission'.Delete 52 (3)

**In the interests of an independent Public Service, we need Permanent Secretaries appointed by a PSC. This obviously will not preclude special cases where someone is necessary, but the onus should be on the executive to make a good case for this, without individuals allowed to make choices for which they are not accountable.**

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමනි, නීතිපතිතුමා උපදෙස් දීලා තිබෙනවා, ඒ සඳහා ජනමත විචාරණයක් අවශ්‍යයි කියලා. එම නිසා - [බාධා කිරීමක්]

***11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 11, as amended, ordered to stand part of the Bill.*

***12 සිට 15 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*12ஆம் வாசகத்திலிருந்து 15ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 12 to 15 ordered to stand part of the Bill.*

## 16 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඉ සහ 61ඊ ව්‍යවස්ථා ප්‍රතියෝජනය කිරීම.)
### வாசகம் 16.- (அரசியலமைப்பின் 61உ மற்றும் 61ஊ என்னும் உறுப்புரைகளை மாற்றீடு செய்தல்.)
CLAUSE 16 . - (*Replacement of Article 61E and 61F of the Constitution.*)

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"34 වන පිටුවේ, 12 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:
'විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරන' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා සංශෝධන ඉදිරිපත් කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මා සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ.

***16 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*16ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 16, as amended, ordered to stand part of the Bill.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
17වන වගන්තියට ගරු රාජීව විජේසිංහ මන්ත්‍රීතුමා සංශෝධන ඉදිරිපත් කරනවාද?

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
ගරු සභාපතිතුමනි, මා සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඉදිරිපත් කරන්නේ නැහැ.

***17 සහ 18 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*17ஆம், 18ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 17 and 18 ordered to stand part of the Bill.*

## 19 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)
### வாசகம் 19.- (அரசியலமைப்பின் 70ஆம் உறுப்புரையைத் திருத்துதல்.)
CLAUSE 19 . - (*Amendment of Article 70 of the Constitution.*)

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"35 වන පිටුවේ, 26 සහ 27 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:
'එසේ වුවද, පාර්ලිමේන්තුව විසින් එහි නොපැමිණි මන්ත්‍රීවරයන්ද ඇතුළුව මුළු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ යෝජනා' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා සංශෝධන ඉදිරිපත් කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, ගරු සභාපතිතුමනි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ. ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මන්ත්‍රීතුමා සංශෝධන ඉදිරිපත් කරනවාද?

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
නැහැ, ගරු සභාපතිතුමනි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ.

***19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 19, as amended, ordered to stand part of the Bill.*

***20 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*20ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 20 ordered to stand part of the Bill.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
*(The Chairman)*
21 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමට ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
*(The Hon. Dinesh Gunawardena)*
ඉදිරිපත් කරන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඉදිරිපත් කරන්නේ නැහැ.

***21 සහ 22 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*21ஆம், 22ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 21 and 22 ordered to stand part of the Bill.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මගේ යෝජනාවක් තිබෙනවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 19 වන වගන්තිය - Article 70- සඳහා. ඔබතුමා ඒක ඉදිරිපත් කරන එක ටිකක් පසු කළා. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධවයි ඒ යෝජනාව තිබෙන්නේ. මා යෝජනා කර තිබෙනවා, මේ වගන්තිය ඉවත් කරලා දැන් තිබෙන වගන්තිය තියන්න කියලා. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට තිබෙන ඉඩ කඩ දැන් අහුරා තිබෙනවා. ඒ නිසා මේ වගන්තිය තියන්න ඕනෑ ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුව විසුරුවා හරින්න පුළුවන් වන විධියටයි. තමුන්නාන්සේලා අවුරුදු හතරක් යනතුරු පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හිර කිරීමකුයි මේ වගන්තියෙන් කරන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක තමයි අපි මේකෙන් කරන වෙනස.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ වෙනස ඔබතුමන්ලාට කරන්න පුළුවන් ඔබතුමන්ලාට බහුතරයක් තිබුණා නම්. ඔබතුමන්ලාට බහුතරයක් නැහැ. ඒ නිසා මේ වගන්තිය යටතේ එන බලය ජනාධිපතිතුමා සතුව තියන්න, කැමැති අවස්ථාවක විසුරුවන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මේකෙන් අවස්ථාව දීලා තිබෙනවා. පාර්ලිමේන්තුවෙන් යෝජනා සම්මතයක් ආවොත් ඕනෑ වෙලාවක එතුමාට ඒ බලය තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පාර්ලිමේන්තුවෙන් යෝජනා සම්මතයක්ම අවශ්‍ය නැහැ නේ, රාජ්‍ය නායකයාට පාර්ලිමේන්තුව විසුරුවන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එහෙම නැතිව හිතුවක්කාර විධියට කරන්න බැහැ නේ. එහෙම නම් මොකටද මේ සංශෝධනය?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අවුරුදු හතරක කාලයකට දීර්ඝ කරනවාට අපි විරුද්ධයි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අවුරුදු හතරක කාලයකට දීර්ඝ කරන එක ගැන අපට එකඟ වෙන්න බැහැ. ඒ නිසා තමයි මේ සංශෝධනය ඉදිරිපත් කළේ. ඔබතුමන්ලා ඒක පිළිගන්නේ නැත්නම් ඡන්දයක් තියන්න. අවුරුදු හතරක් යන තුරු බංකොලොත් වෙච්, බංකොලොත් වෙච්, දහස් ගණනක් මිනිස්සු පාරවල්වල රස්තියාදු වෙච්, පාර්ලිමේන්තුව අර්බුදකාරී තත්ත්වයකට පත් වෙලා තිබෙන අවස්ථාවක ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුව විසුරුවා හරින්න පුළුවන් වෙන්න ඕනෑ. අපි මේ කථා කරන්නේ හදිසි කරලා පාර්ලිමේන්තුව විසුරුවා හරින්න නොවෙයි. ආර්ථික අර්බුදයක් ඇවිල්ලා, ආණ්ඩුව කරගෙන යන්න බැරි තත්ත්වයක් ඇති වුණු අවස්ථාවක ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව විසුරුවා හැරලා අලුත් ආණ්ඩුවකට අවස්ථාව දෙන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ බලය පාර්ලිමේන්තුවට තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
යුරෝපයේ හැම තැනම මෙවැනි අර්බුද තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා අවුරුදු හතරකට සීමා කරන්න හදන දේට අපි එකඟ නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මේක පාර්ලිමේන්තුවට තිබෙන්න ඕනෑ බලයක්, ගරු සභාපතිතුමනි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමනි, වගන්තිය මොකක්ද? දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඒ වගන්තිය පොඩ්ඩක් කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Cluase 19 with regard to Article 70.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මේක වගන්තිය පාස් වෙලා හුඟක් වෙලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්, මේවාට හුඟාක් වෙලාව ගත වෙනවා. මොනවත් කථා කරන්නෙත් නැහැ. මගේ amendment එකකුත් තිබුණා නේ. [බාධා කිරීමක්] එහෙම හරි නැහැ නේ. පාර්ලිමේන්තුව විසුරුවන amendment එකත් ගියා, මට කියන්නේ නැතිව -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමා ඒක ඉදිරිපත් කළේ නැහැ. ඒකයි වුණේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
That is not fair.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමා ඉදිරිපත් කළේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එහෙම බැහැ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. එහෙම කරන්න බැහැ නේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා එකඟ නම් -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක බරපතළ දෙයක් ගරු සභාපතිතුමනි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක දැන් ගිහිල්ලා ඉවරයි නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පාර්ලිමේන්තුව අවුරුදු හතරක් යන තුරු විසුරුවන්න බැහැ කියන එක පාර්ලිමේන්තුවට හා ඡන්ද දායකයන්ට කේන්ද්‍රීය වූ කාරණයක්. මේ කාරණාවලදී, හදිසියේ නිකම් බුල්ඩෝසරයක් වාගේ යන්න බැහැ. මේක මන්ත්‍රීතුමන්ලාට අති වැදගත් කාරණයක්.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා, එය කථා කරපු වෙලාවේ ඔබතුමා වෙන කල්පනාවක ඉන්න ඇති.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වෙන කල්පනාවක සිටියා නොවෙයි. මෙහිදී වගන්ති ගණනාවක් කථා කළා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සියලුම දෙනා බොහොම කලබලයි නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
පොඩ්ඩක් සාවධානව අහගෙන ඉන්න.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
පොඩ්ඩක් ඉවසීමෙන් නිශ්ශබ්දව ඉඳලා, ඒ ඒ මන්ත්‍රීතුමන්ලාට ඒවා ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න.

## 23 වන වගන්තිය. - (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)
வாசகம் 23.- (அரசியலமைப்பின் 92ஆம் உறுப்புரையைத் திருத்துதல்.)
CLAUSE 23.- (*Amendment of Article 92 of the Constitution.*)

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"37 වන පිටුවේ, 22 වන සහ 23 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

"තෝරාපත් කොට ගනු ලැබ තිබීම; සහ";

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සංශෝධනයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
23 වන වගන්තියට අදාළ සංශෝධනය තමයි කිව්වේ, ගරු සභාපතිතුමනි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වන්නට පුළුවන් වයස් සීමාව වැඩි කර තිබෙනවා. දැනට තිබෙන වයස් සීමාව වැඩි කරන්නට අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා දැනට තිබෙන වයස් සීමාව එසේම තබන්නටය කියන එක තමයි මම ඉදිරිපත් කරන සංශෝධනය. ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් විය හැකි වයස් සීමාව වැඩි කරන්නේ ඇයි? මොකක්ද හේතුව? [බාධා කිරීමක්] You are trying to raise it by just two years. It is absurd. Two years does not make a difference for a man. If he falls into all the categories -

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
It is a mistake.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Are you all trying to block CBK's son? Are you all trying to block him? - [*Interruption.*]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එහෙම වයස් සීමාවක් නැහැ. ගරු මන්ත්‍රීතුමා කොයි වගන්තියද ඔය කියවන්නේ? එහෙම එකක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම කියන්නේ 23 වන වගන්තිය ගැන. ඔබතුමා 23 වන වගන්තිය බලන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
"තිහ" යන්නට, "තිස්පහ" කියලා තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තිහ නොවෙයි. ගරු සභාපතිතුමා දැන් කථා කළේ 23 වන වගන්තිය.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
"තිහ" යන්නට "තිස් පහ" යනුවෙන් ආදේශ කිරීමෙන්. කවුරුවත් ඒකට විරෝධතාවක් ඉදිරිපත් කරලා තිබුණේ නැහැ, ගරු සභාපතිතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම සංශෝධනයක් දීලා තිබෙනවා නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමා, ඒක එහෙම තිබුණා වේ. ඕනෑම කෙනෙකුගේ බුද්ධිය මුහුකුරා යන එක හොඳයි නේ. අවුරුදු 35 වන කොට බුද්ධිය මුහුකුරා යනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමනි, 23 වන වගන්තියට ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යෝජනාව පිළිගන්නවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම කියන්නේ, දැන් තිබෙන වයස් සීමාව තියන්න කියලායි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අපි අවුරුදු 35 කරමු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් තිබෙන වයස තියන්න. වැඩි කරන්න එපා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ජනාධිපතිවරයෙක් වෙන්න මුහුකුරා ගිය පරිණත ඥානයක් ඕනෑ නේ. අවුරුදු 35ක් යනවා එහෙම වෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අලුත් කොල්ලෝ ඉන්නවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔව්, දඟ ගහන අලුත් කොල්ලෝ ඉන්නවා. නමුත් කොල්ලන්ගේ මොළයේ ප්‍රශ්නයක් තිබෙනවා නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අලුත් කොල්ලෝ හුඟාක් හොඳ දේවල් දන්නවා. තමුන්නාන්සේ වාගේ නොවෙයි. [බාධා කිරීමක්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒ සංශෝධනය පිළිගන්නේ නැතැයි කිව්වා.

***23 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*23 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 23, as amended, ordered to stand part of the Bill.*

## 24 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම)
### வாசகம் 24.- (அரசியலமைப்பின் 99ஆம் உறுப்புரையைத் திருத்துதல்.)
CLAUSE 24. - (*Amendment of Article 99 of the Constitution.*)

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
24 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

මා මෙම ප්‍රශ්නය මුළු පාර්ලිමේන්තුවේම අවධානයට යොමු කරවනවා. අද අපි සිනා වී යයි. මේ ගැන කල්පනාකාරීව කටයුතු නොකළහොත් පසුව කනගාටුදායක තත්ත්වයක් එනවා. මේක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක් දරුණු ලෙස උල්ලංඝනය කරන සංශෝධනයක්. එනම්, කුමන දේශපාලන පක්ෂයක සිටියද තමන්ගේ මන්ත්‍රී ධුරය පිළිබඳව දැනට අධිකරණයට යන්න තිබෙන බලය, ඉඩකඩ ඉතාම සීමිත තත්ත්වයකට පරිවර්තනය කරමින් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද නැති වන අවස්ථාවකට ගෙනෙන මේ 24 වන වගන්තිය ඉවත් කරන්න. මේ වගන්තිය ඉවත් කළොත් දැන් තිබෙන තත්ත්වයේ හැටියට පක්ෂයේ ප්‍රශ්නයක් වුණොත් ඕනෑම වෙලාවක මන්ත්‍රීවරයකුට අධිකරණයට යන්න පුළුවන්. දැන් තිබෙන තත්ත්වය එලෙසම තියන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99. (13) (අ) අනුව්‍යවස්ථාවේ ඉතාම පැහැදිලිව සඳහන් වනවා, මන්ත්‍රීවරුන් පිළිබඳව විනය පරීක්ෂණයක්, විනය තීන්දුවක් ගත්තොත් ඒ පිළිබඳව තීන්දු ගැනීමේ බලය තිබෙන්නේ ලංකාවේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණයට බව. තීන්දු ගැනීමේ බලය ඉහළම අධිකරණයට දීලා තිබෙනවා. පසු ගිය කාලයේ සමහර පක්ෂ පාලනය කළේ දේශපාලන පක්ෂ නායකයෝ නොවෙයි. සමහර වෙලාවට දිසා අධිකරණයෙන් එහෙම නැත්නම් මහාධිකරණයෙන් නියෝග ලබා දෙනවා අපි දැක්කා. ලංකාවේ සියලුම දේශපාලන පක්ෂ අධිකරණ නියෝගවලින් පාලනය කළා. අපට විතරක් නොවෙයි. මේක හැම පක්ෂයකටම බලපාන ප්‍රශ්නයක්. එතකොට උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකුගේ විනය පිළිබඳ කාරණයකදී තීන්දු දීමේ බලය රටේ ඉහළම අධිකරණයට නම් තිබෙන්නේ, ඇයි ලංකාවේ පහළම අධිකරණයට ඒක ක්‍රියාත්මක කරන්න දෙන්නේ? ඒක නිසා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එය සලකා බලා මේ වගන්තිය අනුමත කර තිබෙනවා. මේක වෙනස් කරන්න කිසිම අවශ්‍යතාවක් නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, ගරු අධිකරණ ඇමතිතුමා මතු කළ කාරණය ගැන මා කරුණු කිහිපයක් කියන්නම්. මෙතැන දෙපැත්තක් තිබෙනවා. සමහර විට පක්ෂයක ආධිපත්‍ය තදින් තහවුරු කිරීම මන්ත්‍රීවරයකුගේ සාධාරණ අයිතිවාසිකමට බලපාන්න පුළුවන්. පසු ගිය කාලයේ සමහර පක්ෂවල ඇති වුණු අර්බුදවලදී ඔය තත්ත්වය තිබුණා නම් මේ පාර්ලිමේන්තුවේ ගොඩක් මන්ත්‍රීවරුන් මෙතැන නැහැ. ඒක එකක්. මම හිතන්නේ අපි පක්ෂයක අයිතිය රකිනවා වාගේම මන්ත්‍රීවරයාගේ අයිතියත් ආරක්ෂා කිරීම ගැන හිතන්න ඕනෑ කියලායි.

ඊළඟට එතුමා කියන කලින් තිබුණ තත්ත්වය, ඒ කියන්නේ දිසා අධිකරණයකට හෝ වෙනත් අධිකරණයකට යන්න තිබුණු අවස්ථාව මේකෙන් නැති කරලා තිබෙනවා. කෙළින්ම යන්න තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට. හිතන්න, ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයෙක් ගැන. ඔහුට පක්ෂයෙන් අසාධාරණ තීන්දුවක් එනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ අයට මේක අදාළ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
පාර්ලිමේන්තුවට පමණයිද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දැනට තිබෙන නීතිය අනුව තත්ත්වය ඔබතුමා පැහැදිලි කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99. (13) (අ) අනුව්‍යවස්ථාවේ අතුරු විධානය විධියට තිබෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ විනය පිළිබඳව ගන්න තීන්දුවක් මාසයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළොත් ඒ මන්ත්‍රී තනතුර අහෝසි වන්නේ නැහැ කියලා. ඒ නඩුව මාස දෙකක් ඇතුළත අසා අවසාන වශයෙන් තීන්දුවක් ලබා දිය යුතුයි. එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය සැලකිල්ලට ගත යුතුයි ඒ මන්ත්‍රීවරයාට අසාධාරණයක් සිදුවෙලා තිබෙනවාද, පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝනය වෙලා තිබෙනවාද, දෙපාර්ශ්වයට සවන් දීමේ "ස්වාභාවික යුක්ති ධර්මය" නැමැති සංකල්පය ඉෂ්ට වෙලා තිබෙනවාද කියලා. එහෙම සිදු වෙලා නැත්නම් ඒ මන්ත්‍රීතුමා පිළිබඳව ගත් විනය නියෝගය අහෝසියි කියලා නියෝග කරන්න ශ්‍රේෂ්ඨාධිකරණයට බලය තිබෙනවා. එතකොට කිසිම හානියක් නැහැ. උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සම්බන්ධව තීන්දු ලිවීමේ බලය දීලා තිබෙන්නේ ඉහළම අධිකරණයටයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා ඔය කියන්නේ මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව තත්ත්වය නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
නැහැ, දැන් තිබෙන තත්ත්වය. මේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන තත්ත්වය. ඔබතුමාට මතක ඇති, පසු ගිය කාලයේ මේ වාගේ නඩු ගණනාවක් ඉදිරිපත් වුණා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
දැන් මේ වගන්තිය ඇතුළත් කිරීමෙන් පසුව එන තත්ත්වය මොකක්ද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ තත්ත්වය එහෙමම තිබෙනවා. පහළ අධිකරණවලට ඒකට මැදිහත් වෙන්න එපා කියලා කියන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණ බලය පොඩ්ඩක්වත් අඩු කරන්නේ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නමුත් ඔබතුමා දන්නවා ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයන්ගේ ගාස්තුවල තත්ත්වය. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම තමයි කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඉතින් අනෙක් අධිකරණවලට යන්න තිබෙන අවස්ථාව නැති කරන්නට ඕනෑ නැහැ නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියනවා ශ්‍රේෂ්ඨාධිකරණයට විතරක් යන්න කියලා. අපි එහෙම යමු. ඔබතුමාව පක්ෂයෙන් අයින් කරන්නේ නැහැනේ, භය වෙන්න එපා.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙන්නට ඕනෑ. ඒ කියන්නේ, පක්ෂයක අත්තනෝමතික තීරණයක් තිබෙනවා නම්, ස්වාභාවික යුක්තිය උල්ලංඝනය කෙරිලා තිබෙනවා නම් මන්ත්‍රීවරයෙකුට ප්‍රතිකර්මයක් තිබෙන්නට ඕනෑ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක තමයි ඉතින් ප්‍රතිකර්මය.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
දැන් මේ වගන්තිය නිසා දිසා අධිකරණයට ගිහිල්ලා කිසිම ප්‍රතිකර්මයක් අපේක්ෂා කරන්නට බැහැ. ඇපැල් උසාවියේ Writ Jurisdiction ඉවත් කරනවා. *Certiorari Mandamus* වැනි සියලුම දේවල් ඉවත් කරලා තිබෙනවා. ඒක තුලනාත්මක අදහසක් නොවෙයි. දේශපාලන අධිකාරිය මන්ත්‍රීවරයකුගේ අයිතිවාසිකම් ගැන හිතන්නේ නැතිව, ස්වභාවික යුක්තියට අනුකූල නොවන පරිදි තීරණයක් අරගෙන තිබෙනවා නම් මන්ත්‍රීවරයාටත් යම් කිසි ආරක්ෂාවක් අවශ්‍ය වෙනවා. එම නිසා මෙය සතුටුදායක වගන්තියක් නොවෙයි කියලායි අපි හිතන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, පසු ගිය වකවානුවේ නඩු තීන්දු 20කට වැඩිය දීලා තිබෙනවා මන්ත්‍රීවරුන්ගේ අයිතිය රකින්නට. ශ්‍රේෂ්ඨාධිකරණය සම්පූර්ණයෙන්ම ඒවා ගැන සලකා බලලා -මම නම් කියන්නේ නැහැ, මේ ගරු සභාවේ දැනට ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පවා- මන්ත්‍රීවරුන්ගේ අයිතිය ආරක්ෂා කරලා තිබෙනවා. මේකෙන් ඒ බලය දශමයකින්වත් අඩු වෙන්නේ නැහැ. ඒ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට තියන්න. ඇයි අපි ඒක පහළ අධිකරණයකට ගෙන යන්නේ? පාර්ලිමේන්තුව උත්තරීතරයි, මන්ත්‍රීතුමා උත්තරීතරයි, නමුත් නඩු අහන්නට කියනවා පහළ උසාවියෙන්. මොකක්ද ඒ තර්කය? ඒ අවස්ථාව ව්‍යවස්ථාවෙන් දීලා තිබෙනවා උත්තරීතර විධියට.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා, මේ සංශෝධනය පිළිගන්නවාද නැද්ද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.)Wijeyadasa Rajapakshe)
පිළිගන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
පිළිගන්නේ නැතිලු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මේක බරපතළ ප්‍රශ්නයක්. [බාධා කිරීමක්] මේක සත්‍ය නොවෙයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
කොහොමද සත්‍ය නොවෙයි කියන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැනට තිබෙන විධියටම ඒ වගන්තිය තියන්න. ඒ විධියට තිබුණාම මන්ත්‍රීවරයෙකුට පක්ෂයෙන් ගැටලුවක් තිබෙනවා නම් වෙනත් අධිකරණයකට යන්න පුළුවන්. තමුන්නාන්සේ ඇතුළත් කර තිබෙන මේ වගන්තියෙන් මන්ත්‍රීතුමන්ලාට තිබෙන ඒ අයිතිවාසිකම නැති වෙනවා. එම නිසායි මම මේ සංශෝධනය ඉදිරිපත් කළේ, එක පක්ෂයක් ගැන හිතලා නොවෙයි. සියලු පක්ෂවල ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ බෙල්ලේ වැල දමා ගන්නට එපා මේ වගන්තියට පක්ෂව ඡන්දය දීලා. අපි තිබෙන අයිතිවාසිකමක් නැති කර ගන්නට අවශ්‍ය නැහැ. [බාධා කිරීම්] ගරු සභාපතිතුමනි, අපි මේ සංශෝධනය සඳහා ඡන්දයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඡන්ද විමසීමක් ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මෙතැන අපේ දේශපාලන න්‍යාය පත්‍ර නැහැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු සභාපතිතුමනි, මේකේ දෙපැත්තක් තිබෙනවා. එකක්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මේ වගන්තිය ඇතුළත් කළේ මේ ගැන තීරණයක් කරන්නට කෙළින්ම ශ්‍රේෂ්ඨාධිකරණයට විතරක් බලය දෙන්නයි. ඒ අනුව තමයි අපි කටයුතු කළේ. පසු ගිය අවුරුදු 10දී තමයි මේ වාගේ තත්ත්වයක් ආවේ. තමන් විරුද්ධ පක්ෂයේ නම් දිස්ත්‍රික් උසාවියකට යන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයේ නම් යන්නේ නැහැ. මේ සම්බන්ධව එක ක්‍රමයක් තිබෙන්නට ඕනෑ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ වගන්තිය ව්‍යවස්ථාවට ඇතුළත් කළේ ඇයි? මාව පක්ෂයෙන් නෙරපන්නට ගියාම මම උසාවියට ගියා. උසාවියට ගියාම ඒ සඳහා අවස්ථාවක් තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයට තිබෙන ඒ අයිතිය ඉවත් කරලා නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය එක එක විධියට තීරණ දීලාත් තිබෙනවා. අපි එකඟ වෙන ඒවාත් තිබෙනවා, විරුද්ධ වන ඒවාත් තිබෙනවා. 1978 ව්‍යවස්ථාව ගෙනා අවස්ථාවේදීවත්, වෙනත් කාලයකදීවත් මේ සඳහා දිස්ත්‍රික් උසාවියට යනවා කියලා තීරණයක් තිබුණේ නැහැ. දිස්ත්‍රික් උසාවියෙන් මේ කාරණා අරගත්තේ නැහැ. මන්ත්‍රීවරයෙක්ව පක්ෂයෙන් නෙරපුවාම කෙළින්ම එක සැරේම ගිහින් නඩු දානවා. නඩු දාලායි ඒ සඳහා විසඳුමක් ලබා ගත යුත්තේ. එහෙම නැතිව පක්ෂයෙන් තමන්ට විරුද්ධව විභාගයක් පටන් ගත්තාම උසාවියට යන්නට පුළුවන්. ඒකත් නවත්වලා නැහැ. පක්ෂය තමන්ට විරුද්ධව නඩු විභාගයක් පටන් ගන්නකොට ඕනෑ නම් දිස්ත්‍රික් උසාවියට යන්න පුළුවන්. ඒ විභාගය අවසන් කරලා තමන්ව නෙරපුවොත් එතකොට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්නට ඕනෑ. ඒ අවස්ථාවේදී ආපසු දිස්ත්‍රික් උසාවියට යන්නට බැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම සද් භාවයෙන් සියලුම පක්ෂවල අයිතිය වෙනුවෙනුයි මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ. පක්ෂ පවතින්න ඕනෑ මේ ක්‍රමය යන්න. පක්ෂවල බලය දිය වෙන්න වුණාට පසුව පක්ෂය ගෙන යන්න බැහැ. ප්‍රජාතන්ත්‍රවාදය කඩා ගෙන වැටෙනවා, හැම පක්ෂයේම. මෙතැන අපේ දේශපාලන න්‍යාය පත්‍රයක් නැහැ. මේවා සියලු දෙනාම කථා කරලා එකඟ වුණු දේවල්. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සංශෝධනය ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා ඡන්ද විමසීමක් ඉල්ලා තිබෙනවා. එකඟ වන්නේ නැද්ද ඇමතිතුමා?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, මෙයින් කිසිම අසාධාරණයක් වෙන්නේ නැහැ. ඔබතුමන්ලාගේත්, අපේත් - කාගේත්- පක්ෂවලට හොඳයි මේක.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අසාධාරණයක් වන්නේ නැත්නම් මේ වගන්තිය ඉවත් කර ගන්න. රටේ දැනට තිබෙන නීතිය යටතේම කටයුතු කරමු. ඒක තේ අපේ යෝජනාව. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
දැනට තිබෙන නීතිය, ශ්‍රේෂ්ඨාධිකරණයට යන්නට තිබෙන අයිතිය එලෙසම තිබෙනවා. ඒක දශමයකින්වත් අඩු කරලා නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක වෙනම කාරණාවක්. දැනට තිබෙන අයිතිවාසිකමක් සීමා කරන්නේ ඇයි, අලුතින් වගන්තියක් ගෙනැල්ලා? මන්ත්‍රීතුමන්ලාට ගැටලුවක් මතු වුණු දවසකට, දැනට තිබෙන, ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න පුළුවන් ක්‍රමවේදය අනුගමනය කරමු. මේ විධියට ගියාම, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකුට තිබෙන අයිතියත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට නැති වෙනවා නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න බලයක් නැහැ. පළාත් සභාවල මන්ත්‍රීවරුන්ටත් ඒ බලය නැහැ. ඒ අයිතිය දී තිබෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාට පමණයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක තමයි අප කියන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ අය, ඒ අයගේ ප්‍රශ්න දිසා අධිකරණයට ගිහිල්ලා බේරා ගනීවි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි මේ සම්බන්ධයෙන් Division එකක් ගනිමු කෝ. ඔබතුමා කියන දේ අපි පිළිගන්නේ නැහැ. නිකම් අපේ කාලය නාස්ති වෙනවා පමණයි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඡන්ද විමසීමක් අවශ්‍යද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
We ask for a Division.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා එයට විරුද්ධ වනවා නම් අපි ඒ වගන්තිය ඉවත් කරගෙන, ඉදිරි කටයුතු කරගෙන යන්න සූදානම්.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒ ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
එකඟයි.

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු සභාපතිතුමනි, ඒ වගන්තිය ඉවත් කර ගැනීම නිසා මගේ සංශෝධනය ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු සජින් ද වාස් ගුණවර්ධන මන්ත්‍රීතුමා, සංශෝධනය ඉදිරිපත් කරනවාද?

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු සභාපතිතුමනි, එම සංශෝධනය ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ නැහැ.

***24වන වගන්තිය පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.***
*24ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 24 ordered to be left out of the Bill.*

## 25 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)
## வாசகம் 25.- (அரசியலமைப்பின் 103ஆம் உறுப்புரையைத் திருத்துதல்)
CLAUSE 25. - *(Amendment of Article 103 of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"38 වන පිටුවේ, 33 වන පේළිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'සාමාජිකයකුට කොමිෂන් සභාවට අදාළ ඔහුගේ' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***25 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*25ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 25, as amended, ordered to stand part of the Bill.*

## 26 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)
## வாசகம் 26.- (அரசியலமைப்பின் 104ஆ என்னும் உறுப்புரையைத் திருத்துதல்)
CLAUSE 26.- *(Amendment of Article 104B of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"40 වන පිටුවේ, (1) 10 වන පේළියේ සිට 14 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'කොමිෂන් සභාවට ඇත්තේය. ;

(2) 15 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'(ආ) (අ) ඡේදය යටතේ, අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ' ;

(3) 20 වන පේළියේ සිට 23 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙකද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කළ යුතුය:

'යටත් ගුවන් විදුලි හෝ රූපවාහිනී ව්‍යවසායක ප්‍රධාන විධායක නිලධරයා වෙත නිකුත් කරනු ලැබූ උපමාන' ;

(4) '26 වන පේළියේ සිට 36 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතු ය.' ";

" 41 වන පිටුවේ, (1) 1 වන පේළියේ සිට 25 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතු ය.

(2) "26 වන පේළියේ සිට 35 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'(ඉ) (i) කොමිෂන් සභාව විසින්, අදාළ පරිදි, (4) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සහ (5) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් කරනු ලැබ ඇති විධාන සහ උපමාන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළ කරනු ලබන, පුළුල් සංසරණයක් ඇති, යටත් පිරිසෙයින් එක් දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක පළ කිරීමට වග බලා ගත යුත්තේ ය;

(ii) සෑම විධානයක් ම සහ උපමානයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එකී පළකිරීමේ දිනයේ දී හෝ එකී විධාන සහ උපමානවල නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනක දී හෝ ක්‍රියාත්මක විය යුත්තේ ය;

(iii) එකී සෑම විධානයක් ම සහ උපමානයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ අනුමතය නොලබන යම් විධාන හෝ උපමාන ඒවා යටතේ පූර්වයේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එකී අනනුමතයේ දින සිට අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය.' " ;

"42 වන පිටුවේ, 1 වන පේළියේ සිට 12 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙකද ඇතුළුව) ඉවත් කළ යුතු ය."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳයි. 27 වන වගන්තිය. සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේකට ගරු ඇමතිතුමා එකඟ වුණා. මෙහි සඳහන් වෙන්නේ, ජනමාධ්‍ය ආයතනයක් මැතිවරණ කාලයේදී එක පක්ෂයකට හෝ එක අපේක්ෂකයෙකුට පක්ෂපාතිත්වය ප්‍රකාශ කළොත් ඔහු සියලු නීතිවලින් ඉවත් වෙනවා කියන එකයි. එතකොට එය සාධාරණ මැතිවරණයක් නොවෙයි. ඒ කියන්නේ, එක අපේක්ෂයෙකු හෝ එක පක්ෂයකට පමණයි, ඒ ජනමාධ්‍ය ආයතනය වැඩ කරන්නේ. මේ වගන්තිය ඉවත් කරන්න කියායි මම ඉල්ලන්නේ. දැන් ඒ සඳහා එකඟ වුණා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
කරුණාකර, එම වගන්තියේ අංකය නැවත කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
26 වන වගන්තිය.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමනි, නීතිපතිතුමා උපදෙස් දීලා තිබෙනවා, ඒ සඳහා ජනමත විචාරණයක් සිදු කළ යුතුයි කියා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම ඉල්ලන්නේ ඉවත් කරන්න කියායි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ජනමත විචාරණයක් ඕනෑය කියා නීතිපතිතුමා උපදෙස් දීලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි propose කරන්නේ නැහැ. අපි කියන්නේ ඉවත් කරන්න කියායි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කියන්නේ එය ඉවත් කරන්න කියායි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක ඉවත් කරනවා කියා කිව්වා. ඒකයි මම ඒ ගැන අහන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර මට එම වගන්තිය සහ පිටුව කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
If it was removed, the Hon. Minister should know that.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
I do not know which paragraph you are referring to.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
26.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
27.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
No, Clause 26 (6). The last paragraph of Clause 26.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක කලින් ඉවත් කර තිබෙනවා.

***26 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*26ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 26, as amended, ordered to stand part of the Bill.*

***27 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*27ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 27, ordered to stand part of the Bill.*

## 28 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අලුත් 104උඋ ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.)

வாசகம் 28.- (அரசியலமைப்பில் 104எஎ என்னும் புதிய உறுப்புரையை உட்புகுத்துதல்.)

CLAUSE 28.- *(Insertion of new Article $104_{GG}$ in the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "43 වන පිටුවේ, 7 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

'104 උඋ. යම් රජයේ නිලධරයකු, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති යම් වෙළඳ ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරයක සේවා නියුක්තිකයකු සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියා පදිංචි වී ඇති හෝ ලියා පදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන යම් සමාගමක් වරදකට වරදකරු වන අතර' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

28 වන වගන්තිය. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා සංශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

I am not moving it.

***28 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*28 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 28, as amended, ordered to stand part of the Bill.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

29 වන වගන්තිය. ගරු ඩග්ලස් දේවානන්ද මහතා.

## 29 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)
## வாசகம் 29.- (அரசியலமைப்பின் 107ஆம் உறுப்புரையைத் திருத்துதல்.)
CLAUSE 29.- *(Amendment of Article 107 of the Constitution.)*

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

Sir, I move,

"In page 38, line 33, at end of paragraph (1) insert:

'and the President in appointing the Judge of the Supreme Court and Court of Appeal shall ensure that at least two Tamils and two Muslims are amongst the sitting Judges of the Supreme Court and Court of Appeal.' "

Sir, this amendment is brought in view of the practical difficulties encountered by Judges of the Supreme Court and the Court of Appeal in dealing with the appeals coming from the Northern and the Eastern Provinces where the language of court record is Tamil.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Hon. Chairman, even under the 1978 Constitution and throughout, this pluralistic nature had been taken into consideration. Even at present, our Chief Justice is from the Northern Province. As a matter of principle, no Constitution can include persons of this nature by their race or ethnicity. There is no decent system in incorporating such proposal in statutes. I do not think we should accept that. It is already ensured.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

Hon. Minister, there are practical difficulties.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

It maybe so but that has been ensured and now there is no such issue. To get an administrative relief, we can always discuss and agree.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

එය පිළිගන්නේ නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු සභාපතිතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මෙයයි. උතුරු - නැඟෙනහිර පළාත්වලින් එන නඩු පොත් කියවා ඒවා පරිවර්තනය කර ඉන් පසුව නඩු විභාගවලට ගැනීමේදී සුප්‍රීම් උසාවියේ ඇති වෙන්නා වූ විශාල ප්‍රමාදය වළක්වන්න තමයි, ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා මේ යෝජනාව කරන්නේ.

එහෙම නැතුව ජන වාර්ගික පදනමකින් නොවෙයි එතුමා මේ යෝජනාව ගෙනෙන්නේ. එම නිසා මෙවැනි දෙයක් සහතික කරන්න පුළුවන්ද? දෙමළ කථා කරන විනිශ්චයකාරවරුන් අවම වශයෙන් හතරදෙනකුවත් -

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Hon. Member, that has been there throughout because - [*Interruption*]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු අගමැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

If you are having a problem about the translations, we will look into that. ඒ ප්‍රශ්නයයි විසඳන්න තිබෙන්නේ. මේ යෝජනාවට නම් අපට එකඟ වන්න බැහැ. We cannot agree to this. We cannot include that in the Constitution. At the moment, we are trying to be Sri Lankans but you are trying to push it apart by dividing into groups. Kindly stop that. Hon. Member, listen to me and kindly withdraw that. This is a plea that I make.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

භාෂා ප්‍රශ්නයක් මැදිහත් වන නිසායි, මා මේ සම්බන්ධයෙන් කථා කරන්නේ. කැනඩාවේ සුප්‍රිම් උසාවියට විනිශ්චයකාරවරයෙක් පත් කරනවා නම් එතුමා ප්‍රංශ භාෂාවත්, ඉංග්‍රීසි භාෂාවත් යන භාෂා දෙකම දැන ගත යුතුයි. මොකද, එහිදී ඒ භාෂා දෙකෙන්ම නඩු විභාග කිරීමේදී ඒ භාෂා පිළිබඳ දැනුම නොතිබුණොත්, එක් භාෂාවක් කථා කරන ජනතාවට වරදක් වනවාය කියන ප්‍රශ්නයක් මතු වන නිසායි. එම නිසා මේ සම්බන්ධයෙන් මොනවා හෝ විසඳුමක් කරන්න.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

හොඳයි. ඒ යෝජනාවට එකඟ වන්නේ නැහැ. එවැනි දේවල්වලට ප්‍රායෝගිකව කටයුතු කරන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අපි නඩු පොත් දෙමළට translate කරන්න වෙනම unit එකක් හදලායි තිබෙන්නේ.

***29 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*29ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 29, ordered to stand part of the Bill.*

***30 සිට 34 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*30ஆம் வாசகத்திலிருந்து 34ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 30 to 34 ordered to stand part of the Bill.*

## 35 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 124 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)

### வாசகம் 35.- (அரசியலமைப்பின் 124ஆம் உறுப்புரையைத் திருத்துதல்.)

CLAUSE 35.- *(Amendment of Article 124 of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"46 වන පිටුවේ, 4, 5 සහ 6 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:

'35. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 124 වැනි ව්‍යවස්ථාව, එහි "120 වැනි, 121 වැනි සහ 122 වැනි ව්‍යවස්ථාවල විධිවිධාන සලසා ඇති පරිදි" යන ඉලක්කම් සහ වචන වෙනුවට "120 වැනි සහ 121 වැනි ව්‍යවස්ථාවල' ;"

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***35 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*35ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 35, as amended, ordered to stand part of the Bill.*

## 36 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)

### வாசகம் 36.- (அரசியலமைப்பின் 129ஆம் உறுப்புரையைத் திருத்துதல்.)

CLAUSE 36.- *(Amendment of Article 129 of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"46 වන පිටුවේ, 9 වන පේළියේ සිට 15 වන පේළිය දක්වා වූ සියලු පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතු ය."

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***36 වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.***

*36ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்படவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 36, ordered to be left out of the Bill.*

## 37 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 134 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)

### வாசகம் 37.- (அரசியலமைப்பின் 134ஆம் உறுப்புரையைத் திருத்துதல்.)

CLAUSE 37. - *(Amendment of Article 134 of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"46 වන පිටුවේ, 16 සහ 17 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:

'37. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 134 වන ව්‍යවස්ථාව එහි "121 වැනි, 122 වැනි, 125 වැනි" යන ඉලක්කම් සහ වචන වෙනුවට "121 වැනි, 125 වැනි" යන වචන සහ ඉලක්කම්' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***37 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*37ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 37, as amended, ordered to stand part of the Bill.*

## 38 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)
## வாசகம் 38.- (அரசியலமைப்பின் 151ஆம் உறுப்புரையைத் திருத்துதல்.)
CLAUSE 38. - *(Amendment of Article 151 of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "46 වන පිටුවේ, 19 වන පේළියේ සිට 27 වන පේළිය දක්වා වූ සියලු පේළි ඉවත් කළ යුතු ය."
(2) "47 වන පිටුවේ, 1 වන පේළියේ සිට 3 වන පේළිය දක්වා ඒ පේළි දෙකද අඇතුළත්ව ඉවත් කළ යුතුය."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා, 38 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
38 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු වාසුදේව නානායක්කාර මහතා, 38 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I move,

"In page 41, line 13, at end add, 'the parliament shall be duly notified in such instances forthwith' ".

මා හිතන හැටියට ඉතාමත් කාලීන, ඒ වාගේම ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිවලට අනුකූල දෙයක් මා මේ කියන්නේ. ඒ කියන්නේ Contingency Fund එකෙන් ගත්තොත් එවැනි අවස්ථාවක ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කරන්න. අගමැතිතුමාගේ අවසරය ඇතිව මුදල් ඇමතිතුමා Contingency Fund එකෙන් වියදමක් කළොත් ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කරන්න කියායි කියන්නේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
නීතිපතිතුමා දැනුම් දීලා තිබෙනවා, ඒ සම්බන්ධයෙන් දැනටමත් 151 (3) අනුව්‍යවස්ථාවේ සඳහන් වෙලා තිබෙනවාය කියා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ. නැහැ, 151 (3)හි නැහැ. මා ළඟ තිබෙනවා, 151 (3) අනුව්‍යවස්ථාව.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
The proposed amendment is already included in Article 151 (3) of the Constitution.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
If it is already there, I do not need to propose it. But, if it is not there, include it.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
That is there.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
38වන වගන්තියට ගරු රාජීව විජේසිංහ මහතා සංශෝධන move කරනවාද?

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
නැහැ. ඒක වෙනස් කළා නේ. "Prime Minister" වෙනුවට "President" දැම්මා නේ.

***38 වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.***
*38ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்படவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 38, ordered to be left out of the Bill.*

## 39 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)
## வாசகம் 39.- (அரசியலமைப்பின் 153ஆம் உறுப்புரையைத் திருத்துதல்.)
CLAUSE 39.- *(Amendment of Article 153 of the Constitution)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"47 වන පිටුවේ, 10 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'විගණකාධිපතිවරයා සුදුසුකම් ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***39 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*39ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 39, as amended, ordered to stand part of the Bill.*

## 40 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ, 153ආ, 153ඇ, 153ඈ, 153ඉ, 155ඊ, 153උ සහ 153ඌ අලුත් ව්‍යවස්ථා ඇතුළත් කිරීම.)

### வாசகம் 40.- (அரசியலமைப்பில் 153அ, 153ஆ, 153இ, 153ஈ, 153உ, 153ஊ, 153எ மற்றும் 153ஏ என்னும் புதிய உறுப்புரைகளை உட்புகுத்துதல்)

CLAUSE 40.- *(Insertion of new Articles 153A, 153B,153C,153D,153E,153F,153G and 153H in the Constitution)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"48 වන පිටුවේ, - 5 සහ 6 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'(අ) නියෝජ්‍ය විගණකාධිපති හෝ නියෝජ්‍ය විගණකාධිපතිවරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධුරයක් උසුලන ලද විගණකාධිපති' ";

"49 වන පිටුවේ, (1) - 8 වන පේළියට පසුව පහත දැක්වෙන කොටස එකතු කළ යුතු ය :-

'එම දීමනාව ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර සභාපතිවරයාගේ හෝ සාමාජිකයන්ගේ ධුර කාලය තුළදී එය අඩු කරනු නොලැබිය යුතු ය.' ";

(2) - 30 සහ 31 වන පේළි ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'බලතල, කාර්ය සහ කර්තව්‍ය ද ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ යුත්තේ ය.' ";

"50 වන පිටුවේ, (1) - 5 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය.

'පහකිරීම්වලට අදාළ රීති ඒවාට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව සකස් කිරීම';

(2) - 10 වන පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම.';

(3) - 10 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කළ යුතු ය :-

'(3). (2) වන අනුව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය;

(4). එවැනි සෑම රීතියක්ම එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එම රීති මඟින් නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුත්තේ ය;

(5). එවැනි සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර එමඟින් පෙර කරන ලද කිසිවකට අගතියක් නොවිය යුත්තේ ය.'";

(4) - 20 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා වූ' ";

"51 වන පිටුවේ, 12 වන පේළියේ සිට 17 වන පේළිය දක්වා වූ (එකී පේළි දෙකද ඇතුළුව) සියලු පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:-

'153උ. කොමිෂන් සභාව විසින් තමන් සම්බන්ධයෙන් වූ යම් පත් කිරීමකට, උසස් කිරීමකට හෝ ස්ථාන මාරුවකට අදාළව කරන ලද යම් නියමයකින් හෝ විනය පිළිබඳ කාරණයක් මත හෝ සේවයෙන් පහ කිරීමක් මත කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු විසින් එයට විරුද්ධව 59' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***40 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*40ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 40, as amended, ordered to stand part of the Bill.*

## 41 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)

### வாசகம் 41.- (அரசியலமைப்பின் 154ஆம் உறுப்புரையைத் திருத்துதல்.)

CLAUSE 41.- *(Amendment of Article 154 of the Constitution)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"52 වන පිටුවේ, (1) 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ';

(2) 14 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා වූ සියලු පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේ ය.';

(3) 34 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කළ යුතු ය :-

'(4) එකී ව්‍යවස්ථාවේ (8)වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුව්‍යවස්ථාව ඇතුළත් කළ යුතුය:

(9). (8) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ විධිවිධාන, 153(1) ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන විගණකාධිපතිවරයාට අදාළ විය යුත්තේ ය.' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***41 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*41ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 41, as amended, ordered to stand part of the Bill.*

***42 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*42ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 42 ordered to stand part of the Bill.*

## 43 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)

## வாசகம் 43.- (அரசியலமைப்பின் 155அ என்னும் உறுப்புரையைத் திருத்துதல்.)

CLAUSE 43.- *(Amendment of Article 155A of the Constitution)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"53 වන පිටුවේ, (1) 21 වන පේළියේ සිට 23 වන පේළිය දක්වා වූ (එකී පේළි දෙක ද ඇතුළුව) සියලු පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'සාමාජිකයන් අතුරෙන් යටත් පිරිසෙයින් එක් සාමාජිකයෙක් නියෝජ්‍ය පොලිස්පතිවරයකු වශයෙන් හෝ ඊට ඉහළ ධූරයක් දැරූ, විශ්‍රාමලත් පොලිස් නිලධරයකු විය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව';"

"54 වන පිටුවේ, (2) 5 වන සහ 6 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව ජනාධිපතිවරයා විසින් හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය, සශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු සභාපතිතුමනි, මම සංශෝධන දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. එයින් දෙවන සංශෝධනය පිළිගත යුතුයයි කියා මා යෝජනා කරනවා.

ඒ සංශෝධනයේ තිබෙන්නේ 48වන වගන්තියේ, 18වන පේළියේ සිට 25වන පේළිය දක්වා වූ කොටස ඉවත් කරන්න කියලා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමියනි, නීතිපතිතුමා කියා තිබෙනවා, ඒ සංශෝධනය පැහැදිලි නැහැ කියා.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
නැහැ ගරු සභාපතිතුමනි, නීතිපතිතුමා ඒ ගැන කථා කළා. මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නය කියා මට උපදෙස් ලැබුණා. [බාධා කිරීමක්] ගරු සභාපතිතුමනි, මේ සංශෝධනයෙන් ඉදිරිපත් කර තිබෙන්නේ, "මේ ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ වැනි පරිච්ඡේදය යටතේ, පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවනු ලබන පරිදි සහ පිහිටුවනු ලබන විට එම පළාත් පොලිස් කොමිෂන් සභා වෙත පවරනු ලබන බලතල සහ කාර්ය හීන කිරීමක් කොමිෂන් සභාව විසින් නොකළ යුත්තේය" කියන කාරණයයි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමිය මේ ඉදිරිපත් කරන්නේ 43වන වගන්තිය පිළිබඳව සංශෝධනයද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
48වන වගන්තිය පිළිබඳවයි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
43වන වගන්තිය සම්බන්ධයෙන් සංශෝධනයක් ඉදිරිපත් කරනවාද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
43 වන වගන්තිය සම්බන්ධයෙන් මා සංශෝධනයක් ඉදිරිපත් කරන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳයි.

***43 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*43ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 43, as amended, ordered to stand part of the Bill.*

## 44 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ආ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම)

## வாசகம் 44.- (அரசியலமைப்பின் 155ஆ என்னும் உறுப்புரையைத் திருத்துதல்.)

CLAUSE 44. - *(Amendment of Article 155B of the Constitution)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"54 වන පිටුවේ, 22 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'සහභාගිවීමට ද පොලිස්පතිවරයාට හිමිකම ඇත්තේ ය. එකී රැස්වීම්වලදී ඡන්දය භාවිත කිරීමට ඔහුට හිමිකම නොමැත්තේ ය.' ";

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***44 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*44ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 44, as amended, ordered to stand part of the Bill.*

## 45 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඇ වගන්තිය සංශෝධනය කිරීම.)
### வாசகம் 45.- (அரசியலமைப்பின் 155இ உறுப்புரையைத் திருத்துதல்.)
CLAUSE 45.- *(Amendment of Article 155C of the Constitution)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"54 වන පිටුවේ, 26 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'ව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා ' ";

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***45 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*45ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 45, as amended, ordered to stand part of the Bill.*

## 46 වන වගන්තිය.- (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊ වගන්තිය සංශෝධනය කිරීම.)
### வாசகம் 46.- (அரசியலமைப்பின் 155ஊ ஆம் உறுப்புரையைத் திருத்துதல்)
CLAUSE 46. - *(Amendment of Article 155F of the Constitution)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

" 54 වන පිටුවේ, 33 සහ 34 වන පේළි ඉවත් කිරීමෙන් ' ";

"55 වන පිටුවේ, 1 වන සහ 2 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

' "හෝ යම් තීරණයකට" යන වචනවල සිට "එසේ බලපෑම් කරන හෝ කිරීමට තැත් කරන" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට " කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක හෝ මේ පරිච්ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් එසේ බලය පවරනු ලැබූ යම් පොලිස් නිලධරයකුගේ හෝ යම් තීරණයකට කෙලින්ම හෝ වක්‍රාකාරයෙන් තමා විසින් ම හෝවෙනත් තැනැත්තකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු සමඟ, කවර වුවද ආකාරයකින් බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට තැත් කරන හෝ අයුතු ලෙස මැදිහත් වන හෝ කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක සාමාජිකයකු වෙත හෝ එසේ බලය පවරන ලද යම් පොලිස් නිලධරයකු වෙත එසේ බලපෑම් කරන හෝ කිරීමට තැත් කරන' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**

(தவிசாளர் அவர்கள்)

(The Chairman)

ගරු රාජීව විජේසිංහ මහතා සංශෝධනයක් ඉදිරිපත් කිරීමට තිබෙනවා. ඉදිරිපත් කරනවා ද?

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**

(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)

(The Hon. (Prof.) Rajiva Wijesinha)

මා එය ඉදිරිපත් කරන්නේ නැහැ.[බාධා කිරීමක්]

***46 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*46 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 46, as amended, ordered to stand part of the Bill.*

**සභාපතිතුමා**

(தவிசாளர் அவர்கள்)

(The Chairman)

ඊළඟට 47 වන වගන්තිය. සංශෝධනයක් ඉදිරිපත් කිරීමට තිබෙනවා, ගරු රාජීව විජේසිංහ මහතා ඉදිරිපත් කරනවා ද? ගරු රාජීව විජේසිංහ මහතා.

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**

(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)

(The Hon. (Prof.) Rajiva Wijesinha)

මා එයත් ඉදිරිපත් කරන්නේ නැහැ.[බාධා කිරීමක්] හානියක් වෙන්නේ නැහැ. මක්නිසා ද? ජනතාවට complain කරන්න අයිතිය Constitution එකේ දැම්මොත් හොඳයි. මම දන්නවා, ඊට පස්සේ දාලා තිබෙන එකෙත් ඒක implicit. හැබැයි ඒ තියෙන එක ඉවත් කරන්නත් අවශ්‍ය නැහැයි කියායි මා හිතන්නේ. තියෙන එක ඒ විධියට තියන්න පුළුවන් නේද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඔව්, පුළුවන්.

***47 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*47ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 47 ordered to stand part of the Bill.*

## 48 වන වගන්තිය - (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ, 155ඌ, 155එ, 155ඒ, 155ඔ අලුත් ව්‍යවස්ථා අතුළත් කිරීම.)
வாசகம் 48.- (அரசியலமைப்பில் 155ஏ, 155ஏ, 155ஒ, 155ஓ மற்றும் 155ஔ என்னும் புதிய உறுப்புரைகளை உட்புகுத்துதல்.)
CLAUSE 48. - (*Insertion of new Articles 155G, 155H, 155J, 155K and 155L of the Constitution.*)

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"56 වන පිටුවේ, (1) - 4 සිට 6 දක්වා වන පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

"නීතිය මගින් සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් සහන සැලසීමේ දී පොලිස්පතිවරයාට වහාම එය විසින්";

(2) - 10 සිට 12 දක්වා වන පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

"(අ) තත්කාර්යය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ප්‍රතිපත්තියකට යටත්ව පොලිස් නිලධරයන් බඳවා ගැනීම, උසස් කිරීම සහ ස්ථාන මාරුකිරීම පිළිබඳව පටිපාටි සකස් කිරීම;";

58 වන පිටුවේ, 12 වන පේළියේ සිට 23 පේළිය දක්වා වූ (එකී පේළි දෙකද ඇතුළුව) සියලු පේළි ඉවත්කොට පහත සඳහන් කොටස ආදේශ කළ යුතු ය :-

"(2) පොලිස්පතිවරයා හෝ 155ඌ සහ 155එ ව්‍යවස්ථාවල සඳහන් කමිටුවක් හෝ පොලිස් නිලධරයකු හෝ විසින් තමාගේ යම් උසස් කිරීමක්, ස්ථාන මාරුවක් හෝ සේවයෙන් පහකිරීමක් සම්බන්ධයෙන් කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් පොලිස් නිලධරයකු විසින්, අභියාචනයක් කිරීම සහ අභියාචනයක් විභාග කිරීම සඳහා නියම කරනු ලැබ ඇති පටිපාටිද කාලය ද විධිමත් කරමින් කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීතිවලට අනුකූලව, එකී නියමයට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කරනු ලැබිය හැක්කේ ය.";

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු සජිත් ද වාස් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු සභාපතිතුමනි, මගේ සංශෝධන ඉදිරිපත් කරනවා:

"in page 49, line 6, leave out the words, 'disciplinary control' "

"in page 49, lines 11 and 12, leave out the words, 'in consultation with the Inspector-General of Police.' and insert:

'under advice from the Inspector-General of Police.' "

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒ යෝජනාව සුදුසු නැහැ කියලා තිබෙනවා නේද?

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු ඇමතිතුමනි,මම මේ කාරණය කියන්නේ මේ නිසායි. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ විනය පරීක්ෂණ පිළිබඳ පොලිස්පතිතුමාට තිබුණු බලය කොමිසමට දුන්නාම ඇති වෙන ප්‍රශ්නය තමයි, පොලිස්පතිතුමාට හරියාකාරව පොලිසියේ කටයුතු කර ගෙන යෑමේ ප්‍රශ්නයක් එන එක. මොකද, ලොකු කාල පරිච්ඡේදයක් යනවා කොමිසමට ගිහිල්ලා, ඒවා විමර්ශනය කරලා එන්න. ඒ නිසා විනය පිළිබඳ තිබෙන බලතල පොලිස්පතිතුමාටම දෙන්න කියන එක තමයි මම ඉල්ලා සිටින්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, එතැන මතු වෙන ප්‍රශ්නය වෙන්නේ, "on advice" කියලා දැම්මාම කොමිෂන් සභාව පොලිස්පතිතුමාගේ තනතුරට වඩා පහළින් ඉන්න වෙන එකයි.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ඒක මට පිළිගන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. නමුත් මම ඉල්ලන්නේ විනයානුකූල කාරණාවකදී පොලිස්පතිතුමාට ඒ බලය දෙන්න කියන එකයි. මෙතැන තිබෙනවා, "The appointment, promotion, transfer, disciplinary control" කියලා. Disciplinary control තිබෙන්න අරින්න පොලිස්පතිතුමා යටතේ. Disciplinary control, disciplinary action එකක් ගන්න තිබෙන බලය පොලිස්පතිතුමා යටතේ තිබෙන්න අරින්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
තනි නිලධාරියෙකු යටතේ ඒ බලය තිබෙන කොට ඒ පිළිබඳව ලොකු ප්‍රශ්න තිබෙන නිසා තමයි ස්වාධීන කොමිසමකට පවරන්නේ.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු ඇමතිතුමනි, එහි තිබෙන ගැටලුව අපි දැක්කා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ එවැනි කාරණයකදී පොලිස්පතිතුමා සහ පොලිසිය කොච්චර අක්‍රිය වුණාද කියන කාරණය අපි දැක්කා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
පොලිස්පතිතුමාගෙන් අසාධාරණයක් වුණොත් කොමිසමට appeal කරන්න පුළුවන්.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
අසාධාරණයක් වුණොත් appeal කරන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Appeal කරන්න පුළුවන්. පොලිස්පතිවරයා විමසලා තමයි ඒ ගොල්ලන් තීන්දු ගන්නේ.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
පොලිස්පතිතුමාට බලය දෙන්නේ-

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක delegate කරනවා, කොමිසමට.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු ඇමතිතුමනි, පොලිස්පතිතුමාට බලය තිබෙන්න ඕනෑ විනයානුකූලව පියවරක් ගන්න. එහිදී වරදක් වුණා කියලා හිතනවා නම් කොමිසමට අභියාචනයක් කරන්න ඉඩ දෙන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අභියාචනා කරන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු සභාපතිතුමනි, පොලිස්පතිතුමා එක්ක සාකච්ඡා කරලායි මේ යෝජනාව ගෙනාවේ. එතුමා මේකට එකඟයි.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ඔබතුමන්ලා ඒ සංශෝධනයට එකඟ නැත්නම් බෙදීමක් ඉල්ලනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඇමතිතුමා මොකක්ද කියන්නේ?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, අපි සංශෝධනය ඉදිරිපත් කරලා තිබෙනවා. පක්ෂ නායකතුමන්ලා මේ සංශෝධනයට විරුද්ධ වෙලා නැහැ. අදාළ නිලධාරීන් සියලු දෙනා එක්ක සාකච්ඡා කරලා -පොලිස්පතිතුමා, අමාත්‍යාංශ ලේකම්ලා- ඒ අයත් එකඟ වෙන ක්‍රමවේදයක් තමයි මේ හදලා තිබෙන්නේ.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
මගේ යෝජනාවට එකඟතාවක් නැත්නම් බෙදීමකට යන්න වෙනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
විපක්ෂ නායකතුමා එක්ක අපි මේ ගැන සාකච්ඡා කළා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
අපි එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. අපි ඔක්කෝම ඔබතුමාගේ පක්ෂයේ නායකතුමා එක්ක එකඟතාවකට ආවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක.

ගරු සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා එක්ක අපි මේ කාරණය සාකච්ඡා කළා. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
අපි සාකච්ඡා කරලා එකඟ වුණු එකක්. ගරු මන්ත්‍රීතුමාට හැර වෙන කාටවත් මේ ගැන කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අපි ඊළඟ එකට යමු, ගරු සභාපතිතුමනි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
සජිත් ද වාස් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ඒ සංශෝධනය පිළිගන්නේ නැහැ. [බාධා කිරීමක්] ඡන්දයක්?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඡන්දයක් අවශ්‍ය නැහැ. ඒක විපක්ෂ නායකතුමාත් එක්ක එකඟ වෙලා ගෙනාපු යෝජනාවක්. ඒ නිසා ඡන්දයක් ගන්නේ මොකටද? අපි ඔබතුමාගේ මතයට ගරු කරනවා. ඔබතුමා මේ ක්‍රමවේදයට ගරු කරන්න. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මේ සාකච්ඡාවලට විපක්ෂ නායකතුමා එහෙම සම්බන්ධ වුණා නම් එතුමන්ලාගෙන් මේ ගැන අහලා බලමු.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු සභාපතිතුමනි, කලින් අපට තිබුණු අත්දැකීම් අනුව, සජිත් ද වාස් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ සැකය තිබෙන්නේ පොලිස් කොමිසමට විනයානුකූල බලතල දීම පිළිබඳව නොවෙයි. ඒ තුළින් පොලිස්පතිවරයාගේ ක්‍රියාදාමය සම්පූර්ණයෙන් නැවැත්වූවාම, පොලිස් නිලධාරියෙකු පිළිබඳ විනය ක්‍රියාමාර්ගයක් ගන්න පොලිස් අධිකාරිවරයෙකුට සහ සහකාර පොලිස් අධිකාරිවරයෙකුට හැකි වන්නේ නැති එක ගැනයි එතුමා කියන්නේ. එවැනි අවස්ථාවල මේ සේවාව පවත්වාගෙන යන්න බැහැ. දෙපාර්තමේන්තුවක් හැටියට සැලකුවත් මෙය දෙපාර්තමේන්තුවක් නොවෙයි. මේ දෙපාර්තමේන්තුවේ කාර්යය වෙනස් කාර්යයක්. මෙහි අවුරුදු දෙසීයක විතර ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය එක් වරම ඉවත් කිරීම හරහා ඇති වන තත්ත්වය පිළිබඳව තමයි එතුමා කියන්නේ. ඒකට යම් ක්‍රමවේදයක් නිර්මාණය කරලා දුන්නොත් මේ ගැටලුව විසඳා

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

ගන්න පුළුවන්. එහෙනම් අඩු ගණනේ කොමිෂන් සභාවට ඉඩ දෙන්න ඕනෑ, මේ බලය පොලිස්පතිතුමාට පවරන්න; delegate කරන්න. Delegation එකේදී තීන්දුවක් වැරදුණා නම්, ඒ කටයුත්ත කරන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Delegate කිරීමේ බලය තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. අවශ්‍ය රෙගුලාසි හදන්න විතරයි තිබෙන්නේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

කොමිෂන් සභාව කිසිම අවස්ථාවක අත්‍යවශ්‍ය බලතල පහළට දෙන්නේ නැහැ. ඒ කොමිෂන් සභා නිලධාරින්ගේ තිබෙන ස්වභාවයන් අපි පසු ගිය කාලයේදී දැක්කා. ඒවා දැක්ක නිසා තමයි සජින් ද වාස් ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ සංශෝධන ගෙනෙන්නේ. ඒ නිසා ඒකට ක්‍රමවේදයක් හදලා දෙන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ක්‍රමවේදයක් හදන්න කියලා මෙමඟින්ම නියම කරලා තිබෙනවා; Regulations හදන්න කියලා නියම කරලා තිබෙනවා. රෙගුලාසියට අනුකූලව විතරයි කටයුතු කරන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Otherwise, the Minister can interfere. Let the Commission be a buffer. I mean, it is protecting the IGP.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒක delegate කරනවා. ඒ සඳහා ක්‍රමවේදයක් එනවා. ඒ දෙකම මේ සංශෝධනයේ තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

එතැන ප්‍රශ්නයක් නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අභියාචනා බලයත් තිබෙනවා. ඒ කාරණා තුනම මෙහි තිබෙනවා.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

ගරු අගමැතිතුමනි, ඔබතුමාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියෝජිතයෙකු හැටියට හිටියා. මම හිතන හැටියට ඔබතුමාටත් ඒ ගැන අත්දැකීම් තිබෙනවා, සමහර අවස්ථාවලදී පොලිස්පතිතුමා කොච්චර අපහසුතාවකට පත් වුණාද කියන කාරණය සම්බන්ධයෙන්. ඒ ගැන මම දන්නවා. මොකද, මහින්ද රාජපක්ෂ මැතිතුමා විපක්ෂ නායක හැටියටත්, අග්‍රාමාත්‍යතුමා හැටියටත් හිටපු කාලයේ මම එතුමාගේ සම්බන්ධීකරණ ලේකම් හැටියට මේ වැඩ කටයුතුවලට සම්බන්ධ වුණා. ඒ අත්දැකීම් නිසා තමයි මම මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

අපට පොලීසිය ගැන හුඟක් අත්දැකීම් තිබෙනවා. ඒ ගැන අපි මෙතැනදී කථා කරන්න යන්නේ නැහැ. නමුත් එක කාරණයක් මම කියන්න කැමැතියි. මේක පොලිස්පතිතුමා එක්ක කථා කරලා ගත්ත පියවරක්. මමත් එදා එතැන හිටියා. නමුත් පොලීසිය මට එහෙම කිව්වේ නැහැ. ඒ වෙලාවේ හිටපු පොලිස්පතිවරු එහෙම කිව්වේත් නැහැ. ඊට පස්සේ ආපු අය කිව්වා, "අපේ බලය නැති වුණා" කියලා. ඒගොල්ලන් මේ බලතල පාවිච්චි කළේ කොහොමද කියලා මම මේ අවස්ථාවේදී කියන්න යන්නේ නැහැ. නමුත් ඒ වෙලාවේ හිටපු පොලිස්පති ආනන්ද රාජා මහත්මයා එහෙම ඒ ගැන මොකුත් කිව්වේ නැහැ. ඒ පොලිස්පතිවරුන්ට ප්‍රශ්නයක් තිබුණේ නැහැ. දැන් ඉන්න පොලිස්පතිතුමාටත් ප්‍රශ්නයක් නැහැ. අපි පොලීසිය ස්වාධීනව තබා ගනිමු.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

ගරු අග්‍රාමාත්‍යතුමනි, පොලිස්පතිවරු ගැන නොවෙයි, ප්‍රතිපත්තියක් වශයෙන් අපි මේ ගැන බලමු.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු මන්ත්‍රීතුමා, අපි මේ කාරණා ගැන බලලා තමයි මේ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙන්නේ. පක්ෂ ඔක්කෝම එකතු වෙලා මේ තීරණ අරගෙන තිබෙන්නේ. ඔබතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක කටයුතු කරපු හැටි අමතක කරලා දැන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මොකක්ද කරන්නේ කියලා බලන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, අපි ඒ සංශෝධනයට ඒ විධියට එකඟ වෙමු. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන බය වෙන්න එපා. අපි මේ ව්‍යවස්ථාවට සංශෝධන ඉදිරිපත් කිරීම අවසන් කරලා ඊළඟ වගන්තියට යමු. [බාධා කිරීම්]බය වෙන්න එපා, මේ මම ඉන්න මේ රාජපක්ෂ එක්ක, විජයදාස රාජපක්ෂ එක්ක වැඩ කරන්න කියන්න.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමා, මේකේ precautions තිබෙනවා. Precautions අරගෙන තිබෙන්නේ. Regulations හදන්න ඕනෑ.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

මේක හදිසි දෙයක් නොවෙයිනේ. එහෙම නම් ක්‍රමවේදයක් හදන්න, මේ වගන්තිය තුළ කොතැනක හෝ මේ වගන්තිය පරිබාහිරව හෝ පොලිස් කොමිසම විසින් යම්කිසි බලතල ප්‍රමාණයක් පොලිස්පතිතුමාට පවරනවා කියලා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒක අනිවාර්යයෙන්ම තිබෙනවා. Delegation power එක අනිවාර්යයෙන්ම තිබෙනවා.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

එහෙම කියලා නැහැ නේ, ගරු ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැනටමත් delegation powers තිබෙනවා.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

Hon. Minister, I do understand the concept of delegation of power, but then, it must be specific here. All I am requesting is that. Hon. Prime Minister, you would understand that I am only requesting for specifics. Can we include that?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

That is already there.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව Head of the Departmentගේ බලයත් delegate කරන්න තිබෙනවා. Commission එකේ බලතල delegate කරන්න පුළුවන්. හැබැයි ඒකට ක්‍රමවේදයක් හදන්න ඕනෑ. ඒකට තමයි rules හදන්න තිබෙන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු මන්ත්‍රීතුමනි, අපි සියලු දෙනාම එකඟයි, මේ සංශෝධනයට. මේක ප්‍රශ්නයක් නොවෙයි, මේ ගරු සභාවට. We all have agreed. There is no problem on this.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අපි regulations හදනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා කියපු දේ ඔබතුමාට පැහැදිලිද? මම හිතන විධියට එය සියලු දෙනාම එකඟ වූ දෙයක්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන කාරණය මට තේරෙනවා. මේ සම්බන්ධව යම් කිසි නිශ්චිත ක්‍රමවේදයකට කරන්න ඕනෑ. ඒ සඳහා රෙගුලාසි හදන්න ඕනෑ. ඒ රෙගුලාසි හැදිය යුතුයි කියලා මේ වගන්තියේ තිබෙනවා. සංශෝධනය සම්මත වුණාට පස්සේ අපි ඒ රෙගුලාසි හදන්න ඕනෑ.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

ගරු ඇමතිතුමනි, ඒ කියන්නේ අද තිබෙන මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ එය ක්‍රියාත්මක වන්නේ නැහැ කියලාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

රෙගුලාසි හැදුවාට පස්සේ තමයි ක්‍රියාත්මක වෙන්නේ.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

ගරු ඇමතිතුමනි, මාගේ point එක ඒක නොවෙයි. ඊයේ දිනය සහ අද දිනය තුළ පොලිස්පතිතුමා ඒ විනයානුකූල පියවර ගන්නේ නැද්ද ?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒක දැනට තිබෙන නීතිය යටතේ තිබෙනවා.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

ඉතින් එහෙම නම් ඒකේ තිබෙන වැරැද්ද මොකක්ද? ඉදිරියේදී ඒක වෙනස් කරන්න තිබෙන අවශ්‍යතාව මොකක්ද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අවශ්‍යතාව, මේක ස්වාධීන කොමිෂන් සභාවක් යටතට ගෙන ඒමයි, ඒ සඳහා විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක් හැදීමයි.

**ගරු සජිත් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

ඒ කියන්නේ පොලීසියේ විනයානුකූල ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් දැනට විනිවිදභාවයක් නැහැ කියන එකද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ඒ කියන්නේ මේ දහනව වන සංශෝධනය සම්මත වුණාට පස්සේ ජනාධිපතිවරයාටයි, අගමැතිවරයාටයි පොලිස්පතිතුමාට කියන්න බැහැ,"මේ දෙය කරන්න" කියලා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, එහෙම නැත්නම් පොලීසිය භාර ඇමතිතුමාට තනිකර පොලීසිය පාලනය කරන්න පුළුවන් වෙනවා. එතකොට ඔබතුමන්ලා අපේ ජෝන් අමරතුංග ඇමතිතුමාට කෑ ගහාවි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු සභාපතිතුමනි, "48 වන වගන්තිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. (1) (අ) අනු ව්‍යවස්ථාවට පසුව යෙදෙන (ආ) අනුව්‍යවස්ථාව ඉවත් කළ යුතුයි" කියලා මා යෝජනා කරනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මෙම සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනය යටතේ තිබෙන ඒ ව්‍යවස්ථාවට ගැලපෙන විධියට මෙය සකස් කිරීම නීතිමය අවශ්‍යතාවක් නිසා. මොකද, එහෙම නැත්නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයත් සමඟ මේ සංශෝධනය ගැටෙනවා. එහෙම වුණොත් මේ සංශෝධනය සම්මත කර ගැනීමේදී අපට ගැටලුවක් මතු වෙනවා, පළාත් සභා බලය එක්ක. එහෙම වුණානම් සමහර විට ශ්‍රේෂ්ඨාධිකරණය මෙයට ඉඩ නොදෙන්නත් තිබුණා. ව්‍යවස්ථාවට අනුකූල වෙන්න ඕනෑ නිසා තමයි මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ. ඔබතුමිය කියන විධියට මේ මඟින් සිදු වන හානිය මොකක්ද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මේ වන විටත් පිහිටුවලා නැති පළාත් කොමිෂන් සභාවක් ගැන තමයි මේ සංශෝධනයෙන් කථා කරන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එතකොට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණා කියලා ඔබතුමිය පිළිගන්නවාද?

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණාට පළාත් කොමිෂන් සභා පිහිටුවලා නැහැ කියලා ඔබතුමා පිළිගන්නවාද?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
තවමත් පිහිටුවලා නැති කොමිෂන් සභා තිබෙනවා. ඒ වුණාට ඒක තමයි රටේ නීතිය. ගරු මන්ත්‍රීතුමියනි, ඒක තමයි මේ රටේ නීතිය.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
පිහිටුවලා නැති ආයතනයක් ගැන කථා කරන්නේ ඇයි?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඉතින් අද මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණත්, ඒ ආයතන එකක්වත් අද පිහිටුවන්නේ නැහැ. ඒවා පිහිටුවන්න තව මාසයක් දෙකක් ගත වෙනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන කාරණයක් ගැන නේද මේ කියන්නේ?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක නීතියේ තිබෙන දෙයක්.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ඒ නිසා මේ අනු ව්‍යවස්ථාව ඉවත් කරන්න කියලා මම යෝජනා කරනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
එය දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන දෙයක්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මෙය නීතියේ තිබෙන දෙයක්. ඒකේ කිසි වෙනසක් කරන්න ඕනෑ නැහැ.

***48 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*48ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 48 , as amended, ordered to stand part of the Bill.*

***49 සහ 50 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*49ஆம் 50ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 49 and 50 ordered to stand part of the Bill.*

## 51 වන වගන්තිය. - (XIXඅ සහ XIXආ අලුත් පරිච්ඡේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අතුළත් කිරීම.)
### வாசகம் 51.- (அரசியலமைப்பில் புதிய அத்தியாயங்கள் XIXஅ மற்றும் XIXஆ என்பனவற்றை உட்புகுத்துதல்)
Clause 51.- (*Insertion of new Chapter XIXA and XIXB in the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"63 වන පිටුවේ, (1) - 15 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

'සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරනු ලැබීම' ;

(2) - 18 සහ 19 වන පේළි ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

'යුත් පටිපාටි සහ උපමාන සකස් කිරීම කොමිෂන් සභාවේ කර්තව්‍ය වන්නේ ය. කොමිෂන් සභාව විසින් එකී උපමාන ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලසිය යුතු අතර එකී පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීමට සැලසිය යුත්තේ ය.';

(3) - 23 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය, පූර්වයේ අනුමත';

(4) - 29 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

'රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති'

64 වන පිටුවේ, (1) - 1 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

"(ඇ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති"

(2) - 8 සහ 9 වන පේළි ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'(ඇ) රජයේ ආයතන විසින් කරනු ලබන ප්‍රතිසම්පාදනයන්ට' ";

"67 වන පිටුවේ, 29 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'ආයතනයක් හෝ විසින් සියයට පනහකට වැඩි' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**

(தவிசாளர் அவர்கள்)

(The Chairman)

ගරු ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමා, සංශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**

(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)

(The Hon. Douglas Devananda)

Sir, I move,

"In page 54, immediately after line 35, insert:

'Chapter XIXC

The Commission for Ethnic and Religious Harmony' ".

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, ඒ අදහස හොඳයි. එම කාර්ය සාධක කටයුතු සඳහා දැනටමත් කොමිසමක් පත් කරලා ඒ කටයුතු කෙරීගෙන යනවා. අපි ඊළඟ ව්‍යවස්ථාවට ඒ කරුණු ඇතුළත් කරමු. LLRC එකේ වාර්තාවත් අරගෙන ඒ සියල්ලම සැලකිල්ලට භාජන කරමු ගරු මන්ත්‍රීතුමා.

***51 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*51ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 51, as amended, ordered to stand part of the Bill.*

## 52 වන වගන්තිය.- (170 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.)

## வாசகம் 52.- (அரசியலமைப்பின் 170ஆம் உறுப்புரையை திருத்துதல்)

CLAUSE 52.- *(Amendment of Article 170 of the Constitution.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"69 වන පිටුවේ, 8 වන පේළියේ සිට 12 වන පේළිය දක්වා වූ සියලු පේළි ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'(ඩ) පාර්ලිමේන්තු මහලේකම්වරයා;
(ණ) පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;
(ත) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;
(ද) රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්; සහ';

69 වන පිටුවේ, 8 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය :-

(ණ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;
(ත) රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***52 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*52ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 52, as amended, ordered to stand part of the Bill.*

**සභාපතිතුමා**

(தவிசாளர் அவர்கள்)

(The Chairman)

ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා.

**ගරු මන්ත්‍රීවරයෙක්**

(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)

(An Hon. Member)

අයියෝ!

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**

(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)

(The Hon. (Prof.) Rajiva Wijesinha)

'අයියෝ' කියන්නේ නැතුව මේක අහලා ඉන්න. [බාධා කිරීම්]

**සභාපතිතුමා**

(தவிசாளர் அவர்கள்)

(The Chairman)

ඔබතුමාගේ සංශෝධනය කියවන්න.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**

(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)

(The Hon. (Prof.) Rajiva Wijesinha)

මේ සංශෝධන යටතේ UGC එකයි, Official Languages Commission එකයි අපි ස්වාධීන කොමිෂන් සභාවලින් ඉවත්

[ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා]

කරලා තිබෙනවා. එම ආයතන මේ කොමිෂන් එක තුළ තිබෙන එකේ තේරුමක් නැහැ. They should be considered as Public servants.

අනෙක් කරුණ, Auditor-General මේ කොමිෂන් එකෙන් අයින් කරලා තිබෙනවා. The Auditor-General should not be considered a Public servant. I think it has been put accidently. I cannot imagine that it was intentional. The Auditor-General has never been considered a Public servant; please put him back there.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Auditor-General Public servant කෙනෙක් කියලා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැනටමත් තිබෙනවා. මට ඒක පෙන්වන්න පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153වැනි ව්‍යවස්ථාවේ තමයි Auditor-General පිළිබඳව තිබෙන්නේ. "විගණකාධිපතිවරයෙක් වන්නේ ය" යනුවෙන් සඳහන් කර තිබෙන අතර, විගණකාධිපතිවරයා පත් කළ හැකි ආකාරය ඇතුළු සියලු විස්තර එහි තිබෙනවා. ඒ අනුව මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් "රජයේ සේවකයා" යන්නට මෙහි සඳහන් සියලු නිලධාරින් අයත් බවට අර්ථ නිරූපණය කරලා තිබෙනවා.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
හැබැයි, ඉස්සෙල්ලා ඔය කියන කරුණ ගැසට් කරන කොට Auditor-General මේකට ඇතුළු කළා. ඒක දැනගෙන හිටියා නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
නැහැ, ඒක අවශ්‍ය නැහැ. මොකද, ඒක ව්‍යවස්ථාවේ දැනට තිබෙන ප්‍රතිපාදනයක්. අපි ඒක repeat කරන්න ඕනෑ නැහැ.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
නැහැ, නැහැ. මේ ගැසට් ඒකේ සඳහන් කර තිබුණාද? The Auditor-General shall not be considered a Public servant.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
වැරදිලා ඇතුළත් වෙලා තිබුණාද දන්නේ නැහැ. නමුත් දැන් එහෙම අවශ්‍යතාවක් නැහැ.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
වැරදිලා? එහෙම නම් කියන්න "වැරදිලා" කියලා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඔහු රජයේ නිලධාරියෙක්. අල්ලස් පනත යටතේ ඔහු රජයේ නිලධාරියෙක්. Consolidated Fund එකෙන් සල්ලි ගෙවන්නේ. ඉතින් කොහොමද රජයේ නිලධාරියෙක් නොවෙන්නේ?

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
ඉතින් Secretary-General of Parliament තනතුරත් එහෙමයි නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
නමුත් ඔබතුමා මේ කාරණයයි, ඒ කාරණයයි "රජයේ නිලධාරියෙක්" කියන කාරණයට ඇතුළු කරන්න උත්සාහ දරන්න එපා. [බාධා කිරීමක්]

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)
UGC එකයි, Official Languages Commission එකයි මේකෙන් අයින් කරන්න.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳයි. ගරු ඇමතිතුමා පිළිගන්නවාද? [බාධා කිරීමක්] පිළිගන්නේ නැතිලු.

***53 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*53ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 53, ordered to stand part of the Bill.*

## 54 වන වගන්තිය.- (අන්තර්කාලීන විධිවිධාන)
### வாசகம் 54.- (நிலைபெயர்கால ஏற்பாடுகள்)

CLAUSE 54.- (*Transitional Provisions)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"70 වන පිටුවේ, 18 සහ 19 වන පේළි ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :-

'කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වරයා;

(x) පාර්ලිමේන්තු මහ ලේකම්වරයා;

(xi) මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු; හෝ

(xii) අධිකරණ නිලධරයකු, උපලේඛනගත රජයේ නිලධරයකු, රජයේ නිලධරයකු හෝ පොලිස් නිලධරයකු;' ;

"71 වන පිටුවේ, (1) 6 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

(ඇ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ';

(2) 12 සහ 13 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'තැනැත්තකු මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ධුර දැරීම අවසන් කළ යුත්තේය:

එසේ වුවද මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ දී ඉහත සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු හෝ වශයෙන් ධුර දරන සෑම තැනැත්තකුම එකී අදාළ කොමිෂන් සභා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ 22VIIඅ පරිච්ඡේදයට අනුකූලව ස්ථාපිත කරනු ලබන දිනය තෙක් තම අදාළ ධුරවල බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම දිගටම කරගෙන යනු ලැබිය යුත්තේය.' "

(3) 30 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය:

'නඩු කටයුතු මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කරනු ලැබූ දින සිට බලපැවැත්වෙන පරිදි එකී සභාව විසින්';

" 72 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය :

'රීති නියමයක් මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කරනු ලැබූ දින සිට බලපැවැත්වෙන පරිදි එකී සභාව විසින්' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***54 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*54ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 54 , as amended, ordered to stand part of the Bill.*

## 55 වන වගන්තිය.- (ඇතැම් ව්‍යවස්ථා බලාත්මක භාවයට පත්වන දිනයේ දී ආරම්භ වන කාල පරිච්ඡේදයට අදාළ වන විශේෂ විධිවිධාන)

### வாசகம் 55.- (குறித்த உறுப்புரைகள் நடைமுறைக்கு வருகின்ற தேதியன்று தொடங்குகின்ற காலப்பகுதி தொடர்பிலான விசேட ஏற்பாடுகள்.)

CLAUSE 55.- (*Special provisions relating to the period commencing on the date on which certain Articles comes into force.)*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

" 73 වන පිටුවේ, (1) - 10 වන පේළියේ සිට 12 වන පේළිය දක්වා පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතු ය:

'මේ පනතේ 3, 4, 5, 6, 7, 9 (එමගින් ඇතුළත් කරන ලද 46 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව හැර) 15,17,18,19,21 සහ 35 වන වගන්තිවල විධිවිධාන';

(2) - '16 සහ 17 වන පේළි ඉවත් කළ යුතු ය.'

(3) - 22 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කළ යුතුය.

'(ඇ) 7 වන පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පෙරාතුවම වූ දිනයේ දී ක්‍රියා කළ අමාත්‍ය මණ්ඩලය එහි විසුරුවා හැරීම නොතකා දිගටම ක්‍රියා කළ යුතු අතර, මහ මැතිවරණය අවසාන වූ විට එසේ ක්‍රියා කිරීම නතර කළ යුත්තේ ය. ඒ අනුව අග්‍රාමාත්‍යවරයා ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෝ ද, වෙනත් අමාත්‍යවරයෝ ද, නියෝජ්‍ය අමාත්‍යවරයෝ ද ඔවුන් 46 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ හෝ 46 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ (අ) හෝ (ආ) ඡේදවල විධිවිධාන සලසා ඇති පරිදි ධුර දැරීම නතර වුවහොත් මිස දිගටම ක්‍රියා කරන්නාහ' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

**සභාපතිතුමා**

(தவிசாளர் அவர்கள்)

(The Chairman)

ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා.

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**

(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)

(The Hon. (Prof.) Rajiva Wijesinha)

ගරු සභාපතිතුමනි, මේ තිබෙන සංශෝධන නිසා අපේ ඒවා අනවශ්‍යයි කියා මා කල්පනා කරනවා.

***55 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*55ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 55, as amended, ordered to stand part of the Bill.*

## 56 වන වගන්තිය.- (ධුරයේ සිටින ජනාධිපතිවරයා ඇතැම් විෂයය සහ කර්තව්‍ය භාරව සිටීම.)

### வாசகம் 56.- (குறித்த சில விடயங்களுக்கும் பணிகளுக்கும் பதவியிலுள்ள சனாதிபதி பொறுப்பாதல் வேண்டும்.)

CLAUSE 56.- (*President in office to be in charge of certain subjects and functions*.)

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

" 73 වන පිටුවේ, (1) - 23 සිට 31 දක්වා පේළි (එකී පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ඇතුළත් කළ යුතු ය:

'56. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන් වුව ද මේ පනත ආරම්භ වන දිනයේ දී ජනාධිපතිවරයා ලෙස ධුර දරන තැනැත්තා එසේ ජනාධිපති ධුරය දරන තාක් කල්, රාජ්‍ය ආරක්ෂාව, මහවැලි සංවර්ධනය සහ පරිසරය යන විෂය සහ ඒවායේ කර්තව්‍ය තමන්ගේ භාරය වෙත පවරා ගැනීම ද එකී කාර්ය සඳහා ඔහු වෙත පවරා ගත යුතු අමාත්‍යාංශ තීරණය කරනු ලැබීම ද කළ හැකි අතර, ඒ අනුව එකී විෂය හෝ කර්තව්‍ය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාට යම් ලිඛිත නීතියක කරනු ලබන යම් සඳහනක්, ජනාධිපතිවරයාට කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුත්තේය' "

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

" 74 වන පිටුවේ, 1 සිට 12 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතු ය"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***56 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*56ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 56, as amended, ordered to stand part of the Bill.*

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු සභාපතිතුමනි, ඉදිරිපත් කරනු ලැබූ මෙම සංශෝධනයන්හි යතුරු ලියන දෝෂයක්, මුද්‍රණ දෝෂයක් ඉලක්කම් පිළිබඳ දෝෂයක් යනාදී වශයෙන් තාක්ෂණික දෝෂයක් පැවතියහොත් එය නිවැරැදි කර ගැනීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

කාරක සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තුන්වනවර කියවීම, ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That the Bill, as amended, be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදී.***
***කටහඬවල් අනුව " පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*வினா விடுக்கப்பட்டது.*
*குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று என சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.*

*Question put.*
*MR. SPEAKER, having collected the Voices, declared that the "Ayes" had it.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Divide, by name!

***පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට - පක්ෂව 212; විරුද්ධව 01; ඡන්දය නොදුන් 01; නොපැමිණි 10; යනුවෙන් බෙදුණේය.***

*பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 212; எதிராக 01; நடுநிலை 01; வராதோர் 10.*

*The Parliament divided : Ayes 212 ; Noes 01 ; Abstained 01 ; Absent 10.*

***පක්ෂව***
*சார்பாக*
*Ayes*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

**ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා**
(மாண்புமிகு ரெஜினோல்ட் குரே)
(The Hon. Reginold Cooray)

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார )
(The Hon. (Mrs.) Chandrani Bandara)

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்)
(The Hon. Janaka Bandara Tennakoon)

ගරු පලනි දිගම්බරම් මහතා
(மாண்புமிகு பழனி திகாம்பரம்)
(The Hon. Palani Digambaram)

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු දුමින්ද දිසානායක මහතා
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாத் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen )

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු ඒ.එච්-.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் )
(The Hon. Murugesu Chandrakumar)

ගරු එම්.ටී. හසන් අලි මහතා
(மாண்புமிகு எம்.ரீ. ஹஸன் அலி)
(The Hon. M.T. Hassan Ali)

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)

ගරු ජීවන් කුමාරණතුංග මහතා
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon. Jeewan Kumaranatunga)

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු රුවන් විජයවර්ධන මහතා
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana)

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු කරුපයියා වේලායුදම් මහතා
(மாண்புமிகு கருப்பையா வேலாயுதம்)
(The Hon. Karuppaiah Velayudam)

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluvihare)

ගරු දුනේෂ් ගන්කන්ද මහතා
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)

ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ගරු එම්.එස්. තවුෆික් මහතා
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thoufeek)

ගරු දයාශ්‍රිත තිසේරා මහතා
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்து புள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ගරු ඒ.ඩී. චම්පික ප්‍රේමදාස මහතා
(மாண்புமிகு ஏ.டி. சம்பிக பிரேமதாச)
(The Hon. A.D. Champika Premadasa)

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்சன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickramasinghe)

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු වසන්ත සේනානායක මහතා
(மாண்புமிகு வசந்த சேனாநாயக்க)
(The Hon. Vasantha Senanayake)

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු දිළුම් අමුණුගම මහතා
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)

ගරු පී. අරියනේත්‍රන් මහතා
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

ගරු ටිරාන් අලස් මහතා
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Allas)

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මහතා
(மாண்புமிகு சில்வேஸ்திரி அலன்றின்)
(The Hon. Silvestrie Alantin)

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මොහමඩ් අස්ලම් මහතා
(மாண்புமிகு மொஹமட் அஸ்லம்)
(The Hon. Mohamed Aslam)

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அன்டனி)
(The Hon.Victor Antony)

ගරු වී.කේ. ඉන්දික මහතා
(மாண்புமிகு வி.கே. இந்திக)
(The Hon.V.K. Indika)

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා
(மாண்புமிகு டபிள்யு.பி. ஏக்கநாயக்க)
(The Hon. W.B. Ekanayake)

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ගරු ඒ.ආර්.එම්.ඒ.කාදර් මහතා
(மாண்புமிகு ஏ.ஆர்.எம்.ஏ. காதர்)
(The Hon. A.R.M.A. Cader)

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

ගරු ජයන්ත කැටගොඩ මහතා
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி)ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு சனீ ரோஹன கொடிதுவக்கு)
(The Hon. Sanee Rohana Kodithuvakku)

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු සිරිපාල ගමලත් මහතා
(மாண்புமிகு சிறிபால கமலத்)
(The Hon. Siripala Gamalath)

ගරු සරත් කුමාර ගුණරත්න මහතා
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)

ගරු අර්ල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

ගරු හේමාල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஹேமால் குணசேகர)
(The Hon. Hemal Gunasekera)

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු සනත් ජයසූරිය මහතා
(மாண்புமிகு சனத் ஜயசூரிய)
(The Hon. Sanath Jayasuriya)

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)

ගරු බෂීර් සෙගු ඩාවුඩ් මහතා
(மாண்புமிகு பசீர் சேகு தாவூத்)
(The Hon. Basheer Segu Dawood)

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

ගරු පී. දයාරත්න මහතා
(மாண்புமிகு பீ. தயாரத்ன)
(The Hon. P. Dayaratna)

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ගරු මනූෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜி. பத்மசிறி)
(The Hon. Y.G. Padmasiri)

ගරු පී. පියසේන මහතා
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝමාල් පෙරේරා මහතා
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
(மாண்புமிகு லக்ஷமன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)

ගරු කන්දයියා ප්‍රේමචන්ද්‍රන් මහතා
(மாண்புமிகு கந்தையா பிரேமச்சந்திரன்)
(The Hon. Kandiah Premachandran)

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු ජයසිංහ බණ්ඩාර මහතා
(மாண்புமிகு ஜயசிங்க பண்டார)
(The Hon. Jayasinghe Bandara)

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு சீ.பீ.டி. பண்டாரநாயக்க)
(The Hon. C.P.D. Bandaranaike)

ගරු තාරානාත් බස්නායක මහතා
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க )
(The Hon. Tharanath Basnayaka)

ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ )
(The Hon. A.M. Chamika Buddhadasa)

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා
(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன்)
(The Hon. Vinayagamoorthi Muralidaran)

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

ගරු කමලා රණතුංග මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) கமலா ரணதுங்க)
(The Hon. (Ms.) Kamala Ranathunga)

ගරු රුවන් රණතුංග මහතා
(மாண்புமிகு ருவன் ரணதுங்க)
(The Hon. Ruwan Ranatunga)

ගරු රොෂාන් රණසිංහ මහතා
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)

ගරු පෙරුමාල් රාජදුරයි මහතා
(மாண்புமிகு பெருமாள் ராஜதுரை)
(The Hon. Perumal Rajathurai)

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය
(மாண்புமிகு(திருமதி) நிரூபமா ராஜபக்ஷ)
(The Hon. (Mrs.) Nirupama Rajapaksa)

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுற விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නිමල් විජේසිංහ මහතා
(மாண்புமிகு நிமல் விஜேசிங்க)
(The Hon. Nimal Wijesinghe)

ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera )

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

ගරු එස්. විනෝ මහතා
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා
(மாண்புமிகு ஆர். துமிந்த சில்வா)
(The Hon. R. Dumindha Silva)

ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

ගරු මුතු සිවලිංගම් මහතා
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

ගරු සී.ඒ. සූරියආරච්චි මහතා
(மாண்புமிகு சீ.ஏ. சூரியஆரச்சி)
(The Hon. C.A. Suriyaarachchi)

ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු පොන්. සෙල්වරාසා මහතා
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය
(மாண்புமிகு (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி)
(The. Hon. (Mrs.) Upeksha Swarnamali)

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

**ගරු එම්.බී. ෆාරුක් මහතා**
(மாண்புமிகு எம்.பி. பாறூக்)
(The Hon. M.B. Farook)

**ගරු හුනෙයිස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)

**ගරු මාලනී ෆොන්සේකා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs.) Malani Fonseka)

***විරුද්ධව***
*எதிராக*
*Noes*

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

***ඡන්දය නොදුන්***
*நடுநிலை*
*Abstained*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

***නොපැමිණි***
*வராதோர்*
*Absent*

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Prabha Ganesan)

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

**ගරු එච්.එල්. ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு எச்.எல். பிரேமலால் ஜயசேகர)
(The Hon. H.L. Premalal Jayasekara)

**ගරු ජානක බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஜானக பண்டார)
(The Hon. Janaka Bandara)

**ගරු (ආචාර්ය) ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜகத் பாலசூரிய)
(The Hon. (Dr.) Jagath Balasuriya)

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.) எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

**ගරු රත්නසිරි වික්‍රමනායක මහතා**
(மாண்புமிகு ரத்னசிறி விக்கிரமநாயக்க)
(The Hon. Ratnasiri Wickramanayaka)

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අගමැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, මේක ඉතිහාසගත වන අවස්ථාවක්. කැබිනට් මණ්ඩලයෙන් පාර්ලිමේන්තුවට වග කියන ජනාධිපති ධුරයත්, ස්වාධීන කොමිෂන් සභාත් ඇති කරලා අපි ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කර තිබෙනවා. එතැනදී අපි ඔක්කොම සාකච්ඡා කළාට ඒ බලාපොරොත්තු සියයට සියයක් ඉෂ්ට වුණේ නැහැ. කෙසේ හෝ අපි සම්මුතියකට පැමිණියා. විශේෂයෙන්ම මේ රජය සුළුතර රජයක්. ඒ නිසා මේ පිළිබඳව නායකත්වය දුන් ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටත් ඒ එක්කම - මේක කිව්වාට තරහ වෙන්න එපා- ගරු විපක්ෂ නායකතුමාටත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයටත්, ඊපීඩීපී සංවිධානයටත්, ද්‍රවිඩ ජාතික සන්ධානයටත්, ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු සියලු දෙනාටමත්, විශේෂයෙන්ම ගරු කථානායකතුමාටත්, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ඒ සමඟම මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා නීති උපදෙස් ලබා දුන් නීතිපතිතුමාටත්, එය සකස් කළ නීතිඥ ජයම්පති වික්‍රමරත්න මැතිතුමාටත්, සුරේන් ප්‍රනාන්දු මැතිතුමාටත්, මගේ ලේකම්තුමාටත්, අතිරේක ලේකම්තුමියටත්, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ සියලු දෙනාටත්, මේ සඳහා අදහස්

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ලබා දුන් මේ ගරු සභාවෙන් පිට සිටි සිවිල් සංවිධාන සියල්ලටමත්, ගරුතර මහා සංඝරත්නය ඇතුළු පූජක පක්ෂයටත්, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යයටත් මගේ ස්තුතිය පළ කරනවා. අප සියලු දෙනාම මේ ඓතිහාසික අවස්ථාවට දායක වුණු බව මා ප්‍රකාශ කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා කිව්වා වාගේම අද අපේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉතාම සුවිශේෂී දිනයක්. විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කිරීම පිළිබඳව දශක ගණනාවක් තිස්සේ ගෙන යන ලද කථිකාව අද එක්තරා ප්‍රමාණයකට සාර්ථක වෙලා තිබෙනවා. නමුත් අපි මෙයින් සෑහීමට පත් වන්නේ නැහැ. අපට අවශ්‍යයි හොඳ මැතිවරණ ක්‍රමයක්. ඒ නිසා මේ රටේ ජනතාව බලාපොරොත්තුවෙන් ඉන්නවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුමත කර ගත්තා සේම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ඉතා ඉක්මනින් අනුමත කර ගැනීමට. ඒ අභිලාෂයෙන් තමයි මේ රටේ ජනතාව ඉන්නේ. ඒ නිසා එක්සත් ජනතා නිදහස් සන්ධානය වශයෙන්; විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වශයෙන් අපි ආඩම්බර වෙනවා, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපේ පක්ෂයේ නායකත්වය භාර ගෙන එතුමා ජනාධිපතිවරයා වශයෙන් ඉතාම නිර්ලෝභී ලෙස කටයුතු කරමින්, තමන්ගේ බලතල පවරා දෙමින්, කිසිම ජනාධිපතිවරයකුට කරන්නට බැරි වුණු කාර්යයක් ඉටු කිරීමට දෙන ලද නායකත්වය පිළිබඳව. ඒ ගැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වශයෙන් අපි ඉතාමත්ම සතුටු වන බව ප්‍රකාශ කරන්න කැමැතියි.

මේ වැඩ කටයුත්ත ආරම්භයේ සිටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානය මෙයට විරුද්ධයි කියලා මේ රටේ සමහර ජනමාධ්‍ය, සමහර දේශපාලන පක්ෂ, බොහෝ ප්‍රචාර ගෙන ගියා. නමුත් අද දිනයේදී අප විසින් -අපේ සන්ධානයේ පක්ෂ නායකයින් ඇතුළු අප සියලු දෙනා විසින්- ඉතාම විවේචනාත්මක සහයෝගයක් ලබා දෙමින්, මේ ක්‍රමය නිවැරදි කිරීම සඳහා විශාල කාර්ය භාරයක් ඉටු කරමින් ඒ ජනතා ජයග්‍රහණය ලබා දීම සඳහා දායක වුණා. ඒ ගැන අපි ඉතාම සතුටු වෙනවා. මේ සඳහා සහයෝගය ලබා දුන් සියලු දෙනාටම එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් හා විපක්ෂය වෙනුවෙන් අපේ ස්තුතිය පුද කරනවා.

විශේෂයෙන්ම ගරු කථානායකතුමා ඇතුළු පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයටත්, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දුන් සියලු දෙනාටමත් අපේ ස්තුතිය පුද කරනවා. අප දුන් සහයෝගයට අනුව මේ ආකාරයෙන්ම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ඉතා ඉක්මනින් සම්මත කර ගැනීමේ ක්‍රියාදාමය ඔබතුමන්ලා ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ. භා. 7.00 පසු කර තිබුණෙන් කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, ප. ව.11.10ට අද දින සභා සම්මතිය අනුව, 2015 මැයි 19 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 7.00 மணிக்குப் பிந்திவிட்டமையால், சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி, பி.ப. 11.10 க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2015 மே 19, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 7.00 p.m.,* MR. SPEAKER *adjourned Parliament without Question put.*